# වාර්ෂික වාර්තාව 2013

# කා.සං.ම.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## දැක්ම

**" සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත සංවර්ධනය කිරීම"**

## මෙහෙවර

**"සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායික, තාක්ෂණික සහ වාණිජමය පදනම සපයාදීම"**

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය

*2013 ජනවාරි සිට 2013 අප්‍රේල් දක්වා*

**උදයසිරි කාරියවසම් මහතා -** සභාපති

**රොහන්ත එන්.ඒ. අතුකෝරල මහතා -** අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

**ආර්.ඒ. රම්‍යා කාන්ති මහත්මිය** - භාණ්ඩාගාර නියෝජිත

**එස්. වීරකෝන් මහත්මිය -** අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික / නිල බලයෙන්

**කේ.එන්. කුමාරි සෝමරත්න මහත්මිය -** අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික / නිල බලයෙන්

**ෂෙරීන් සේවිර් මහත්මිය -** අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික – කා.සං.ම.

**එම්.එම්. මොහොමඩ් ජමීල් මහතා -** අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - කා.සං.ම.

**ජී.සී. ද සිල්වා මහතා -** අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික / නිල බලයෙන්

**එස්. ආනන්දරාජා මහතා -** අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික – කා.සං.ම.

*2013 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා*

**නවාස් රජාබ්ඩීන් මහතා -** සභාපති

**ආර්.ඒ. රම්‍යා කාන්ති මහත්මිය** - භාණ්ඩාගාර නියෝජිත

**කේ.එන්. කුමාරි සෝමරත්න මහත්මිය -** අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික / නිල බලයෙන්

**එම්.එම්. මොහොමඩ් ජමීල් මහතා -** අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - කා.සං.ම.

**ජී.සී. ද සිල්වා මහතා -** අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික / නිල බලයෙන්

**එස්. ආනන්දරාජා මහතා -** අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික – කා.සං.ම.

**ඈපා දයාරත්න මහතා -** අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - කා.සං.ම.

**එච්.එම්.වී. ජයසිංහ මහතා -** අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - කා.සං.ම.

**ආචාර්ය සමන් කැලේගම මහතා -** අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - කා.සං.ම.

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
# 2013 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව

**ආයතනය**

**පසුබිම**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය 1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1966 වර්ෂයේ දී මුලින්ම ස්ථාපිත කරන ලදී. පසුව 1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය එහි වර්තමාන ස්වරූපයෙන් සංස්ථාගත කරන ලදී. කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ප්‍රධාන කාර්යාලය කොළඹ 07 ග්‍රෙගරි පාරේ අංක 16 යන ස්ථානයේ පිහිටුවන ලදී. වර්තමානයේ එය අංක 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව යන ලිපිනයෙහි පිහිටා ඇත. ශ්‍රී ලංකාවෙහි ඇති කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ප්‍රධාන අරමුණ වේ.

**මණ්ඩලයේ අරමුණු**

1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත මගින් නියම කර ඇති පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි අරමුණු පහත සඳහන් පරිදි වේ:

- ශ්‍රී ලංකාවෙහි ඇති කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා සහාය වීම;
- මෙරට ආර්ථිකයෙහි පෞද්ගලික සහ රාජ්‍ය අංශයන්ට අයත් සියලුම කාර්මික ව්‍යාපාරයන්හි නිසි සම්බන්ධීකරණය සහ එකිනෙකට සබැඳි වර්ධනය සඳහා සහායවීම;
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් උපයෝජනය කිරීම, කර්මාන්තවලදී භාවිතා කරනු ලබන තාක්ෂණික ක්‍රියාවලීන් සහ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සහ දේශීය කර්මාන්ත සඳහා යෝග්‍ය තාක්ෂණයන් සහ උපකරණ සංවර්ධනය කිරීම සහ නිෂ්පාදන අපද්‍රව්‍ය වඩා යහපත් ලෙස උපයෝජනය කිරීම සඳහා ක්‍රියාවලීන් සහ ක්‍රමවේදයන් සකස් කිරීම යන අරමුණු ඇතිව කර්මාන්ත පර්යේෂණ ධෛර්යමත් කිරීම.
- දේශීය කර්මාන්ත නිෂ්පාදන විදේශීය වෙළඳපොළට අපනයනය කිරීම දිරිමත් කිරීම

- කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය වන හෝ හිතකර වන පරිදි අන්තර්ජාතික වෙළඳාම සහ කලාපීය සහයෝගීතාවය වැනි ක්ෂේත්‍රවලදී ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා සහාය දීම.
- ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ, සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් සපයා දීම ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ඇති ඕනෑම කාර්මික ව්‍යාපාරයක් හෝ කාර්මික ආයතනකට හෝ ඒ අදාළව අවශ්‍ය කරන සෑම ආකාරයකම පහසුකම් සහ සේවා සැපයීම.
- ශ්‍රී ලංකාවේ ඇති කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමට සහ සංවර්ධනය කිරීමට අදාළ කරුණු සම්බන්ධයෙන් උපදෙස් සැපයීම; සහ
- මෙම කොටසේ නිශ්චිතව දක්වා ඇති අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය කරන හෝ හිතකර වන සියලුම ක්‍රියාමාර්ග ගැනීම.

## මණ්ඩලයට පැවරී ඇති කාර්යයන්

මණ්ඩලයට පැවරී ඇති කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

- මණ්ඩලයේ අරමුණු මගින් දක්වා ඇති පරිදි අවශ්‍ය සේවා සැපයීම
- රජයේ කාර්මික ප්‍රතිපත්ති සහ කාර්ය වැඩසටහන් සම්පාදනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සහායවීම.
- කර්මාන්ත පිහිටුවීමට, ප්‍රවර්ධනය කිරීමට සහ සංවර්ධනය කිරීමට අදාළ සියලුම කාර්යයන්හිදී කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාට අවශ්‍ය උපදෙස් ලබා දීම.

## මණ්ඩලය විසින් ඉටු කරනු ලබන ක්‍රියාකාරකම්

මණ්ඩලය වෙත පැවරී ඇති අභියෝගාත්මක කාර්ය සහ බැඳීම් පරාසය ඉටුකිරීමට භාරගැනීමේදී ක්‍රියාකාරීත්ව සහ මෙහෙයුම් ප්‍රවේශයන්ගේ විශේෂිත ක්ෂේත්‍රයන් පිළිබඳ කටයුතු කරන විවිධ අංශ සහ නියෝජිතායතන මණ්ඩලය විසින් පිහිටුවා තිබේ.

වර්ෂ 1969 සිට 1986 දක්වා කාර්මික සංවර්ධන මණ්ඩලය කර්මාන්ත සහ විද්‍යාත්මක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතට අනුබද්ධ කර තිබුණි. එයින් පසු 2005 වර්ෂය දක්වා අමාත්‍යාංශ ගණනාවක විෂය පථයන් යටතේ පැවතුණු කාර්මික සංවර්ධන මණ්ඩලය වර්තමානයේදී එය සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙයි.

## මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම

මණ්ඩලයේ සේවක සංඛ්‍යාව සහ එහි උසස්වීම් ක්‍රමය හා බඳවාගැනීමේ ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙහි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව මණ්ඩලය එහි ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

එහි ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයේ තිබූ අංශ සංඛ්‍යාව 12 සිට 9 දක්වා අඩු කර ඇති අතර සමහර අංශ ප්‍රධානීන්ගේ තනතුරු නාම වෙනස් කර ඇත.

සාමාන්‍යාධිකාරී තනතුර අධ්‍යක්ෂ ජනරාල් යන නාමයට වෙනස් කර ඇති අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම්) සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) යනුවෙන් නව තනතුරු දෙකක් ආයතන ව්‍යුහයට අලුතින් හඳුන්වා දී තිබේ. එමෙන්ම, මූල්‍ය කළමනාකාර සහ ප්‍රධාන ඉංජිනේරු යන තනතුරු පිළිවෙලින් අධ්‍යක්ෂ - මුදල් සහ අධ්‍යක්ෂ - ඉංජිනේරු වශයෙන් සංශෝධනය කර ඇත.

රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය සහ සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය යන අංශ දෙක තාක්ෂණ සේවා අංශය සමග ඒකාබද්ධ කරන ලදී. කාර්මික තාක්ෂණ සහ තොරතුරු සේවා මධ්‍යස්ථානය නැමති අංශය ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානයට ඒකාබද්ධ කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, කාර්මික තාක්ෂණ සහ තොරතුරු සේවා මධ්‍යස්ථානය කොටස් දෙකකට වෙන් කර රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය සහ සහ සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය යන ඒකක තාක්ෂණ සේවා අංශයේ උප ඒකක දෙකක් ලෙස ක්‍රියාත්මක වේ.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ අනුමත මුළු සේවක සංඛ්‍යාව 714 ක් වන අතර එම කාර්ය මණ්ඩලය මට්ටම් 11 යටතේ කාණ්ඩ කර ඇත.



# *අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය*

කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2013 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවට මණ්ඩලයේ ආයතනික ජයග්‍රහණ සහ වාර්ෂික ප්‍රගතිය පිළිබඳ විශේෂ සටහනක් එක් කිරීමට අවස්ථාව ලැබීම මා හට ඉමහත් සතුටක් ගෙන දෙයි. ආයතනික අරමුණු සහ අමාත්‍යාංශයේ සංවර්ධන සැලසුම්වලට අනුකූල වෙමින් කාර්මික සංවර්ධන මණ්ඩලය සමාලෝචිත වර්ෂය තුළදී පැහැදිලි, කර්මාන්ත විශේෂිත කරගත් සාධනීය ක්‍රියාමාර්ග ගෙන තිබේ.

2013 වර්ෂයේදී කාර්මික සංවර්ධන මණ්ඩලයේ ආයතනික මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට (IFRS) පරිවර්තනය කරමින් ආයතනික තීරණගැනීම පහසුකරවීම පිණිස මූල්‍ය ක්‍රියාකාරීත්වයන් නවකරණය කළ නිසා මෙම වර්ෂය මණ්ඩලයට විශේෂ වසරක් වේ. මෙම ක්‍රියාවලිය මගින් මූල්‍ය ක්‍රියාකාරීත්වයන් ප්‍රමිත කිරීමට සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය වැඩිදියුණු කිරීමට ප්‍රමුඛත්වය ලබා දී ඇත.

දේශීය කර්මාන්ත වැඩිදියුණු කිරීම දිරිගැන්වීමෙහි පුරෝගාමී ආයතනයක් වන කාර්මික සංවර්ධන මණ්ඩලය, වර්ධනය වෙමින් පවතින ආර්ථික ප්‍රවණතාවයට අනුකූල වෙමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය කිරීමට කටයුතු කිරීමේ අඛණ්ඩ ප්‍රයත්නයන්ට වැඩි ප්‍රමුඛත්වය ලබාදී තිබේ. ප්‍රතිසංධාන ක්‍රියාවලියට සමාගමීව, යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශවල ජනතාවට ගෘහස්ථ මට්ටමේ කර්මාන්ත නගාසිටුවීම සඳහා සහාය ලබාදීම ද ඇතුළත්ව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා වන සංවර්ධන ව්‍යාපෘති මෙම වැඩසටහනට අයත් වේ.

කාර්මික ජනපද නවීකරණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වන වැඩසටහන මෙම වර්ෂයේ ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර මෙම වැඩසටහන යටතේ කාර්මික ජනපදවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී, පල්ලෙකැලේ, ගලිගමුව, පුස්සැල්ල සහ පානලුව යන කාර්මික ජනපදවල සංවර්ධන කටයුතු කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී.

එමෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2013 වර්ෂයේ වාර්ෂික තිළින ප්‍රදානෝත්සවය ඉතා සාර්ථක ලෙස බණ්ඩාරණායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද අතර දිවයිනේ පළාත් 9 නියෝජනය කරමින් පැමිණි කර්මාන්තකරුවන් විශාල සංඛ්‍යාවක් තම නිෂ්පාදන ප්‍රදර්ශනය කළහ. කර්මාන්තකරුවන් 150 දෙනෙකු පමණ screened අදාළ අංශවල හොඳම ව්‍යවසායකයා ලෙස සම්මාන ලබා දෙන ලදී.

එක් එක් අංශවල කාර්යසාධනය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සිදු කරන ලද අතර ඒ අනුව පුහුණු වැඩසටහන්, තාක්ෂණය ලබාදීමේ වැඩසටහන්, උපදේශන සේවා සපයාදීම සහ වැඩමුළු පවත්වන ලදී.

අවසාන වශයෙන්, ගරු සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාටත්, එම නියෝජ්‍ය අමාත්‍යතුමාටත්, අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ එතුමාගේ කාර්යමණ්ඩලයටත් මෙම කාලපරිච්ඡේදය තුළ ලබාදුන් මගපෙන්වීම, සහයෝගය සහ දිරිමත්කිරීම වෙනුවෙන් මාගේ අවංක ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාව කර ගනිමි.

අනෙකුත් ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ ආයතන සමග එක්ව අපගේ ක්‍රමෝපායික සැලසුම්, නව ව්‍යාපෘති සහ වැඩසටහන් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදුන් අගනා සහයෝගය වෙනුවෙනුත් ඒ සඳහා දරන වටිනා ප්‍රයත්නය වෙනුවෙනුත් මණ්ඩලයේ සභාපතිතුමා සහ සාමාජිකයින්ටත්, එහි කළමනාකරණය ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ අවංක ස්තුතිය පුද කරමි.

**පී.එල්.යූ. රත්නමලල**
**වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්**

## ප්‍රධාන සේවාවන් සහ පහසුකම්



## ආයතනික ව්‍යුහය


සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය
අභ්‍යන්තර විගණක
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
අධ්‍යක්ෂ ජනරාල්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)
අධ්‍යක්ෂ - පරිපාලන
අධ්‍යක්ෂ - මුදල්
අධ්‍යක්ෂ - සැලසුම්
අධ්‍යක්ෂ - ප්‍රාදේශීය සංවර්ධන
අධ්‍යක්ෂ - කාර්මික ජනපද
අධ්‍යක්ෂ - ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS)
අධ්‍යක්ෂ - ඉංජිනේරු
අධ්‍යක්ෂ - තාක්ෂණික සේවා
අධ්‍යක්ෂ - අලෙවි

# පටුන

**1.0 කාර්යසාධන සමාලෝචනය** 11

**2.0 ප්‍රධාන ජයග්‍රහණ** 14
- ආංශික සංවර්ධන වාර්තා - සම්භාණ්ඩ සහ පාවහන් කර්මාන්තය 15
- මෘදුකාංග පිළියම් පිළිබඳ උසස් පුහුණුව 15
- 2013 ජාත්‍යන්තර පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනයෙහි සමසංවිධායක 15
- ශ්‍රී ලංකාව තුළ රසායනික ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික කාර්යසාධක බලකා සමාජික 16
- කිලිනොච්චි සහ මුලතිවු දිස්ත්‍රික්කවල ව්‍යාපාර සංවර්ධන පුහුණුව 16
- කාර්මික විද්‍යාපීඨය (IA) නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව 17

**3.0 ප්‍රගති සාරාංශය** 18
- කර්මාන්ත සහ ක්ෂුද්‍ර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම 19
- කාර්මික ජනපද පිහිටුවීම, නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම 20
- අලෙවිකරණ සහ විකුණුම් සහාය සහ පහසුකම් සැලසීම 20
- තාක්ෂණික, තාක්ෂණවේදී ඉංජිනේරු සහාය සහ පහසුකම් සැලසීම 21
- කර්මාන්ත සහ ක්ෂුද්‍ර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා ව්‍යාපෘති සහ උපදේශන සේවා 21

**4.0 කාර්යසාධන ජයග්‍රහණයන්** 23
- පාලන අංශය (AD) 24
- ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD) 28
- සැලසුම් අංශය (PD) 37
- අලෙවි අංශය (MD) 40
- කාර්මික ජනපද අංශය (IED) 45
- ඉංජිනේරු අංශය (ED) 52
- ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය (CEDACS) 54
- තාක්ෂණ සේවා අංශය (TSD) 59

**5.0 මූල්‍ය ප්‍රකාශන** **73 - 83**
- 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය
- ශේෂ පත්‍රය සඳහා සටහන්
- 2013 දෙසැම්බර් 31 දිනට දේපළ, යන්ත්‍රසූත්‍ර සහ පිරියත ක්ෂයවීම්
- සමුච්චිත හිභය
- වර්ෂ 2012 – 2013 කාලපරිච්ඡේදය සඳහා ආදායම් වියදම් ප්‍රකාශනය
- 2013 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය
- කාර්ය මණ්ඩල පිරිවැය
- වෙනත් මෙහෙයුම් වියදම්

**6.0 මණ්ඩලයේ අදහස්දැක්වීම අපේක්ෂා කරන විගණකාධිපති වාර්තාව** **84 - 106**

# කාර්යසාධන සමාලෝචනය

**කාර්යසාධන සමාලෝචනය**

2013 වර්ෂය තුළදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් එහි අදාළ අංශ හරහා පහත සඳහන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**වගුව - 1.1 - ඉටු කරන ලද ක්‍රියාකාරකම්**

| | ආයතනික අරමුණු ඉටුකරගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් | ඒකක ගණන | ආයෝජනය (රු.) | රැකියා සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අ | ස්වයංරැකියා ඒකක නිර්මාණය කර ක්‍රියාත්මක කිරීම | 1,472 | 53,588,002 | 1,472 |
| ආ | නව කර්මාන්ත / ක්ෂුද්‍ර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක අරම්භකිරීම පිණිස තාක්ෂණික සහ අදාළ අනෙකුත් සහාය ලබාදීම. | 382 | 215,448,958 | 1,432 |
| ඇ | පවතින කර්මාන්ත වැඩිදියුණු කිරීමට, පුළුල් කිරීමට සහ නවීකරණය කිරීමට තාක්ෂණික සහ අදාළ අනෙකුත් සහාය ලබාදීම | 671 | 225,438,757 | 1,615 |
| | **එකතුව** | **2,525** | **494,475,717** | **4,389** |

1.2 වගුවේ (අ), (ආ) සහ (ඇ) යන විෂය අංකවලට අදාළ සංවර්ධන ක්‍රියාකාරකම් ක්ෂේත්‍රයේ සාමාන්‍ය කාර්සාධනය 2012 වර්ෂයේ එම කාර්සාධනයට සාපේක්ෂව අඩුවීමක් පෙන්නුම් කරයි. ව්‍යාපාර සංවර්ධන සේවා සඳහා ප්‍රමාණවත් පරිදි මූල්‍ය සම්පත් වැය නොකිරීම නිසා සහ කර්මාන්ත හා අනෙකුත් ආර්ථික ඒකක සඳහා ප්‍රාග්ධන ආයෝජන සිදුකිරීම හේතුවෙන් 2013 වර්ෂයේදී සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ සිදු කරන ලද සමස්ත ආයෝජන ප්‍රමාණය 2012 වර්ෂයේදී සිදු කළ එම ආයෝජනවලට සාපේක්ෂව 21% ක අඩුවීමක් පෙන්නුම් කරයි.

වගුව - 1.2 – 2012 සහ 2013 වර්ෂවල සංසන්දනාත්මක තත්ත්වය

| විස්තරය | 2012 | 2013 | වර්ධනය (අඩුවීම) % |
|---|---|---|---|
| මුළු ඒකක ගණන (අ,ආ,ඇ) | **2,855** | **2,525** | **(11.56)** |
| මුළු ආයෝජනය (රු) | **624,832,701** | **494,475,717** | **(20.86)** |
| මුළු රැකියා ප්‍රමාණය | **4,555** | **4,389** | **(3.64)** |




**ප්‍රස්ථාරය 1.1 - කර්මාන්ත ඒකක සංඛ්‍යාව සහ ස්වයංරැකියා ඒකක, අලුතින් ආරම්භ කරන ලද කර්මාන්ත / සු.ම.ක. ඒකක සහ දැනට පවතින ව්‍යාපාර මගින් උත්පාදනය කර ඇති රැකියා සංඛ්‍යාව.**



# ප්‍රධාන ජයග්‍රහණ

- ආංශික සංවර්ධන වාර්තා - සම්භාණ්ඩ සහ පාවහන් කර්මාන්තය
- මෘදු දැව පිරියම් පිළිබඳ උසස් පුහුණුව
- ජාත්‍යන්තර පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශණය 2013 - සම සංවිධායක
- ශ්‍රී ලංකාව තුළ රසායනික ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික කාර්යසාධක බලකායේ සාමාජික
- කිලිනොච්චි සහ මුලතිවු දිස්ත්‍රික්කවල ව්‍යාපාර සංවර්ධන පුහුණුව
- නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ කාර්මික විද්‍යාපීය සහතිකපත්‍ර පාඨමාලාව

## ආංශික සංවර්ධන වාර්තා - සම්භාණ්ඩ සහ පාවහන් කර්මාන්තය

පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම් කාර්යාලයේ ව්‍යූහගත සහයෝගය ඇතිව ක්‍රියාත්මක වන "ශ්‍රී ලංකාවේ සම්භාණ්ඩ සහ පාවහන් කර්මාන්තයේ තරගකාරී බව වැඩි දියුණු කිරීම" නැමති ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති උපදේශකයින් විසින් මෙරට සම්භාණ්ඩ සහ පාවහන් කර්මාන්ත අංශ සංවර්ධනය කිරීම සඳහා තත්ත්ව විශ්ලේෂණ වාර්තා දෙකක් සහ අගය දාම විශ්ලේෂණ වාර්තා දෙකක් වශයෙන් ජාතික මට්ටමේ වාර්තා හතරක් සකස් කරන ලදී. මෙම වාර්තා ශ්‍රී ලංකා රජයට භාර දෙන ලදී.

## මෘදු දැව පදම්කිරීම පිළිබඳ උසස් පුහුණුව

- කාර්මික සංවර්ධන මණ්ඩලයේ තාක්ෂණ සේවා අංශය මණ්ඩලයේ මාතර කාර්යාලය හා එක්ව 2013 ඔක්තෝබර් මස 24 වැනි දින කර්මාන්තකරුවන් කණ්ඩායමක් සඳහා "මෘදු දැව පදම්කිරීම" පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වැඩමුළුවෙහිදී එයට සහභාගීවූ කර්මාන්තකරුවන්ට මෘදු දැව පදම්කිරීමේ ක්‍රියාවලිය, වියළීමේ ශිල්පීය ක්‍රම, පරීක්ෂණ කිරීමේ ක්‍රමවේද සහ තත්ත්ව පාලනය පිළිබඳ උසස් පුහුණුව ලබාදෙන ලදී. -
- පැලියගොඩ පිහිටි Tow - Mard සමාගම නරඹා මෘදු දැව පදම්කිරීම පිළිබඳ විශේෂඥ උපදෙස් ලබාගැනීම සිදු කර ගැනීම.
- කර්මාන්ත වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව තාක්ෂණික සේවා අංශය විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සඳහා උපකාරක සේවා සපයාදෙන ලදී. දැව පරීක්ෂා කිරීම සඳහා බෝරෝන් පිරියම් ද්‍රාවණය අලෙවි කිරීම මෙයට උදාහරණයකි. බෝරෝන් පිරියම් ද්‍රාවණය අලෙවි කිරීමෙන් උපයාගත් ආදායම රු.51,000.00 ක් වේ.

## ජාත්‍යන්තර පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශණය 2013 - සම සංවිධායක

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය (CDLPF) සම සංවිධායකයෙක් ලෙස ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ පාවහන් හා සම්භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සංගමය සමග එක්ව 2013 පෙබරවාරි මස 10 වැනි දින සිට 12 වැනි දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද අන්තර්ජාතික පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය - 2013 සංවිධානය කරන ලදී. මෙම ප්‍රදර්ශනයෙහිදී දේශීය සහ විදේශීය ව්‍යාපාරිකයින්ගේ සහභාගීත්වය ඇතිව වෙළඳ කුටි 200 ට අධික සංඛ්‍යාව ඉදිකරන ලදී.

2013 වර්ෂයේදී පවත්වන ලද මෙම ප්‍රදර්ශනයෙහිදී කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඍජු මැදිහත්වීම මත පහත සඳහන් අංග සංවිධානය කරන ලදී.

- සු.ම.ව්‍යා. මණ්ඩපය - සු.ම.ව්‍යා. වෙළඳ කුටි 32 ක් ද ඇතුළත්ව
- පාවහන් සහ සම්භාණ්ඩ නිර්මාණ තරගය
- වැඩමුළු
- අතින් නිමකරනු ලබන සපත්තු නිෂ්පාදනය කරන ආකාරය නිරූපණය කිරීම
- සංගීත ප්‍රසංගය සහ තරගය සහ ත්‍යාග ප්‍රදානය කිරීම

## ශ්‍රී ලංකාව තුළ රසායනික ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික කාර්යසාධක බලකායේ සාමාජික

ලෝක සෞඛ්‍ය සංවිධානයේ කඩිනම් ආරම්භය වැඩසටහන් භාරකාර අරමුදලෙහි (QSPTF) දේශීය කේන්ද්‍රීය ලේකම්කාර්යාලය (NFPS) ලෙස මධ්‍යම පරිසර අධිකාරිය විසින් ශ්‍රී ලංකාව තුළ රසායනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා ජාතික කාර්යසාධක බලකායක් පිහිටුවීම පිණිස මාර්තු මාසයේදී විශේෂ සංසදයක් සංවිධානය කරන ලදී.

කාර්මික සංවර්ධන මණ්ඩලය නියෝජනය කරමින් එහි තාක්ෂණික සේවා අංශය "කාර්මික නිෂ්පාදන අංශයෙහි රසායනික ද්‍රව්‍ය ක්‍රියාකාරී කණ්ඩායම" නම් වූ වැඩසටහනෙහි සාමාජිකයෙක් ලෙස මෙම සංසදයට සහභාගී වූ අතර එහිදී ශ්‍රී ලංකාව තුළ රසායනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීම පිළිබඳ ජාතික කාර්යසාධක බලකායේ කණ්ඩායම් නායකයින් අටදෙනා අතරින් එක් අයෙකු ලෙස පත් කරනු ලැබ ඇත. මෙම ජාතික කාර්යසාධක බලකාය ශ්‍රී ලංකාව තුළ "රසායනික ද්‍රව්‍ය සම්පූර්ණයෙන් කළමනාකරණය කිරීම" සඳහා ජාතික සැලසුම් සම්පාදනය කිරීමේ වගකීම දරයි.

## කිලිනොච්චි සහ මුලතිවු දිස්ත්‍රික්කවල ව්‍යාපාර සංවර්ධන පුහුණුව

කිලිනොච්චි සහ මුලතිවු දිස්ත්‍රික්කවල තිබෙන ගොවිපළ සතුන් බෝකරන්නන්ගේ සමුපකාර සමිති තුනක් සඳහා කිරි පිරිසැකසුම් මධ්‍යස්ථාන තුනක් ඉදිකිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස කාර්මික සංවර්ධන මණ්ඩලය 2013 ජූනි මස 11 වැනි දින සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය සමග ගිවිසුමක් අත්සන් කරන ලදී.

ඒ අනුව, එහි ව්‍යාපෘති සම්බන්ධීකාරක වශයෙන් තාක්ෂණික සේවා අංශය පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කිරීම පිණිස කිරි පිරිසැකසුම් කිරීමේ තාක්ෂණය සහ අලෙවිකරණය පිළිබඳව ප්‍රායෝගික පළපුරුද්ද සහිත සම්පත් පුද්ගලයින් / ආයතන බාහිරින් සේවා ලබාගැනීමේ පදනම යටතේ ලබාගැනීමට කටයුතු කරන ලදී:

- සතුන් බෝකරන්න්ගේ සමුපකාර සමිති තුන සඳහා ව්‍යාපාර සංවර්ධන සැලසුම්, පුහුණු විෂයමාලා, සැපයුම් දාම විශ්ලේෂණ වාර්තා, සන්නාම සංවර්ධන ක්‍රමෝපාය සහ ව්‍යාපාර කාර්යසාධන අධීක්ෂණ සහ ඇගයීම් උපකරණ සකස්කිරීම.
- "කිරි පිරි සැකසුම් තාක්ෂණය" සහ "ව්‍යාපාර කළමනාකරණය සහ අලෙවිකරණය" පිළිබඳ තාක්ෂණික දැනුම ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා සම්පත් පුද්ගලයින් / ආයතන තෝරාගැනීම.

## නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ කාර්මික විද්‍යාපීඨ සහතිකපත්‍ර පාඨමාලාව

තම කර්මාන්ත ක්ෂේත්‍රවලට අදාළව නිසි ගුණාත්මක අධ්‍යාපනයක් ලබා නොමැති ව්‍යවසායකයින් සඳහා ක්‍රමවත් පුහුණුවක් ලබාදීම පිණිස තාක්ෂණික සේවා අංශය විසින් 2012 වර්ෂයේදී කාර්මික විද්‍යාපීඨය ආරම්භ කරන ලදී. කාර්මික විද්‍යාපීඨය පෙබරවාරි මාසයේදී එහි දෙවැනි කණ්ඩායම බඳවා ගත් අතර පළමුවැනි කණ්ඩායමේ සහතිකපත්‍ර පාඨමාලාවේ නිෂ්පාදන තාක්ෂණ මොඩියුලය 2013 මාර්තු මාසයේදී සම්පූර්ණ කරන ලදී.

"පින්තාරු සහ ආලේපන තාක්ෂණය" පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව, "විලවුන් තාක්ෂණය" පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව සහ "කුළුබඩු පිරිසැකසුම් තාක්ෂණය" පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව මෙම විද්‍යාපීඨය මගින් පිරිනමනු ලබන පාඨමාලා අතර වේ. 2013 වර්ෂයේදී ඉහත සඳහන් තාක්ෂණයන් පිළිබඳව පුහුණු කරන ලද සමස්ත කර්මාන්තකරුවන් සංඛ්‍යාව 32 කි.

# ප්‍රගති සාරාංශය

- කර්මාන්ත සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිමත්කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම
- කාර්මික ජනපද පිහිටුවීම, නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම
- අලෙවිකරණ සහ විකුණුම් සහාය ලබාදීම සහ පහසුකම් සැලසීම
- කාර්මික, තාක්ෂණික සහ ඉංජිනේරු සහාය ලබාදීම සහ පහුසකම් සැලසීම
- කර්මාන්ත සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා ව්‍යාප්ති සහ උපදේශන සේවා සැපයීම

වගු අංක 3.1 – 2013 වර්ෂයේ ප්‍රගතිය පිළිබඳ සාරාංශය

| ප්‍රධාන තේමාව | වැඩසටහන / ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) | ඉලක්කය | සාධනය |
|---|---|---|---|---|
| කර්මාන්ත සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිමත්කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම | අනාගත ව්‍යවසායකයින් වීමේ හැකියාව ඇති අය හඳුනාගැනීම පිණිස දැනුවත් කිරීමේ වැඩසටහන් / ආයෝජන පුවර්ධන සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම. | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | 50 | 105 |
| | | සහභාගිවන්නන් සංඛ්‍යාව | 2,000 | 7,488 |
| | අනාගත ව්‍යවසායකයින් සහ පවතින කර්මාන්ත සඳහා තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් සහ තාක්ෂණ නිදර්ශන පැවැත්වීම. | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | 350 | 266 |
| | | සහභාගිවන්නන් සංඛ්‍යාව | 4,135 | 3,300 |
| | නව සහ දැනට පවතින කර්මාන්ත / කර්මාන්තරුවන් සඳහා ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | පවත්වන ලද ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | 130 | 78 |
| | | සහභාගිවන්නන් සංඛ්‍යාව | 3,300 | 2,756 |
| | තාක්ෂණික සහාය, උපදෙස් සහ උපදේශන සේවා සපයාදීම | සපයාදෙන ලද තාක්ෂණික සහාය, උපදෙස් සහ උපදේශණ සේවා සංඛ්‍යාව | 450 | 435 |
| | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 450 | 435 |
| | පහසුකම් සැලසීමේ සහ පසුවිපරම් ක්‍රියාකාරකම් | නිර්මාණය කරන ලද නව සු.ම.ක. සංඛ්‍යාව | 370 | 382 |
| | | සුළු පරිමාණ මට්ටමට වැඩිදියුණු කරන ලද ක්ෂුද්‍ර කර්මාන්ත සංඛ්‍යාව | 350 | 180 |
| | | මධ්‍ය පරිමාණ මට්ටමට වැඩිදියුණු කරන ලද සුළු පරිමාණ කර්මාන්ත සංඛ්‍යාව | 210 | - |
| | | මහා පරිමාණ මට්ටමට වැඩිදියුණු කරන ලද සුළු පරිමාණ කර්මාන්ත සංඛ්‍යාව | 140 | 1 |
| | | මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව | - | 2,370 |

| ප්‍රධාන තේමාව | වැඩසටහන / ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) | ඉලක්කය | සාධනය |
|---|---|---|---|---|
| කාර්මික ජනපද ස්ථාපනය, නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම | අච්චුවේලි කාර්මික ජනපදයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | සිදු කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම් වල ප්‍රතිශතය | 100 | 40 |
| | නව ව්‍යාපාර සඳහා සංවර්ධනය කරන ලද බිම් කැබලි වෙන්කරදීම සහ නැවත බෙදාදීම | වෙන් කරන ලද හිස් බිම් කොටස් / කර්මාන්ත ශාලා ඒකක / සංවර්ධනය කරන ලද බිම් කැබලි සංඛ්‍යාව | 20 | 10 |
| | | වෙන්කර දෙන ලද කර්මාන්තශාලා ඒකක / සංවර්ධනය කරන ලද බිම් කැබලිවල ආරම්භ කර ඇති වාණිජ මෙහෙයුම් සංඛ්‍යාව | 20 | 10 |
| | | උත්පාදනය කර ඇති රැකියා අවස්ථා සංඛ්‍යාව | 275 | 216 |
| | පසුවිපරම් ක්‍රියාකාරකම් සිදු කිරීම | ස්ථාපනය කර ඇති අගය එකතුකිරීමේ කර්මාන්ත සංඛ්‍යාව | 20 | 10 |
| | කාර්මික ජනපදවල මාර්ග ඉදිකිරීම, වීදි ආලෝකමත් කිරීම, ආරක්ෂාව වැඩිදියුණු කිරීම, අපද්‍රව්‍ය බැහැර කිරීම, ජල සම්පාදනය වැනි යටිතල පහසුකම් සංවර්ධන සහ අනෙකුත් ක්‍රියාකාරකම් | සිදු කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම් සංඛ්‍යාවේ ප්‍රතිශතය | 100 | 30 |

| ප්‍රධාන තේමාව | වැඩසටහන / ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) | ඉලක්කය | සාධනය |
|---|---|---|---|---|
| අලෙවිකරණ සහ විකුණුම් සහාය ලබාදීම සහ පහසුකම් සැලසීම | කාර්මික නිෂ්පාදන සඳහා ප්‍රාදේශීය ප්‍රදර්ශන සහ අලෙවි මධ්‍යස්ථාන පිහිටුවීම | අලෙවි පහසුකම් ලබාගත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංඛ්‍යාව | 800 | 1,071 |
| | | ප්‍රතිඵල ලෙස සු.ම.ක. විසින් සිදුකළ විකුණුම්වල වටිනාකම (රු.මි.) | 15 | 16.4 |
| | අලෙවි ප්‍රවර්ධන වෙළඳ ප්‍රදර්ශන / ගැණුම්කරුවන් සහ විකුණුම්කරුවන්ගේ හමු සංවිධානය කිරීම | අපනයන වෙළඳපොලට සම්බන්ධවී සිටයින සු.ම.ක. සංඛ්‍යාව | 30 | 16 |
| | | දේශීය සහ විදේශීය වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වන ව්‍යාපාර සංඛ්‍යාව | 40 | 32 |
| | උපකොන්ත්‍රාත් හුවමාරු යටතේ කර්මාන්ත ලියාපදිංචි කිරීම | සු.ම.ක. සඳහා නිර්මාණය කර ඇති උපකොන්ත්‍රාත් ලබාදීමේ සඳහා ආපසු මිලදී ගැනීමේ අවස්ථා සංඛ්‍යාව | 120 | 92 |
| | උප කොන්ත්‍රාත් පහසුකම් සපයාදීම | උප කොන්ත්‍රාත්දීම් හුවමාරුවෙන් දෙන ලද ඇණවුම්වල මුළු වටිනාකම (රු.මි.) | 4 | 6.2 |
| | ගැණුම්කරුවන්ට අවශ්‍ය කරන අමුද්‍රව්‍ය විශාල තොග වශයෙන් මිලදී ගෙන සිල්ලරට විකිණීම | අමුද්‍රව්‍ය (අබලි ලෝහ) ලබාගත් ව්‍යාපාර සංඛ්‍යාව | 1,300 | 811 |
| | | එකතු කරන ලද අබලි ද්‍රව්‍ය ප්‍රමාණය (මෙ.ටො.) | 1,700 | 713 |
| | | බෙදා දෙන ලද අබලි ද්‍රව්‍ය ප්‍රමාණය (මෙ.ටො.) | 1,600 | 757 |
| | කේන්ද්‍රඅපසාරික රබර් කිරි සහ සංයෝගකළ රබර් විකිණීම | පිරිසැකසුම් කරන ලද සහ සපයන ලද කේන්ද්‍රඅපසාරික රබර්කිරි (ලී) | 12,000 | 9,813 |
| | | සේවා සපයාදී ඇති ව්‍යාපාර සංඛ්‍යාව | 75 | 245 |
| | රබර් සංයෝග, අමුද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය විකිණීම | සපයන ලද ප්‍රමාණය (කි.ග්‍රෑ.) | 60,000 | 38,043 |
| | | සේවා සපයාදී ඇති ව්‍යාපාර සංඛ්‍යාව | 285 | 930 |

| | | | | |
|---|---|---|---|---|
| | රබර් සංයෝග ඇඹරීම සහ සැපයීම | සපයන ලද ප්‍රමාණය (කි.ග්‍රෑ.) | 36,000 | 17,341 |
| | | සේවා සපයාදී ඇති ව්‍යාපාර සංඛ්‍යාව | 50 | 68 |

| ප්‍රධාන තේමාව | වැඩසටහන / ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) | ඉලක්කය | සාධනය |
|---|---|---|---|---|
| කාර්මික, තාක්ෂණික සහ ඉංජිනේරු සහාය ලබාදීම සහ පහසුකම් සැලසීම | නව තාක්ෂණයන් ලබා ගැනීම | සකස් කරන ලද / වැඩිදියුණු කරන ලද ක්‍රියාවලීන් / සැලසුම් සංඛ්‍යාව | 11 | - |
| | නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ ලියාපදිංචිය සමග GMP, SLS තත්ත්ව සහතික ලබාගැනීමට සහායවීම. | GMP, SLS, ISO සහ අනෙකුත් සහතිකකිරීම්වලට / ප්‍රමිතීන්ට උසස්කරන ලද කර්මාන්ත සංඛ්‍යාව. | 50 | 119 |
| | සකස් කරන කරන ලද / පිරිසකසන ලද යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | අලුතින් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර / උපකරණ සංඛ්‍යාව | 6 | 1 |
| | | යන්ත්‍රසූත්‍ර / උපකරණවලින් ප්‍රතිලාභ ලැබූ ව්‍යාපාර සංඛ්‍යාව | - | 1 |
| | ඉංජිනේරු සේවා සපයාදීම: තක්සේරු, වාත්තු වැඩපොළ, කම්හල් සේවා, විද්‍යුත් ලෝහාලේපන සහ විද්‍යාගාර සේවා | සපයා දෙන ලද ඉංජිනේරු සේවා සංඛ්‍යාව | 1,100 | 972 |

| ප්‍රධාන තේමාව | වැඩසටහන / ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) | ඉලක්කය | සාධනය |
|---|---|---|---|---|
| කර්මාන්ත සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති සහ උපදේශන සේවා සැපයීම | ව්‍යාපෘති හඳුනාගැනීම, ආදර්ශ ව්‍යාපෘති වාර්තා සහ ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයන සකස් කිරීම | ශක්‍යතා අධ්‍යයන වාර්තා / ව්‍යාපෘති වාර්තා ලබාගත් ව්‍යාපාර සංඛ්‍යාව | 200 | 119 |
| | යන්ත්‍රසූත්‍ර තක්සේරු කිරීම | සකස් කරන ලද තක්සේරු වාර්තා සංඛ්‍යාව | 130 | 38 |
| | නිෂ්පාදන සංවර්ධන සහ පරීක්ෂණ සේවා සපයාදීම | සපයා දුන් නිෂ්පාදන සංවර්ධන සහ රසායනාගාර පරීක්ෂණ සේවා සංඛ්‍යාව | 140 | 82 |
| | ප්‍රදේශීය / දිස්ත්‍රික් කර්මාන්ත සංගම් පිහිටුවීම | දිස්ත්‍රික් සහ ජාතික මට්ටම්වලින් පිහිටුවන ලද / ශක්තිමත් කරන ලද කර්මාන්ත සංගම් සංඛ්‍යාව | 25 | 7 |




ප්‍රස්ථාරය 3.1 - කා.සං.ම. විසින් සපයාදෙන ලද සහ පහසුකම් සලසන ලද සේවා

# කාර්යසාධන ජයග්‍රහණ

- **පරිපාලන අංශය *(AD)***
- **ප්‍රාදේශීය සංවර්ධන අංශය *(RDD)***
- **සැලසුම් අංශය *(PD)***
- **අලෙවිකරණ අංශය *(MD)***
- **කාර්මික ජනපද අංශය *(IED)***
- **ඉංජිනේරු අංශය *(ED)***
- **ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය *(CEDACS)***
- **තාක්ෂණික සේවා අංශය *(TSD)***

## 4.1 පරිපාලන අංශය (AD)

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සියලුම මානව සම්පත් කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම්, ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්, සහ ආරක්ෂක සහ ප්‍රවාහන කටයුතු සකස්කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම මණ්ඩලයේ පරිපාලන අංශයේ වගකීම වේ.

**අංශය වෙත පැවරී ඇති කාර්යයන්**

- කළමනාකරණ චක්‍රලේඛ අංක 30 අනුව ආයතනික සහ ප්‍රතිව්‍යුහකරණ වැඩසටහන
- වැටුප් විෂමතා ඉවත් කිරීම
- කළමනාකරණ චක්‍රලේඛ අංක 30 අනුව බඳවාගැනීමේ පටිපාටිය (SOR) සහ උසස්කිරීම් පටිපාටිය (SOP) සකස් කිරීම
- සාමාන්‍ය බඳවාගැනීම්, කාර්යසාධන ඇගයීම්, උසස්කිරීම්, විශ්‍රාම ගැනීමට අදාළ ගැටළු ආදිය සම්බන්ධයෙන් කටයුතු කිරීම
- විනය පරීක්ෂණ සිදු කිරීම
- විදේශ ශිෂ්‍යත්ව / පුහුණු සම්බන්ධීකරණය කිරීම
- දේශීය පුහුණු සංවිධානය කිරීම සහ පැවැත්වීම
- සේවක සුභසාධනය සහ සේවක වන්දි කළමනාකරණය කිරීම
- අභ්‍යන්තර ආරක්ෂක සේවා කළමනාකරණය කිරීම
- මණ්ඩලයේ ප්‍රසම්පාදන කටයුතු කළමනාකරණය කිරීම
- මණ්ඩලයේ ප්‍රවාහන සේවා කළමනාකරණය කිරීම

**වගු අංක 4.1.1 - 2013 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල සංඛ්‍යාව**

| කාණ්ඩය | කාර්යමණ්ඩල සංඛ්‍යාව | | එකතුව සහ ප්‍රතිශතය |
|---|---|---|---|
| | **පිරිමි** | ගැහැණු | |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | 06 | - | 06 (1.29%) |
| **තෘතියික මට්ටම** | 68 | 25 | 93 (20.12%) |
| **ද්විතියික මට්ටම** | 117 | 84 | 201 (43.5%) |
| **ප්‍රාථමික මට්ටම** | 159 | 03 | 162 (35.06%) |
| එකතුව | **350 (75.75 %)** | **112 (24.25%)** | **462 (100.0%)** |




ප්‍රස්ථාරය **4.1.1** – කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්ය මණ්ඩල ශක්තිය

වගු අංක **4.1.2 - 2013** මූල්‍ය වර්ෂය තුළ අංශයේ ප්‍රධාන කාර්යසාධනයන්

| සංයුක්ත අරමුණ | | සංයුක්ත අරමුණ ඉටුකරගැනීම සඳහා සිදුකළ ක්‍රියාකාරකම් | සංඛ්‍යාව |
|---|---|---|---|
| **G 13** කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ආයතනික, පරිපාලන සහ මූල්‍ය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම | **11.** | **පහත සඳහන් සාමාන්‍ය මානව සම්පත් කළමනාකරණ ක්‍රියාකාරම් ඉටු කිරීම** | |
| | **1** | **මානව සම්පත් කළමනාකරණ - බඳවාගැනීම්** | |
| | (i) | *බඳවාගැනීම් (කාර්ය මණ්ඩල)* | 04 |
| | (ii) | *ඉල්ලා අස්වීම්* | 16 |
| | (iii) | *විශ්‍රාමයාම්* | 22 |
| | (iv) | *තනතුර අතහැර යාම්* | 05 |
| | **2** | **විනය කළමනාකරණය** | |
| | (i) | *විනය පරීක්ෂණ පැවැත්වීම* | 03 |
| | (ii) | *කම්කරු කොමසාරිස් මගින් කටයුතුකළ කම්කරු නඩු* | 32 |
| | **3** | **මානව සම්පත් සංවර්ධන - පුහුණු** | |
| | (i) | *දේශීය පුහුණු* | 24 |
| | (ii) | *විදේශීය පුහුණු* | 06 |
| | **4** | **මානව සම්පත් කළමනාකරණ - වන්දි** | |
| | (i) | *පුද්ගලයින් 62 දෙනෙකු සඳහා පාරිතෝෂික ගෙවීම් (2011 / 2012 ඇතුළත්ව)* | Rs. 8,186,693.00 |
| | **5** | **මානව සම්පත් කළමනාකරණ - සේවක සුභසාධන** | |
| | (i) | *බයිසිකල් ණය* | 27 |
| | (ii) | *ආපදා ණය* | 125 |
| | (iii) | *වෛද්‍ය ප්‍රතිකාර යෝජනාක්‍රමය (වෛද්‍ය ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූරණය කිරීම)* | 500 |
| | **6** | **ආරක්ෂක කළමනාකරණය** | |
| | (i) | *ආරක්ෂක පරිවැය* | Rs.21,479,111.80 |
| | **7** | **බැහැරකිරීම්** | |
| | (i) | *පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල* | 01 |
| | **8** | **සාමාන්‍ය සිදුවීම්** | |
| | (i) | *සිදුවීම්* | 04 |
| | **9** | **තැපැල් සහ විදුලි සංදේශ ගාස්තු** | |
| | (i) | *තැපැල් ගාස්තු* | Rs.390,000.00 |

| | | | |
|---|---|---|---|
| | (ii) | *විදුලි සංදේශ ගාස්තු* | Rs.3,147,024.00 |
| | **10** | **ප්‍රවාහන කළමනාකරණය** | |
| | (i) | *ඉන්ධන වියදම* | Rs. 4,398,227.06 |
| | (ii) | *වාහන නඩත්තු වියදම* | Rs. 3,604,555.44 |
| **G 13.12**<br>වෙබ්අඩවියේ කාර්යමණ්ඩල අංශය හරහා ප්‍රසිද්ධකර රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම | **11** | **ප්‍රසම්පාදන කළමනාකරණය** | |
| | (i) | *ඉදිරිපත් කරන ලද ඇණවුම් සංඛ්‍යාව* | 469 |
| | (ii) | *ප්‍රාග්ධන ප්‍රසම්පාදන* | Rs. 12,803,036.59 |
| | (iii) | *පුනරාවර්තන ප්‍රසම්පාදන* | Rs. 48,455,283.62 |

## 4.2 ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD)

### 4.2.1 සාමාන්‍ය

“කර්මාන්ත ගම්මාන සංවර්ධන” සහ “දිවිනැගුම” වශයෙන් වූ උප ඒකක දෙකකින් සමන්විත වන කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය සංවර්ධන අංශය මෙරට දිස්ත්‍රික්ක 25 ම ආවරණය කරන එහි ප්‍රාදේශීය ජාලය හරහා කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධන කිරීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරයි. 2013 වර්ෂය තුළදී ව්‍යවසායකත්ව සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී. වර්තමාන ව්‍යවසායකයින් සහ ඉදිරියේදී ව්‍යවසායකයින් වීමට සිටින පුද්ගලයින් සඳහා පවතින ව්‍යාපාර වැඩිදියුණු කිරීමටත්, නව ව්‍යාපාර ආරම්භ කිරීමටත් හැකිවන පරිදි කුසලතා සංවර්ධන සහ හැකියා සංවර්ධන වැනි පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

මේ සම්බන්ධ කාර්යයන් සහ එයට අදාළ ක්‍රියාකාරකම් ඉටුකිරීම පිණිස ප්‍රාදේශීය සංවර්ධන අධ්‍යක්ෂවරයාගේ මගපෙන්වීම මත ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීන් / ජ්‍යෙෂ්ඨ ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීන් 60 දෙනෙකු සහ සංවර්ධන නිලධාරීන් 03 දෙනෙකු දිස්ත්‍රික් කාර්යාලවලට සහ ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය සංවර්ධන අංශයට අනුයුක්ත කරන ලදී.

පුහුණු වැඩසටහන් / සම්මන්ත්‍රණ, ආයෝජන ප්‍රවර්ධන සම්මන්ත්‍රණ, ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් සහ හැකියා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම, වෙළඳපොළ සහාය / වෙළඳපොළ සම්බන්ධතා ලබාදීම, නිෂ්පාදන සහ ක්‍රියාවලි තාක්ෂණයන් ලබාදීම සහ නිරූපණ

| අංකය | දිස්ත්‍රික් කාර්යාලය |
|---|---|
| 1 | අම්පාර |
| 2 | අනුරාධපුර |
| 3 | බදුල්ල |
| 4 | මඩකලපුව |
| 5 | කොළඹ |
| 6 | ගාල්ල |
| 7 | ගම්පහ |
| 8 | හම්බන්තොට |
| 9 | යාපනය |
| 10 | කළුතර |
| 11 | මහනුවර |
| 12 | කෑගල්ල |
| 13 | කිලිනොච්චි |
| 14 | කුරුණෑගල |
| 15 | මන්නාරම |
| 16 | මාතලේ |
| 17 | මාතර |
| 18 | මොණරාගල |
| 19 | මුලතිවු |
| 20 | නුවර එළිය |
| 21 | පොළොන්නරුව |
| 22 | පුත්තලම |

| | | |
|---|---|---|
| වැඩසටහන් පැවැත්වීම, සක්‍යතා අධ්‍යයන සිදු කිරීම සහ සහන මිලට කාර්මික අමුද්‍රව්‍ය සපයාදීම දිස්ත්‍රික් කාර්යාලවලට පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වේ.<br><br>එයට අමතරව, නිෂ්පාදන ගම්මාන සංවර්ධන වැඩසටහන, ජාතික කිතුල් සංවර්ධන වැඩසටහන සහ "දිවිනැගුම" ජාතික වැඩසටහන "මහින්ද චින්තන" ඉදිරි දැක්ම වැඩසටහනට සමගාමීව 2010 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් අතර වේ. | 23 | රත්නපුර |
| | 24 | ත්‍රිකුණාමලය |
| | 25 | වවුනියාව |

වගු අංක 4.2.1.1 – අංශයේ දැනට සිටින සේවක සංඛ්‍යාව

| අංකය | දිස්ත්‍රික්කය | දැනට සිටින සේවක සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ | ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරී / ජ්‍යෙෂ්ඨ ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරී / සංවර්ධන නිලධාරී / ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරු |
| 1 | අම්පාර | 0 | 1 |
| 2 | අනුරාධපුරය | 1 | 2 |
| 3 | බදුල්ල | 1 | 1 |
| 4 | මඩකලපුව | 1 | 1 |
| 5 | කොළඹ | 1 | 3 |
| 6 | ගාල්ල | 0 | 2 |
| 7 | ගම්පහ | 1 | 3 |
| 8 | හම්බන්තොට | 1 | 5 |
| 9 | යාපනය | 1 | 2 |
| 10 | කළුතර | 1 | 5 |
| 11 | මහනුවර | 2 | 6 |
| 12 | කෑගල්ල | 2 | 4 |
| 13 | කිලිනොච්චිය | 1 | 0 |
| 14 | කුරුණෑගල | 2 | 4 |
| 15 | මන්නාරම | 1 | 1 |
| 16 | මාතලේ | 1 | 4 |
| 17 | මාතර | 1 | 5 |
| 18 | මොණරාගල | 1 | 1 |
| 19 | මුලතිවු | 1 | 1 |
| 20 | නුවර එළිය | 1 | 0 |
| 21 | පොළොන්නරුව | 1 | 0 |

| | | | |
|---|---|---|---|
| 22 | පුත්තලම | 2 | 4 |
| 23 | රත්නපුර | 1 | 3 |
| 24 | ත්‍රිකුණාමලය | 1 | 1 |
| 25 | වවුනියාව | 0 | 1 |
| ප්‍රාදේශීය සංවර්ධන අංශය - ප්‍රධාන කාර්යාලය | | 4 | 3 |
| එකතුව | | **30** | **63** |

ප්‍රාදේශීය සංවර්ධන අංශයේ 2013 වර්ෂයේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ:

වගු අංක 4.2.1.2 **-** ප්‍රාදේශීය සංවර්ධන අංශයේ ප්‍රගතිය

| ක්‍රියාකාරකම | ඒකක ගණන | ආයෝජනය (රු.) | රැකියා අවස්ථා ගණන | | |
|---|---|---|---|---|---|
| | | | පිරිමි | කාන්තා | එකතුව |
| **නව කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක ආරාම්භ කිරීම** | 368 | 215,448,958 | 546 | 756 | 1,302 |
| **පවතින කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා සහාය ලබාදීම** | 632 | 225,438,757 | 896 | 682 | 1,578 |
| **ස්වයං රැකියා කර්මාන්ත ඒකක ආරම්භ කිරීම** | 1,026 | 53,588,002 | 670 | 667 | 1,337 |
| **එකතුව** | **2,026** | **494,475,717** | **2,112** | **2,105** | **4,217** |

වගු අංක 4.2.1.3 – නව කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක ආරාම්භ කිරීමට සහාය ලබාදීම

| පළාත | දිස්ත්‍රික්කය | ඒකක ගණන | රැකියා අවස්ථා ගණන | මුළු ආයෝජනය (රු.) |
|---|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | 8 | 35 | 7,405,000 |
| | ගම්පහ | 16 | 64 | 13,680,000 |
| | කළුතර | 12 | 47 | 17,235,458 |
| **උප එකතුව** | | **36** | **146** | **38,320,458** |
| මධ්‍යම | මහනුවර | 41 | 118 | 8,463,000 |
| | නුවර එළිය | 8 | 25 | 748,000 |
| | මාතලේ | 18 | 179 | 48,090,000 |
| **උප එකතුව** | | **67** | **322** | **57,301,000** |
| උතුරු | යාපනය | 12 | 41 | 2,370,000 |
| | කිලිනොච්චිය | 5 | 10 | 144,000 |
| | මුලතිවු | 6 | 16 | 400,000 |
| | මන්නාරම | 3 | 4 | 200,000 |
| | වවුනියාව | 9 | 23 | 1,475,000 |
| **උප එකතුව** | | **35** | **94** | **4,589,000** |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | 6 | 17 | 1,390,000 |
| | අම්පාර | 5 | 17 | 1,615,000 |
| | මඩකලපුව | 21 | 63 | 1,938,000 |
| **උප එකතුව** | | **32** | **97** | **4,943,000** |
| දකුණු | ගාල්ල | 17 | 38 | 7,595,000 |
| | මාතර | 21 | 74 | 12,100,000 |
| | හම්බන්තොට | 12 | 42 | 3,337,000 |
| **උප එකතුව** | | **50** | **154** | **23,032,000** |
| සබරගමුව | රත්නපුර | 14 | 43 | 21,810,000 |
| | කෑගල්ල | 27 | 91 | 23,125,000 |
| **උප එකතුව** | | **41** | **134** | **44,935,000** |
| වයඹ | කුරුණෑගල | 33 | 95 | 5,579,000 |
| | පුත්තලම | 14 | 96 | 13,730,000 |
| **උප එකතුව** | | **47** | **191** | **19,309,000** |
| උතුරු මැද | අනුරාධපුරය | 14 | 43 | 8,503,000 |
| | පොළොන්නරුව | 8 | 17 | 1,920,000 |

| | | | | |
|---|---|---|---|---|
| උප එකතුව | | **22** | **60** | 10,423,000 |
| ඌව | බදුල්ල | 24 | 70 | 8,867,500 |
| | මොණරාගල | 14 | 34 | 3,729,000 |
| උප එකතුව | | **38** | **104** | 12,596,500 |
| එකතුව | | **368** | **1302** | **215,448,958** |

වගු අංක 4.2.1.4 – ස්වයං රැකියා කර්මාන්ත ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා සහාය ලබාදීම

| පළාත | දිස්ත්‍රික්කය | ඒකක ගණන | ඍජු හා වක්‍ර රැකියා සංඛ්‍යාව | මුළු ආයෝජනය (රු.) |
|---|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | 36 | 47 | 1,682,000 |
| | ගම්පහ | 33 | 42 | 1,232,500 |
| | කළුතර | 46 | 55 | 2,395,000 |
| උප එකතුව | | **115** | **144** | **5,309,500** |
| මධ්‍යම | මහනුවර | 90 | 133 | 5,545,500 |
| | නුවර එළිය | 18 | 38 | 1,014,500 |
| | මාතලේ | 48 | 59 | 3,842,000 |
| උප එකතුව | | **156** | **230** | **10,402,000** |
| උතුරු | යාපනය | 47 | 59 | 3,213,000 |
| | කිලිනොච්චිය | 9 | 9 | 201,500 |
| | මුලතිවු | 11 | 14 | 678,000 |
| | මන්නාරම | 11 | 11 | 263,000 |
| | වවුනියාව | 15 | 24 | 458,500 |
| උප එකතුව | | **93** | **117** | **4,814,000** |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | 37 | 58 | 2,621,001 |
| | අම්පාර | 34 | 34 | 1,006,000 |
| | මඩකලපුව | 36 | 40 | 1,381,500 |
| උප එකතුව | | **107** | **132** | **5,008,501** |
| දකුණු | ගාල්ල | 66 | 78 | 2,223,000 |
| | මාතර | 137 | 183 | 5,708,501 |

| | | | | |
|---|---|---|---|---|
| | හම්බන්තොට | 58 | 80 | 2,865,000 |
| **උප එකතුව** | | **261** | **341** | **10,796,501** |
| සබරගමුව | රත්නපුර | 27 | 30 | 1,639,500 |
| | කෑගල්ල | 67 | 82 | 5,113,000 |
| **උප එකතුව** | | **94** | **112** | **6,752,500** |
| වයඹ | කුරුණෑගල | 75 | 102 | 2,601,000 |
| | පුත්තලම | 21 | 29 | 2,208,000 |
| **උප එකතුව** | | **96** | **131** | **4,809,000** |
| උතුරු මැද | අනුරාධපුරය | 33 | 50 | 2,889,000 |
| | පොළොන්නරුව | 22 | 27 | 1,170,500 |
| **උප එකතුව** | | **55** | **77** | **4,059,500** |
| ඌව | බදුල්ල | 36 | 40 | 1,381,500 |
| | මොණරාගල | 13 | 13 | 255,000 |
| **උප එකතුව** | | **49** | **53** | **1,636,500** |
| **එකතුව** | | **1,026** | **1,337** | **53,588,002** |

## වගු අංක **4.2.1.5 – පවතින කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා සහාය ලබාදීම**

| පළාත | දිස්ත්‍රික්කය | ඒකක ගණන | වර්තමාන ආයෝජනය (රු.) | අමතර ආයෝජනය (රු.) | මුළු ආයෝජනය (රු.) | වර්තමාන රැකියා සංඛ්‍යාව | අමතර රැකියා සංඛ්‍යාව | මුළු රැකියා සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | 25 | 25,535,000 | 4,535,000 | 30,070,000 | 69 | 46 | 115 |
| | ගම්පහ | 28 | 40,375,000 | 4,515,000 | 44,890,000 | 185 | 91 | 276 |
| | කළුතර | 29 | 32,865,000 | 3,515,000 | 36,380,000 | 130 | 105 | 235 |
| **උප එකතුව** | | **82** | **98,775,000** | **12,565,000** | **111,340,000** | **384** | **242** | **626** |
| මධ්‍යම | මහනුවර | 56 | 39,723,000 | 24,061,000 | 63,784,000 | 331 | 143 | 474 |
| | නුවර එළිය | 16 | 8,767,000 | 945,000 | 9,712,000 | 109 | 23 | 132 |
| | මාතලේ | 31 | 40,966,519 | 11,695,000 | 52,661,519 | 129 | 44 | 173 |
| **උප එකතුව** | | **103** | **89,456,519** | **36,701,000** | **126,157,519** | **569** | **210** | **779** |
| උතුරු | යාපනය | 36 | 8,115,000 | 2,749,000 | 10,864,000 | 166 | 75 | 241 |
| | කිලිනොච්චිය | 5 | 197,000 | 163,000 | 360,000 | 42 | 45 | 87 |
| | මුලතිවු | 9 | 1,325,000 | 280,000 | 1,605,000 | 30 | 16 | 46 |
| | මන්නාරම | 1 | 60,000 | 20,000 | 80,000 | 14 | 4 | 18 |
| | වවුනියාව | 9 | 3,620,000 | 2,350,000 | 5,970,000 | 26 | 16 | 42 |
| **උප එකතුව** | | **60** | **13,317,000** | **5,562,000** | **18,879,000** | **278** | **156** | **434** |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | 32 | 19,299,500 | 6,315,000 | 25,614,500 | 224 | 87 | 306 |
| | අම්පාර | 7 | 2,317,500 | 601,400 | 2,918,900 | 24 | 8 | 32 |
| | මඩකලපුව | 27 | 8,762,000 | 5,540,000 | 14,302,000 | 216 | 74 | 290 |
| **උප එකතුව** | | **66** | **30,379,000** | **12,456,400** | **42,835,400** | **464** | **169** | **628** |
| දකුණු | ගාල්ල | 44 | 41,583,000 | 24,651,000 | 66,234,000 | 205 | 98 | 303 |
| | මාතර | 42 | 61,993,000 | 30,202,750 | 92,195,750 | 223 | 81 | 304 |
| | හම්බන්තොට | 38 | 14,515,000 | 5,425,004 | 19,940,004 | 221 | 67 | 288 |
| **උප එකතුව** | | **124** | **118,091,000** | **60,278,754** | **178,369,754** | **649** | **246** | **895** |
| සබරගමුව | රත්නපුර | 24 | 38,175,000 | 6,855,002 | 45,030,002 | 114 | 42 | 156 |
| | කෑගල්ල | 59 | 51,625,000 | 19,898,000 | 71,523,000 | 383 | 166 | 549 |
| **උප එකතුව** | | **83** | **89,800,000** | **26,753,002** | **116,553,002** | **497** | **208** | **705** |
| වයඹ | කුරුණෑගල | 31 | 11,320,000 | 20,220,000 | 31,540,000 | 201 | 156 | 357 |
| | පුත්තලම | 15 | 16,515,000 | 19,832,500 | 36,347,500 | 56 | 44 | 100 |
| **උප එකතුව** | | **46** | **27,835,000** | **40,052,500** | **67,887,500** | **257** | **200** | **457** |
| උතුරු මැද | අනුරාධපුරය | 18 | 9,305,000 | 3,400,000 | 12,705,000 | 67 | 24 | 91 |
| | පොළොන්නරුව | 12 | 6,925,004 | 2,340,101 | 9,265,105 | 48 | 40 | 88 |
| **උප එකතුව** | | **30** | **16,230,004** | **5,740,101** | **21,970,105** | **115** | **64** | **179** |
| ඌව | බදුල්ල | 31 | 103,340,000 | 22,825,000 | 126,165,000 | 113 | 66 | 179 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මොණරාගල | 7 | 1,805,000 | 2,505,000 | 4,310,000 | 87 | 17 | 104 |
| **උප එකතුව** | | **38** | **105,145,000** | **25,330,000** | **130,475,000** | **200** | **83** | **283** |
| **එකතුව** | | **632** | **589,028,523** | **225,438,757** | **814,467,280** | **3,413** | **1,578** | **4,986** |

### 4.2.2 කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන

මෙම වැඩසටහන "කර්මාන්ත ගම්මාන දහසක් සංවර්ධනය කිරීමේ වැඩසටහන" යන නමින් 2005 වර්ෂයේදී හඳුන්වා දෙන ලදී. පසුව එය නිෂ්පාදන ගම්මාන සංවර්ධන වැඩසටහන යනුවෙන් නැවත නම් කරන ලදී. මෙම නව්‍ය සහ අතිවිශාල වූ වැඩසටහන සඳහා 2005 වර්ෂයේදී රුපියල් මිලියන 400 ක මුදලක් වෙන් කරන ලදී. මෙම පස් අවුරුදු වැඩසටහන යටතේ වර්ෂයකට කර්මාන්ත ගම්මාන 200 බැගින් සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන ලදී. කම්මල්කරු, කොහු සහ මැටි වැනි සාම්ප්‍රදායික කර්මාන්ත කෙරෙහි වැඩි අවධානය යොමු කරන ලදී. ඉන්පසුව අතින් සාදන කඩදාසි, කැපූ මල් සහ කරවල වැනි සාම්ප්‍රදායික නොවන කර්මාන්ත ද මෙම වැඩසටහනට හඳුන්වා දෙන ලදී. නව යන්ත්‍රසූත්‍ර සහ නිෂ්පාදන ක්‍රියාවලින් හඳුන්වාදීම, නව ශිල්පීයක්‍රම හඳුන්වාදෙමින් ප්‍රතිලාභීන්ගේ හැකියා වැඩිදියුණු කිරීම සහ අලෙවිකරණ පහසුකම් සපයාදීම ආදිය මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු කිහිපයක් වේ. කෙසේ වෙතත්, මෙම වැඩසටහන සම්පූර්ණ කිරීමට පෙර 2009 වර්ෂයේදී එහි වැඩසටහන් කාලය අවසන් විය. 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සමස්ත අරමුදල් වෙන් කිරීම රුපියල් මිලියන 723.03 ක් වූ අතර තථ්‍ය වියදම රුපියල් මිලියන 562.44 ක් විය.

කර්මාන්ත ගම්මාන සමහරක් යළි ක්‍රියාත්මක කිරීම සඳහා පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම මෙම වැඩසටහනට ඇතුළත් කිරීම සඳහා සහ රු. 155,793/- ක වියදමින් පොදු සේවා මධ්‍යස්ථාන තුනක් නැවත සකස්කිරීම සඳහා 2013 වර්ෂයේදී අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

### 4.2.3 කිතුල් නිෂ්පාදන සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන

කිතුල් ගසෙහි ඇති විවිධ වූ ප්‍රයෝජන නිසා එය ඉතා වටිනා ගසක් වන අතර කිතුල් මල එහි වටිනාම කොටස ලෙස සළකනු ලැබේ. කිතුල් රා, පැණි සහ හකුරු සෑදීමට යොදාගන්නා සාරය ලබා ගැනීම පිණිස කිතුල් මල මැදීම සිදු කරනු ලැබේ. එහෙත් කිතුල් මල් මැදීමෙහි ඇති වාණිජමය වටිනාකම පිළිබඳ ප්‍රජාව සතු නොදැනුවත්භාවය නිසා කිතුල් ගස් බොහොමයක මල් මැදීම සිදු නොකරන බව නිරීක්ෂණය වී තිබේ. එම නිසා සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් කිතුල් කර්මාන්තය දියුණු කිරීම සඳහා විශේෂ වැඩසටහනක් ආරම්භ කරන ලදී.

කිතුල් නිෂ්පාදකයින්ගේ සමාජ ආර්ථික තත්ත්වය නගා සිටුවීම මගින් කිතුල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ. මදිනු ලබන කිතුල් ගස් සංඛ්‍යාව වැඩි කිරීම, ප්‍රතිලාභීන්ගේ ආදායම් මට්ටම වැඩිදියුණු කිරීම, තාක්ෂණය නව්‍යකරණය කිරීම සහ නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම හරහා උසස් තත්ත්වයේ කිතුල් නිෂ්පාදන හඳුන්වාදීම සහ කිතුල් නිෂ්පාදන සඳහා දේශීය මෙන්ම

විදේශීය වෙළඳපොළ වැඩිදියුණු කිරීම මෙම වැඩසටහනෙහි අනෙකුත් විශේෂිත අරමුණු අතර වේ. 2013 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසාන වන විට, අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් පහත සඳහන් සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කර තිබූ අතර එමගින් ලබාගත් ජයග්‍රහණ වගු අංක 4.2.3.1 හි දක්වා ඇත.

වගු අංක **4.2.3.1 - කිතුල් නිෂ්පාදන සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහනෙහි කාර්යසාධනය**

| සංයුක්ත අරමුණ | සංයුක්ත අරමුණ ඉටුකරගැනීම සඳහා සිදුකළ ක්‍රියාකාරකම් | | වැඩසටහන් සංඛ්‍යාව | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| **G1a.** කර්මාන්ත දිරිමත්කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම | (i) | නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | 17 | 129,649 |
| | (ii) | මල් මැදීමේ තාක්ෂණ පුහුණු වැඩසටහන | 57 | 697,274 |
| | (iii) | මල් මැදීමේ තාක්ෂණ පසුවිපරම් වැඩසටහන | 51 | 321,747 |
| | (iv) | නිෂ්පාදන තත්ත්ව සංවර්ධන වැඩසටහන | 36 | 480,333 |
| | (v) | ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 21 | 478,776 |
| | (vi) | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | 04 | 82,689 |
| | (vii) | උසස් තාක්ෂණය ලබාදීමේ වැඩසටහන | 04 | 75,679 |
| | (viii) | පසු විපරම් වැඩසටහන | 28 | 131,433 |
| | (ix) | අලුතින් මදිනුලබන ගස් සංඛ්‍යාව වැඩිකිරීම | 7,683 | 350 |
| | (x) | පුහුණු කරුවන් පුහුණු කිරීම | 78 | 110,323 |
| | (xi) | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය කිරීම | 31 | 2,000 |
| | (xii) | නව සුළු කර්මාන්ත ආරම්භ කිරීම | 77 | 7,000 |
| | (xiii) | කර්මාන්ත GMP තත්ත්වයට වැඩිදියුණු කිරීම | 2 | 2,900 |
| | (xiv) | මදින්නන් ලියාපදිංචි කිරීම | 636 | - |
| | (xv) | මදින්නන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම | 242 | 1,000 |
| | (xvi) | මදින්නන් සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල බෙදාදීම | 1,331 | 3,636,918 |
| | (xvii) | මදින්නන්ගේ සංවිධාන පිහිටුවීම | 5 | - |
| | (xviii) | ප්‍රදේශ 67 ක අලුතින් කිතුල් පැල රෝපණය කිරීම | 1,590 | - |
| | (xix) | "කිතුල් වරුණ" ප්‍රදර්ශණය පැවැත්වීම | 4 | 696,480 |
| | (xx) | ප්‍රාදේශීය මට්ටමේ ප්‍රදර්ශණවලට සහභාගීවීම | 6 | 1,000 |
| **එකතුව** | | | | **7,459,921** |

### 4.2.4 "දිවිනැගුම" ජාතික වැඩසටහන

සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ සහාය ඇතිව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් "දිවි නැගුම" ජාතික වැඩසටහන හඳුන්වා දෙන ලදී. තිරසර ගෘහ පාදක කර්මාන්ත ආර්ථික ඒකක ප්‍රවර්ධනය කිරීම සහ ස්ථාපිත කිරීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය එහි ප්‍රතිලාභීන්ට පහසුකම් සැලසීම සහ අවශ්‍ය සේවා සපයාදීම සිදු කරන ලදී.

මෙම වැඩසටහන යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය ගෘහ පාදක කර්මාන්ත ආර්ථික ඒකක ආරම්භකිරීමේ හැකියාව සහිත නව ව්‍යවසායකයින් 69 දෙනෙකු හඳුනාගන්නා ලදී; තාක්ෂණ පුහුණු වැඩසටහන් 13 ක් පවත්වා ව්‍යවසායකයින් 382 දෙනෙකු පුහුණු කරන ලදී. එයට අමතරව. දැනට සිටින කර්මාන්තකරුවන් 491 දෙනෙකු සඳහා කළමනාකරණ සංවර්ධන වැඩසටහන් 07 ක් පවත්වා ව්‍යවසායකයින් 821 දෙනෙකු සඳහා මුළු වටිනාකම රු. 4,683,778/- ක් වූ යන්ත්‍රසූත්‍ර, මෙවලම් සහ උපකරණ බෙදාදෙන ලදී. සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී, දිවයින පුරා ගෘහ පාදක කර්මාන්ත ආර්ථික ඒකක 516 ක් ආරම්භ කිරීම සඳහා පහසුකම් සැලසීමට කාර්මික සංවර්ධන මණ්ඩලයට හැකිවිය.

## 4.3 සැලසුම් අංශය

**පොදු**

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සිදුකෙරෙමින් පවතින ප්‍රතිව්‍යුහකරණ ක්‍රියාවලිය යටතේ ඉදිරි වර්ෂ තුනක කාලපරිච්ඡේදය සඳහා නව සංයුක්ත ක්‍රමෝපායික සැලැස්ම සකස්කිරීමේ අභියෝගාත්මක කාර්යය සැලසුම් අංශයට පැවරී තිබේ.

**සැලසුම් අංශයට පැවරී ඇති කාර්යයන්**

එක් එක් අංශයට අදාළ සංවර්ධන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම සැලසුම් අංශයට පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වේ. එයට අමතරව, සෑම වර්ෂයකම ආරම්භයේදී නියම කරගනු ලබන භෞතික සහ මූල්‍ය ඉලක්කවලට අදාළව කාර්මික සංවර්ධන මණ්ඩලය සඳහා සංයුක්ත ක්‍රමෝපායික සැලැස්ම සකස්කිරීම මෙන්ම එක් එක් අංශවල වාර්ෂික ක්‍රමෝපායික ක්‍රියාත්මක සැලසුම් අධීක්ෂණය කිරීම සහ ඇගයීම ද සැලසුම් අංශයේ වගකීම වේ. තවද, මෙම අංශය විසින් රේඛීය අමාත්‍යාංශයට සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයෙහි කාර්යසාධන ඇගයීම සඳහා

කාර්යාධන ඇගයීම් තක්සේරුකරුවන්ට මෙන්ම අධ්‍යක්ෂ - පරිපාලන වෙත ද එවැනි කළමනාකරණ තොරතුරු සපයා දෙනු ලබයි.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ අනෙකුත් අංශවල කාර්යයන්ට පහසුකම් සැලසීම පිණිස පහත සඳහන් උපක්‍රියාකාරකම් ද මෙම අංශයට පවරා තිබේ:

- කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි සහ 1969 අංක 36 දරණ කර්මාන්ත සංවර්ධන පනතෙහි අනිවාර්ය අරමුණුවලට අනුකූලව ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය මාර්ගෝපදේශ සම්පාදනය කිරීම.
- ආයතනික අයවැය සහ සමස්ත ක්‍රියාත්මක සැලැස්මට අනුකූලව ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් අවශ්‍යතා සකස්කිරීමට පහසුකම් සැලසීම.
- ව්‍යාපාර / කර්මාන්ත සමීක්ෂණ පැවැත්වීමට පහසුකම් සැලසීම, කර්මාන්ත / ආර්ථිකය ආශ්‍රිත සංඛ්‍යාලේඛන යාවත්කාලීන කිරීම සහ ආදාළ ආංශික සංවර්ධන සැලසුම් සහ වාර්තා සකස් කරීමට සහායවීම.
- විදේශ අරමුදල් සැපයීම් සඳහා සංවර්ධන ව්‍යාපෘති යෝජනා සහ සංකල්ප පත්‍රිකා සකස් කිරීම.
- දැනට පවතින, කර්මාන්ත ආශ්‍රිත ප්‍රතිපත්ති සම්පාදන කමිටුවලට කාර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ සහභාගීත්වය සහතික කිරීම සහ අවශ්‍ය විට සහ අවශ්‍ය පරිදි ප්‍රතිපත්ති පත්‍රිකා සකස් කිරීම.

වගු අංක **4.3.1 -** අංශයේ කාර්යසාධනය

| සංයුක්ත අරමුණ | සංයුක්ත අරමුණ ඉටුකරගැනීම සඳහා සිදුකළ ක්‍රියාකාරකම් | | මිනුම් දර්ශකය | සාධනය |
|---|---|---|---|---|
| **G1a**<br>කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම | **19** | කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයාගේ ඉල්ලීම අනුව දිස්ත්‍රික් කාර්යාල සහ අනෙකුත් අදාළ අංශ සමග එක්ව ව්‍යාපාර පැතිකඩ සකස් කිරීමට පහසුකම් සැලසීම | | |
| | (i) | ව්‍යාපාර පැතිකඩ සකස් කිරීම | පැතිකඩ සංඛ්‍යාව | **20** |
| **G1b**<br>ව්‍යවසායකයින් පුහුණුකිරීම, සංවර්ධනය කිරීම සහ උපදේශණය සැපයීම | **7** | අලෙවිකරණය, තාක්ෂණය, මූල්‍ය යෙදවීම, කළමනාකරණය සහ නිෂ්පාදනය ආදිය පිළිබඳව ව්‍යවසායකයින් වෙත උපදේශණය සහ උපදෙස් සපයාදීම | | |
| | (i) | නව කර්මාන්ත ආරම්භ කිරීමට, පවතින කර්මාන්ත පුළුල් කිරීමට සහ පවතින කර්මාන්ත නවීකරණය කිරීමට කර්මාන්ත ප්‍රතිපත්තිය, යන්ත්‍රසූත්‍ර ආනයනය කිරීම, ණය පහසුකම් සහ රජය සහ විවිධ රාජ්‍ය සංවිධාන මගින් සපයාදෙනු ලබන අනෙකුත් දිරිගැන්වීම් සහ පහසුකම් පිළිබඳව මෙම අංශය මගින් | කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 15 |

| | | | | |
|---|---|---|---|---|
| | | තොරතුරු සපයා දී ඇත. | | |
| **G2**<br><br>කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීමට අදාළ කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම | **4** | ලෝහ අබලි ව්‍යාපෘතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති පත්‍රිකාවක් සම්පාදනය කර වැඩිදුර සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා එය සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. | | |
| | (i) | ලෝහ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපත්ති පත්‍රිකාව | ප්‍රතිපත්ති පත්‍රිකා සංඛ්‍යාව | 01 |
| **G13**<br><br>කාර්මික සංවර්ධන මණ්ඩලයේ ආයතනික, පරිපාලන සහ මූල්‍ය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම | **27** | මාසික සහ කාර්තුමය ආංශික කාර්යසාධන වාර්තා සකස් කිරීම සහ සහතික කිරීම. | වාර්තා සංඛ්‍යාව | 16 |
| | **29** | කාර්තුමය වශයෙන් කා.ස.ම. ප්‍රාග්ධන අයවැය ප්‍රගති වාර්තා සකස් කිරීම. | වාර්තා සංඛ්‍යාව | 04 |
| | **30** | කා.ස.ම. අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වාර්ෂික වාර්තාව සකස් කිරීම. | වාර්තා සංඛ්‍යාව | 01 |

**අංශය විසින් ඉටුකරන ලද අනෙකුත් කාර්යයන්**

I. පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම්කාර්යාලයේ සහාය ඇතිව, ශ්‍රී ලංකාවේ සම්භාණ්ඩ සහ පාවහන් කර්මාන්තයේ තරගකාරීත්වය වැඩිදියුණු කිරීම සඳහා වන දෙවැනි පාර්ශවකාර වැඩමුළුව 2013.02.19 වැනි දින කොළඹ කිංග්ස්බරි හෝටලයේදී පවත්වන ලදී.

II. ශ්‍රී ලංකාවේ සම්භාණ්ඩ සහ පාවහන් කර්මාන්තයේ තරගකාරීත්වය වැඩිදියුණු කිරීම සඳහා වන යෝජිත ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය රාමුව පිළිබඳ දැනුවත් කිරීම සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම්කාර්යායේ සහාය ඇතිව 2013.04.02 වැනි දින කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදී ප්‍රචාරක වැඩසටහනක් සහ මාධ්‍ය හමුවක් පවත්වන ලදී.

III. GIZ ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පිළිබඳ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ඇගයීම සිදුකර එම ඇගයීම් වාර්තාව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

**IV.** මෙම අංශය විසින් පහත සඳහන් රජයේ ආයතන වෙත සංඛ්‍යාලේඛනමය දත්ත සපයා දී ඇත:

- වාර්ෂික වාර්තාව සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත
- ජාතික ගිණුම් ඇස්තමේන්තු සඳහා ජනසංඛ්‍යා හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත

V. MA 5-2, MA 2-1 (තාක්ෂණික), සහ MA 1-2 (තාක්ෂණික නොවන) කාණ්ඩ යටතේ කාර්ය මණ්ඩල සාමාජිකයින් අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා පත්කරන ලද ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස සහභාගීවීම සහ අදාළ වාර්තාව කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත භාරදීම.

VI. කාර්මික සංවර්ධන මණ්ඩලයේ පරිපාලන අංශයේ ඉල්ලීම පරිදි මණ්ඩලයේ අනුමත නව සේවක සංඛ්‍යාව යටතේ මිනිස්බලය බෙදාහැරීමේ සැලැස්ම සකස්කිරීමට සහායවීම.

VII. නව කළමණාකාරීත්වයේ ඉල්ලීම පරිදි ඔවුන්ගේ දැනගැනීම පිණිස කාර්මික සංවර්ධන මණ්ඩලයේ තත්ත්ව විශ්ලේෂණ වාර්තාව සකස්කිරීම.

VIII. කාර්මික සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රතිව්‍යුහකරණ ක්‍රියාවලියට අනුකූල වන පරිදි ප්‍රතිව්‍යුහකරණ සැලැස්ම සකස්කිරීම.

IX. මෙරට සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම පිණිස ශ්‍රී ලංකාවේ ප්‍රධානතම කර්මාන්ත අංශවලින් එකක් ලෙස කොහු කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා සංවර්ධන යෝජනාවලියක් සකස්කිරීම.

## 4.4 අලෙවි අංශය

දිවයින පුරා සිටින ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් / කර්මාන්තකරුවන් මෙන්ම ස්වයංරැකියාවල නියුතුවූවන් විසින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ අලෙවිකිරීමට අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කටයුතු කරන අලෙවි අංශය කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රබල බලවේගයක් වේ. කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රතිව්‍යුහකරණ ක්‍රියාවලිය යටතේ මුද්‍රණ සහ ප්‍රකාශන ඒකකය ද අලෙවි අංශයට අනුයුක්ත කර තිබේ.

**මෙම අංශයට පැවරී ඇති කාර්යයන්**

- කාර්මික ප්‍රදර්ශන සංවිධානය කිරීම සහ පැවැත්වීම / ජාතික ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගීවීම.
- දිවයින පුරා සිටින, තෝරාගත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් / කර්මාන්තකරුවන් මෙන්ම ස්වයංරැකියාවල නියතු පුද්ගලයින් සඳහා ද ජාතික තිළිණ ප්‍රදානෝත්සවය සංවිධානයකිරීම
- 'ලක්කම්' සහ 'ලක්නිපැයුම්' අලෙවි මධ්‍යස්ථානවල අලෙවි පහසුකම් සැපයීම
- උපකොන්ත්‍රාත් හුවමාරු සඳහා පහසුකම් සැලසීම

- වාත්තුවැඩ, ලුහු ඉංජිනේරු, කම්මල් වැඩ සහ අනෙකුත් ලෝහ වාත්තු සහ ශිල්පීය කර්මාන්තවල නියැළී සිටින කර්මාන්තකරුවන්ට සහනදායී මිල ගණන් යටතේ අමුද්‍රව්‍ය / අබලි ද්‍රව්‍ය සපයාදීම
- කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශණ සේවා සැපයීම

**මෙම අංශය විසින් සපයනු ලබන වෙනත් සේවාවන් සහ සේවා ඒකක**

**'ලක්නිපැයුම්' සහ 'ලක්කම්' අලෙවි මධ්‍යස්ථාන -** දිවයිනපුරා සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ සහ ස්වයංරැකියාවල නියුතුවූවන්ගේ නිෂ්පාදන ඵලදායීතාවය නගාසිටුවීමේ සහ අලෙවිය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව 'ලක්නිපැයුම්' සහ 'ලක්කම්' අලෙවි මධ්‍යස්ථාන මගින් ප්‍රදර්ශන සහ අලෙවි පහසුකම් සපයා දෙනු ලබයි.

**උපකොන්ත්‍රාත් හුවමාරුව (SCX)**

ලෝක බැංකු අරමුදල් යටතේ පිහිටුවන ලද අලෙවි අංශය යටතේ ඇති උපකොන්ත්‍රාත් හුවමාරුව 1982 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. එය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ සැපයීමට සම්බන්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

**අමුද්‍රව්‍ය බංකුව -** අමුද්‍රව්‍ය බැංකුව පැලියගොඩ පිහිටි රබර් නිෂ්පාදන සංවර්ධන මධ්‍යස්ථානය (RPDSC) සමග ඒකාබද්ධවී සාධාරණ මිල ගණන් යටතේ දේශීය රබර් කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සපයා දෙයි.

**ලෝහ අබලි ව්‍යාපෘතිය -** අලෙවි අංශය මගින් යකඩ මිශ්‍ර සහ යකඩ මිශ්‍රනොවන ලෝහ අබලි සහ වෙනත් අදාළ ද්‍රව්‍ය ගිවිසගත් මුදලකට කාර්මික සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් රාජ්‍ය ආයතන වෙතින් මිලදී ගනු ලබයි. මෙම ද්‍රව්‍ය කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ලියාපදිංචි වී ඇති ලුහු ඉංජිනේරු කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය ලෙස විකුණනු ලබයි.

**ප්‍රදර්ශන -** කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාකයින් සඳහා දිස්ත්‍රික් සහ පළාත් මට්ටමින් ප්‍රදර්ශන සංවිධානය කරනු ලබයි. දිස්ත්‍රික් සහ පළාත් මට්ටමේ ප්‍රදර්ශන පැවැත්වීමෙන් අනතුරුව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ යන කාණ්ඩවලින් මුළු දිවයිනෙහිම විශිෂ්ය ව්‍යවසායකයින් තෝරාගැනීම සඳහා ජාතික මට්ටමේ වාර්ෂික ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශන පවත්වනු ලැබේ. මෙම ප්‍රදර්ශන මගින් රැකියා අවස්ථා නිර්මාණය කිරීමට සහ සුළු කර්මාන්ත ආරම්භ කිරීමට පහසුකම් සලසා දෙනු ලැබේ.

වගු අංක **4.4.1 -** අලෙවි අංශයේ කාර්යසාධනය - 2013

| **කාර්යසාධනය** | **ලක්නිපැයුම් අලෙවි මධ්‍යස්ථානය** | **ලක්කම් අලෙවි මධ්‍යස්ථානය** | **උපකොන්ත්‍රාත් ලබාදීම** | **අබලි ලෝහ ව්‍යාපෘතිය** | **එකතුව (රු.මි.)** |
|---|---|---|---|---|---|
| අලෙවි වටිනාකම (රු. මි.) | 2.300 | 13.900 | 6.200 | 52.400 | 74.800 |
| ආදායම (රු. මි.) | 0.244 | 1.890 | 0.328 | 20.000 | 22.462 |




ප්‍රස්තාරය 4.4.1 **-** අලෙවි අංශයේ කාර්යසාධනය - 2013

**විශේෂ ක්‍රියාකාරකම්**

සමාලෝචිත වර්ෂය තුළ මෙම අංශය විසින් පහත සඳහන් විශේෂ ක්‍රියාකාරකම් ඉටු කර තිබේ:

- 2013 සැප්තැම්බර් 10 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහිදී ජාතික තිළිණ ප්‍රදානෝත්සවය පවත්වන ලදී - විවිධ නිෂ්පාදන අංශයන් යටතේ ඇගයීම් සිදු කර දිවයින පුරා සිටින ස්වයංරැකියාලාභීන්, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අතරින් පළාත් මට්ටමින් තිළිණලාභීන් 150 දෙනෙකු තෝරාගන්නා ලදී.
- 2013 මාර්තු 23 සිට 30 වැනි දින දක්වා අම්පාර දිස්ත්‍රික්කයේ පැවති දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සහභාගීවීම.

**වගු අංක 4.4.2 - උපයාගත් ආදායම සහ ප්‍රධාන භෞතික කාර්යසාධනය**

| සංයුක්ත අරමුණ | | | |
|---|---|---|---|
| G1a කර්මාන්ත දිරිමත් කිරීම ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම | | | |
| G1b ව්‍යවසාකයින් පුහුණුකිරීම, සංවර්ධනය කිරීම සහ උපදේශකත්වය සැපයීම | | | |
| G7 දේශීය කාර්මික නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම හෝ බෙදාහැරීම සඳහා දේශීය සංවිධාන හෝ විදේශීය ආයතන හෝ රජයයන් සමග කටයුතු කිරීම හෝ සහයෝගය දැක්වීම. | | | |
| G9 කාර්මික කටයුතු සඳහා ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් ඇතුළු සියළුම සේවා සහ පහසුකම් සපයාදීම. | | | |
| G10 කාර්මික යන්ත්‍රසූත්‍ර හෝ අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා හෝ අදාල පහසුකම් සපයාදීම සඳහා ඕනෑම දේශීය සංවිධානයකට හෝ පුද්ගලයෙකුට හෝ පුද්ගලයින්ට මූල්‍යමය වශයෙන් හෝ අන්‍යාකාරයෙන් සහායවීම. | | | |
| සංයුක්ත අරමුණු ඉටුකරගැනීම සඳහා ක්‍රියාත්මක කළ ක්‍රියාකාරකම් | | මිනුම් දර්ශකය | සාධනය |
| G1a.25 | උපකොන්ත්‍රාත් ලබාදීමේ පහසුකම් සැලසීම සහ ඊ-මේල් / ජනමාධ්‍ය සහ අන්තර්ජාල වෙබ් අඩවි හරහා සේවා ප්‍රවර්ධනය කිරීම | | |
| (අ) | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ අලෙවි ධාරිතාවය වැඩිදියුණු කිරීම | | |
| (i) | උප කොන්ත්‍රාත් ලබාදීමේ පහසුකම් සපයාදීම | ඇණවුම් බෙදාහැරීම | 18 |
| | | ඇණවුම්වල වටිනාකම (රු) | 6,224,188 |
| | | උප-කොන්ත්‍රාත් ලබාගැනීම සඳහා පහසුකම් සලසන ලද කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 10 |
| | | ආදායම (රු.) | 328,625 |
| G1b.8 | ව්‍යවසායකයින් සඳහා කා.ස.ම. ජාතික 'ශිල්ප' ප්‍රදර්ශනය සහ තිළිණ ප්‍රදානය සංවිධානය කිරීම සහ | | |

| | | | |
|---|---|---|---|
| | පැවැත්වීම | | |
| (අ) | **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ වෙළඳපොළ කොටස වැඩිකිරීම** | | |
| (i) | අමාත්‍යංශය හා එක්ව ජාතික තිළිණ ප්‍රදානෝත්සවය සංවිධානය කිරීම | ජාතික තිළිණ ප්‍රදානෝත්සව සංඛ්‍යාව | 1 |
| | | සේවා සපයන ලද ව්‍යාපාර සංඛ්‍යාව | 135 |
| | | වියදම (රු.) | 4,600,000 |
| (ii) | වෙනත් ආයතන විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශණවලට සහභාගීවීම - "දැයට කිරුල" ජාතික ප්‍රදර්ශනය | ප්‍රදර්ශන සංඛ්‍යාව | 1 |
| | | සහභාගීවූ ව්‍යාපාර සංඛ්‍යාව | 10 |
| | | ආදායම (රු.) | 193,500 |
| | | වියදම (රු.) | 600,000 |
| G7.6 | 'ලක්නිපැයුම්' අලෙවි මධ්‍යස්ථානවල ප්‍රදර්ශන සහ අලෙවි පහසුකම් වැඩිදියුණු කිරීම | | |
| (i) | 'ලක්නිපැයුම්' අලෙවි මධ්‍යස්ථාන හරහා අලෙවි පහසුකම් සපයාදීම | අලෙවි පහසුකම් ලබාගත් කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 100 |
| | | අලෙවි පිරිවැටුම (රු.) | 2,395,375 |
| | | ආදායම (රු.) | 244,840 |
| | | වියදම (රු.) | 31,297 |
| G7.7 | 'ලක්කම්' අලෙවි මධ්‍යස්ථානවල ප්‍රදර්ශන සහ අලෙවි පහසුකම් වැඩිදියුණු කිරීම | | |
| (i) | 'ලක්කම්' අලෙවි මධ්‍යස්ථාන හරහා අලෙවි පහසුකම් සපයාදීම | අලෙවි පහසුකම් ලබාගත් කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 250 |
| | | අලෙවි පිරිවැටුම (රු.) | 13,966,987 |
| | | කා.ස.ම. ආදායම (රු.) | 1,892,586 |
| G9.12 | අනෙකුත් සහාය සේවා ලබාගත් කර්මාන්තකරුවන් | | |
| (i) | මුද්‍රණ පහසුකම් සපයාදීම | නිමකරන ලද මුද්‍රණ වැඩ සංඛ්‍යාව | 164 |
| | | පවත්වනලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 3 |
| | | ටයිප්කිරීම සහ පිටු නිර්මාණය කිරීම් සංඛ්‍යාව | 70 |
| | | මුළු ආදායම (රු.) | 784,366 |
| | | මුළු වියදම (රු.) | 969,121 |
| G10.3 | සහනදායී මිල ගණන් යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට එකතු කරන ලද ලෝහ අබලි ලබාදීම | | |
| (i) | අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය හරහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට සහනදායී මිල ගණන් යටතේ ලෝහ අබලි සපයාදීම | මිලදීගත් ප්‍රමාණය (මෙ.ටො) | 708 |
| | | බෙදාදුන් ප්‍රමාණය (මෙ.ටො) | 760 |
| | | කර්මාන්තකරුවන් අතර අබලි ද්‍රව්‍ය බෙදාදීම | 808 |
| | | අලෙවි පිරිවැටුම (රු.) | 52,404,785 |

## 4.5 කාර්මික ජනපද අංශය

**පොදු**

ශ්‍රී ලංකාවට කාර්මික ජනපද සංකල්පය හඳුන්වා දෙනු ලැබුවේ 1960 දශකයේදී ය. එහි ප්‍රධාන අරමුණ වූයේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වෙත කර්මාන්ත පිහිටුවීම සඳහා පාරිසරික වශයෙන් යෝග්‍යවන ප්‍රදේශවල ප්‍රමාණවත් යටිතල පහසුකම් සහිත ඉඩම් සහ ගොඩනැගිලි සපයාදීමයි.

පසුගිය වසර 45 ක කාලපරිච්ඡේදය තුළදී කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් දිවයින පුරා කාර්මික ජනපද 19 ක් ස්ථාපිත කරන ලද අතර එම කාර්මික ජනපද සමස්ත ලෙස කාර්මික ඒකක 744 කින් (සංවර්ධනය කළ බිම් කොටස් 744 ක් සහ ඉදිකළ ගොඩනැගිලි 80 ක් සහිතව) සමන්විත වේ. එයින් කාර්මාන්ත භූමි 623 ක් (සංවර්ධනය කළ බිම් කොටස් 543 ක් සහ ඉදිකළ ගොඩනැගිලි 80 ක්) සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත 395 ක් සඳහා ලබාදී ඇත. එම කර්මාන්ත මගින් ඍජු හා වක්‍ර රැකියා අවස්ථා 6,500 ක් පමණ නිර්මාණය කර ඇති අතර ඒවා අපනයන ආදායම් උපයාදීම හරහා දළ ජාතික නිෂ්පාදනය වැඩිදියුණු කිරීමට ද දායක වෙයි.

ශ්‍රී ලංකාව තුළ කාර්මික ජනපද පිහිටුවීමට, නඩත්තුකිරීමට සහ පවත්වාගෙන යාමට කාර්මික සංවර්ධන පනතේ 33(2)

(අ) වගන්තිය මගින් කාර්මික සංවර්ධන මණ්ඩලයට බලතල ලබා දී තිබේ. ශ්‍රී ලංකාව තුළ කාර්මික ජනපද පිහිටුවීම සඳහා ව්‍යවස්ථාපිතව බලය පවරන ලද ප්‍රථම රාජ්‍ය ආයතනය කාර්මික සංවර්ධන මණ්ඩලය වේ.

ආරම්භයේදී කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් කාර්මික ජනපද තුනක් පිහිටුවනු ලැබීය: ගම්පහ දිස්ත්‍රික්කයේ ඒකල,




මහනුවර දිස්ත්‍රික්කයේ පල්ලෙකැලේ සහ යාපනය දිස්ත්‍රික්කයේ අච්චුවේලි එම ප්‍රදේශ තුනයි. එම කාර්මික ජනපද තුන ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද මුල්ම කාර්මික ජනපද තුනයි. 1970 දශකයේදී පිළිවෙලින් කළුතර සහ පුත්තලම යන දිස්ත්‍රික්කවල පිහිටි හොරණ සහ ලුණුවිල යන ප්‍රදේශවල කාර්මික ජනපද පිහිටුවන ලදී. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි පන්නල කාර්මික ජනපදය 1980 දශකයේදී පිහිටුවන ලදී. 1990 දශකයේදී ගම් උදාව සංකල්පය හා සමගාමීව ක්‍රියාත්මක වුණු 'ඉසුරු උදාන' කාර්මික ජනපද වැඩසටහන යටතේ සහ ග්‍රාමීය කාර්මික ජනපද වැඩසටහන යටතේ මාතලේ, වවුලුගල, ගලිගමුව,

පුස්සැල්ල, කරන්දෙනිය, බද්දේගම, නෑගම්පහ, මිහින්තලේ, වවුනියාව සහ බුත්තල යන කාර්මික ජනපද පිහිටුවන ලදී. 1990 දශකයේදී සහ 2006 වර්ෂයේදී පිළිවෙලින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත කාර්මික ජනපදය සහ කොළඹ දිස්ත්‍රික්කයේ පානළුව කාර්මික ජනපදය ද ආරම්භ කරන ලදී. අවසානවට, 1980 දශකයේදී ජනවාර්ගික ගැටුම් පැවති වකවානුව තුළ අච්චුවේලි කාර්මික ජනපදය සම්පූර්ණයෙන්ම විනාශ විය.

රූපසටහන **4.5.1 -** කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන කාර්මික ජනපද

**වගු අංක 4.5.1 – දිවයින පුරා පිහිටා ඇති කාර්මික ජනපද (පළාත් අනුව)**

| යොමු අං. | කාර්මික ජනපදය | පළාත |
|---|---|---|
| 1 | ඒකල, හොරණ, වවුලුගල, පානළුව | බස්නාහිර |
| 2 | පල්ලෙකැලේ, මාතලේ, කොටගල | මධ්‍යම |
| 3 | පන්නල, ලුණුවිල | වයඹ |
| 4 | ගලිගමුව, පුස්සැල්ල | සබරගමුව |
| 5 | කරන්දෙනිය, බද්දේගම, බෙලිඅත්ත | දකුණු |
| 6 | නෑගම්පහ, මිහින්තලේ | උතුරු මැද |
| 7 | වවුනියාව,  අච්චුවේලි | උතුරු |
| 8 | බුත්තල | ඌව |

කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කාර්මික ජනපද 19 ක් දිවයින පුරා පිහිටා ඇත. මෙම කාර්මික ජනපද වැඩි රැකියා අවස්ථා සංඛ්‍යාවක් උත්පාදනය කරන සුළු හා මධ්‍ය පරිමාණ අගය එකතු කළ කර්මාන්ත පිහිටුවීම සඳහා යටිතල පහසුකම් සපයා දෙන කාර්මික කේන්ද්‍රස්ථාන ලෙස කටයුතු කරන හෙයින් එම කාර්මික ජනපද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීමට, ආකර්ෂණය කිරීමට සහ වැඩිදියුණු කිරීමට උපකාරී වෙයි. ලබන වසර දෙක තුළදී කාර්මික ජනපද වැඩිදියුණු කිරීමට සහ නවීකරණය කිරීමට කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් කටයුතු කරමින් සිටින අතර භාවිතයට ගෙන නොමැති හිස් ඉඩම්

තිබේ නම් ඒවා ඉදිරියේදී ආයෝජනය කිරීමට ඉදිරිපත්වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආයෝජකයින් වෙත ලබා දෙනු ලැබේ.

**ව්‍යවසායකයින් තෝරාගැනීම**

පහත සඳහන් ලක්ෂණ සහිත, යෝජිත ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමුකරමින් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් නියම කරනු ලබන නිර්ණායක පදනම් කරගෙන සුදුසු ව්‍යවසායකයින් සඳහා සංවර්ධනය කරන ලද ඉඩම් කොටස් වෙන්කර දීම සිදු කරනු ලැබේ:

- රැකියා අවස්ථා උත්පාදනය කරන ව්‍යාපාර
- අපනයන අරමුණු කරගත් ව්‍යාපාර
- ඵලදායීත්වය වැඩිදියුණු කිරීම සඳහා නවීකරණය කරන ලද ක්‍රියාවලින් භාවිතා කිරීමට නැඹුරුවූ කර්මාන්ත
- ඉහළ අගය එකතුකිරීමක් සහිත භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්ත

කාර්මික ජනපද අංශය විසින් ඉඩම් වෙන්කර දෙනු ලැබීම සඳහා නිෂ්පාදන සහ සේවා ව්‍යාපාර යන දෙවර්ගයටම සුදුසුකම ඇත.

**සංවර්ධනය කරන ලද ඉඩම් කොටස් වෙන්කරදීම සඳහා වන කොන්දේසි**

සංවර්ධන කරන ලද බිම් කොටස් වෙන්කර දීම කාර්මික සංවර්ධන මණ්ඩලය සහ තෝරාගත් ව්‍යවසායකයින් අතර නිසි පරිදි ක්‍රියාත්මක කරනු ලබන කල්බදු ගිවිසුමක් පදනම් කරගෙන සිදු කරනු ලැබේ. සංවර්ධනය කරන ලද බිම් කොටස්වලට වසර 30 ක් දක්වා වන කල් බදු අයිතියක් ද කර්මාන්තශාලා ගොඩනැගිලි සඳහා වසර 10 ක කල්බදු අයිතියක්ද ලබාදෙනු ලැබේ. මාසික හෝ වාර්ෂික කුලිය රජයේ ''ප්‍රධාන තක්සේරුකරුගේ'' තක්සේරුව අනුව නියම කරනු ලැබේ.

ලබාදෙනු ලබන බිම්කොටසේ ප්‍රමාණය කර්මාන්තයේ ස්වභාවය මත පදනම් වේ. කර්මාන්තකරුවන් මණ්ඩලය වෙත පරිසර අනුමැති සහතිකය ඉදිරිපත් කළ යුතු වේ.

**කාර්මික ජනපද අංශයට පැවරී ඇති කාර්යයන්**

- කාර්මික ජනපද පිහිටුවීමට සුදුසු ස්ථාන හඳුනාගැනීම සඳහා මූලික පරීක්ෂණ සිදු කිරීම.
- අදාළ ආයතනවලින් අරමුදල් සහ අනුමැතීන් ලබාගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම.
- යෝජිත හෝ පවතින කාර්මික ජනපදවල ඉදිකිරීම් කටයුතු සිදු කිරීම.
- හිස්වී තිබෙන ඉඩම් සහ ගොඩනැගිලි සඳහා නව කර්මාන්තකරුවන් තෝරාගැනීම.
- පවතින කාර්මික ජනපද නඩත්තු කිරීම

- ඉඩම් වෙන්කරදීමේ ලිපි ලබාදීම සහ බදුකරුවන් සමග කල්බදු ගිවිසුම් අත්සන් කිරීම.
- කුලී අයකරගැනීම සහ දෛනික නඩත්තු කටයුතු අධීක්ෂණය කිරීම.
- දෙපාර්ශවය අතර ඇතිකරගෙන තිබෙන ගිවිසුම්වල කොන්දේසි කඩකරන කර්මාන්තකරුවන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම.
- කාර්මික සංවර්ධන මණ්ඩලයේ අනෙකුත් අංශ සහ අනෙකුත් ආයතන සමග එක්ව කර්මාන්තකරුවන් සඳහා සහාය සපයාදීම.
- කාර්මික සංවර්ධන මණ්ඩලයේ අනෙකුත් අංශ විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික ප්‍රදර්ශන, තරග සහ වැඩමුළුලවට සහභාගීවීම.
- ශක්‍යතා අධ්‍යයන, සුදුසු ඉඩම් තෝරාගැනීම සහ මූලික සේවා සඳහා පහසුකම් සැලසීමට ප්‍රාග්ධනය වෙන් කිරීම සිදු කිරීමෙන් අනතරුව නව කාර්මික ජනපද පිහිටුවීම
- නව ව්‍යවසායකයින් තෝරාගැනීම (නව කාර්මික ජනපදවලට අදාළව සහ පවතින කාර්මික ජනපදවල පුරප්පාඩුවී තිබෙන කොටස් සඳහා)
- සංවර්ධනය කරන ලද ඉඩම් සහ පුරප්පාඩුවී තිබෙන ගොඩනැගිලි කාමර භාරදීම
- කල්බදු ගිවිසුම් අත්සන් කිරීම
- ක්‍රියාත්මක සැලැස්මට අදාළව කර්මාන්ත ආරම්භ කිරීමේ පසු විපරම් කටයුතු සිදුකිරීම
- ඉඩම් කොටස් සහ ගොඩනැගිලි සඳහා කුලිය එකතු කිරීම
- කාර්මික ජනපද නඩත්තු කිරීම සඳහා චක්‍රීය අරමුදලක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු සූදානම් කිරීම

**අච්චුවේලි කාර්මික ජනපදය නැවත ක්‍රියාත්මක කිරීම**

අච්චුවේලි කාර්මික ජනපදයේ පළමුවැනි අදියරේ සංවර්ධන වැඩසටහන් යටතේ මළ අපද්‍රව්‍ය බැහැරකිරීමේ පද්ධතියේ ඉදිකිරීම් කටයුතු, වැසි ජලය බැසයාමේ කාණු සහිත අභ්‍යන්තර මාර්ග පද්ධතිය, ආරක්ෂක නිලධාරී කාමර සහ ඇතුල්වීමේ දොරටු සහිතව ඉඩම වටා වැට සකස් කිරීම සහ තාප්පය ඉදිකිරීම, ජල සැපයුම් යෝජනාක්‍රමය, ගිනි ආරක්ෂණ පද්ධතිය, භූමිය දර්ශනීයව සැකසීම, සහ පරිපාලන ගොඩනැගිල්ල සහ පොදු සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම මෙම වර්ෂයේදී ආරම්භ කරන ලද අතර වැඩකටයුතු අඩක් නිම කර ඇත.

එකී කාර්යය සඳහා වන පිරිවැය රුපියල් මිලියන 270 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එම මුදලින් රුපියල් මිලියන 220 ක ප්‍රමාණයක් ඉන්දීය රජය විසින් ද ඉතිරි රුපියල් මිලියන 50 ශ්‍රී ලංකා රජය විසින් ද ලබාදෙනු ලැබේ.

මෙම වර්ෂය තුළදී කර්මාන්තකරුවන් තෝරාගැනීම සිදු කරන ලද අතර ආහාර, ලුහු ඉංජිනේරු, ෆයිබර්ග්ලාස් සහ පී.වී.සී. කඹ සහ මාළු දැල් යන ක්ෂේත්‍රවල කර්මාන්ත ආරම්භ කිරීම සඳහා සුදුසුකම් ලැබූ කර්මාන්තකරුවන් 05 දෙනෙකු තෝරාගන්නා ලදී.

එමෙන්ම මෙම වර්ෂය තුළදී රේඛීය අමාත්‍යාංශයේ සහාය ඇතිව එකී කාර්මික ජනපදවල තිබෙන සංවර්ධනය කරන ලද ඉඩම් කොටස් පිළිබඳව ආයෝජකයින් දැනුවත් කිරීම විශේෂයෙන්ම අරමුණු කරගෙන ආයෝජක සංසදයක් කොළඹදී පවත්වන ලදී.

**පවතින කාර්මික ජනපද නවීකරණය කිරීම සහ වැඩිදියුණු කිරීම**

රේඛීය අමාත්‍යාංශයේ සහාය ඇතිව කාර්මික ජනපද 09 ක යටිතල පහසුකම් නවීකරණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා රජයේ භාණ්ඩාගාරය හරහා රුපියල් මිලියන 40 ක මුදලක් ලබාදී තිබේ. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළදී පහත සඳහන් ක්‍රියාකාරකම් නිම කරන ලදී:

**වගු අංක 4.5.2 - දිවයින පුරා පිහිටා ඇති කාර්මික ජනපද වැඩිදියුණු කිරීම (පළාත් අනුව)**

| යොමු අංකය | කාර්මික ජනපදය | දිස්ත්‍රික්කය | ක්‍රියාකාරකම | මුදල (රු.) | ඉලක්කය සාධනය කර ගැනීම |
|---|---|---|---|---|---|
| 1 | ඒකල | ගම්පහ | වීදි ලාම්පු සවිකිරීම | 1,418,526.75 | 100% |
| 2 | පානළුව | කොළඹ | ජල සැපයුම් යෝජනා ක්‍රමය, ප්‍රධාන දොරටුව සහ බාධකය | 2,858,667.00 | 100% |
| 3 | පල්ලෙකැලේ | මහනුවර | අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම | 10,184,304.00 | 90% |
| 4 | වවුලුගල | කළුතර | ආරක්ෂක කුටිය සහ බෝක්කු | 1,360,474.00 | 100% |
| 5 | පන්නල | කුරුණෑගල | ජල සැපයුම් යෝජනාකුමය | - | - |
| 6 | පුස්සැල්ල | රත්නපුර | ආරක්ෂක කුටිය සහ ජල සේවාව | 3,042,902.00 | 80% |
| 7 | ගලිගමුව | කෑගල්ල | ජල සේවාව | 4,630,000.00 | 75% |
| 8 | පූන් තෝට්ටම් | වවුනියාව | අභ්‍යන්තර මාර්ග, ළිඳ සහ බෝක්කු | 755,809.00 | 100% |
| 9 | කළුදෑවල | මාතලේ | ඉඩම් අත්පත් කර ගැනීම | 3,334,311.00 | 100% |

**කල්බදු ගිවිසුම් අත්සන් කිරීම**

මෙය මෙම අංශයේ ප්‍රධාන කාර්යයක් වේ. එමගින් එක් එක් පාර්ශවය විසින් එකඟවී ඇති කොන්දේසි ආරක්ෂා කෙරෙන අතර කල්බදු කාලපරිච්ඡේදය සඳහා අනුමැතිය ලබාදීම මගින් සමපාර්ශවීය කටයුතු සඳහා සුරැකුමක් ලෙස බදුකරු වෙත ලබාදී ඇති අමතර වාසියක් වේ. නිම කර ඇති ගොඩනැගිලි සඳහා වසර 20 ක කාලයක් සඳහා ගිවිසුම් අත්සන් කරනු ලබන අතර සංවර්ධනය කරන ලද ඉඩම් කොටස්

සඳහා වසර 30 ක කාලයක් සඳහා ගිවිසුම් අත්සන් කරනු ලැබේ. ඒ අනුව, 2013 වර්ෂය තුළදී කර්මාන්තකරුවන් සමග කල්බදු ගිවිසුම් 11 ක් අත්සන් කරන ලදී.

**වගු අංක 4.5.3 – 2013 වර්ෂය තුළදී ඉඩම් වෙන්කරදීම සහ කර්මාන්ත ආරම්භ කිරීම**

| යොමු අංකය | කාර්මික ජනපදයේ නම | කර්මාන්ත සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ඒකල | 01 |
| 2 | පල්ලෙකැලේ | 03 |
| 3 | පන්නල | 01 |
| 4 | කළුදැවල | 01 |
| 5 | ගලිගමුව | 01 |
| 6 | ලුණුවිල | 02 |
| 7 | වවුනියාව | 01 |
| එකතුව | | **10** |

**කුලිය අයකරගැනීම සහ කුලිය සංශෝධනය කිරීම සඳහා වන නව යෝජනාව**

සාමන්‍යයෙන් කර්මාන්ත ජනපදවලින් උපයාගන්නා ආදායම ඒවායේ නඩත්තු කටයුතු සඳහා සහ සංවර්ධන කටයුතු සඳහා සඳහා වැය කරනු ලැබේ. එක් එක් කාර්මික ජනපදයෙහි ඇති සංවර්ධනය කරන ලද ඉඩම් කොටස්වල බදුකුලිය සංශෝධනය කිරීමේ මූලික ක්‍රමය තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සකස්කරනු ලබන විවෘත වෙළඳපොළෙහි වාර්ෂික බදුකුලී වටිනාකම මත පදනම් වේ. එය සෑම වර්ෂ පහකට වරක් ක්‍රියාත්මක කරනු ලැබේ. සමහර බදුකරුවන් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් සැළකිල්ලට ගෙන, 2013.07.05 දිනැති අංක CP/13/0614/513/006 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2011 ජූනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, බදුකුලිය සංශෝධනය කිරීම සඳහා දැනට පවතින එකී ක්‍රමවේදය වෙනුවට එක් එක් කාර්මික ජනපදයෙහි සංවර්ධිත ඉඩම් කොටස් සඳහා නව බදුකුලී යෝජනාක්‍රමයක් යොදා ගන්නා ලදී. සමාලෝචිත වර්ෂය තුළදී එම ක්‍රමය ක්‍රියාත්මක නොකරන ලද නමුත්, 2014 වර්ෂයේ සිට එය ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. එමගින් කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්මික ජනපදවල සංවර්ධිත ඉඩම්කොටස්වල බදුකරුවන්ට අමතර ප්‍රතිලාභ ගෙන දෙයි.

## 4.6 ඉංජිනේරු අංශය

සාමාන්‍ය

මෙම අංශයේ විෂය පථය යටතේ ඇති අංශ සහ මධ්‍යස්ථාන පහත සඳහන් පරිදි වේ:

- කටුබැද්ද ප්‍රධාන කාර්යාලය - ඉංජිනේරු වැඩපොළෙහි අංශ, වාත්තු වැඩපළ, ඉංජිනේරු කාර්යාලය (තාක්ෂණික තොරතුරු සහ උපදේශණ සේවා සහ තක්සේරු වාර්තා සඳහා), සිවිල් ඉංජිනේරු සහ විදුලි ඉංජිනේරු
- පැලියගොඩ - විද්‍යුත්ලෝහාලේපන මධ්‍යස්ථානය
- පන්නල - යෝග්‍ය තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
- මාතර - පොදු සේවා මධ්‍යස්ථානය
- පමුණුව - පිත්තල භාණ්ඩ සේවා මධ්‍යස්ථානය

**අංශයේ ක්‍රියාකාරකම්**

2013 වර්ෂය තුළදී ඉංජිනේරු අංශය විසින් සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ:

- දැනට සිටින කර්මාන්තකරුවන්ට සහ නව කර්මාන්තකරුවන්ට / කර්මාන්තකරුවන් වීමේ හැකියාව සහිත අයට අමුද්‍රව්‍ය සහ යන්ත්‍රසූත්‍ර තෝරාගැනීමේදී, සැලසුම් කිරීමේදී / සංවර්ධනය කිරීමේදී සහාය ලබාදීම සහ තාක්ෂණය / ක්‍රියාවලි පිළිබඳ දැනුම ලබාදීම.
- වැඩ ඇණවුම් මත කර්මාන්තකරුවන්ට පිරිසැකසුම්, වාත්තු කිරීම්, සහ ලෝහ නිමා කිරීම් සේවා සැපයීම.
- මණ්ඩලය වෙත සිවිල් සහ විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රවල අභ්‍යන්තර නඩත්තු, අළුත්වැඩියා / ප්‍රතිසංස්කරණ සහ ඉදිකිරීම් සැලසුම්කරණ සහ අධීක්ෂණ සහාය සපයාදීම සහ මණ්ඩලයේ වාහන නඩත්තු අවශ්‍යතාවලදී තාක්ෂණික සහ අධීක්ෂණ සහාය ලබාදීම.
- ග්‍රාමීය කර්මාන්ත සහ ස්වයං රැකියා උත්පාදන අමාත්‍යාංශයයේ ව්‍යපෘති සඳහා සිවිල් සහ විදුලි ඉංජිනේරු උපකාරක සේවා සැපයීම.
- යන්ත්‍රෝපකරණ තක්සේරු වාර්තා සැපයීම, වාත්තු වැඩ අංශය සඳහා විද්‍යාගාර පරීක්ෂණ සේවා සැපයීම මෙන්ම අංශය විසින් නිෂ්පාදනය කරන ලද යන්ත්‍රෝපකරණ සහ මෙවලම් අලෙවිය අංශය විසින් ඉටුකරන ලද අනෙකුත් ක්‍රියාකාරකම් අතර වේ.

**2013 වර්ෂයේ කාර්යසාධනය**

- **ගාස්තු අයකරන සේවා, තක්සේරු, වාත්තුවැඩ/විද්‍යුත්ලෝහාලේපන විද්‍යාගාර සේවා, මෙවලම් විකිණීම සහ විවිධ අයිතම මගින් ලැබුණු ආදායම**

මෙම අංශය යටතේ ඇති විවිධ අංශ සහ මධ්‍යස්ථාන විසින් 2013 වර්ෂය තුළ ඉටු කරන ලද බාහිර සේවා මගින් උපයාගත් ආදායම පහත වගුවේ දක්වා ඇත. මෙම දත්ත 2013 වර්ෂය අවසානය වන දිනට අදාළ වන පරිදි ඉදිරිපත් කර ඇති අතර එයට වැට් සහ ජා.ගො.බ. අයත් නොවේ.

වගු අංක **4.6.1** – 2013 වර්ෂයේදී ඉටුකරන ලද සේවාවන් සඳහා බාහිරින් උපයාගත් ආදායම

| යොමු අංකය | අංශය / කාර්යය | වැට් සහ ජා.ගො.බ. හැර දළ ආදායම (රු.) |
|---|---|---|
| 1 | ඉංජිනේරු වැඩපොළ - ප්‍රධාන කාර්යාලය, කටුබැද්ද | 3,758,557 |
| 2 | වාත්තු වැඩපොළ - ප්‍රධාන කාර්යාලය | 1,735,820 |
| 3 | තක්සේරු වාර්තා - ප්‍රධාන කාර්යාලය | 1,062,240 |
| 4 | සිවිල් ඉංජිනේරු සේවා - ප්‍රධාන කාර්යාලය | 41,458 |
| 5 | යෝ.තා.ප.සං.ම.., පන්නල | 1,648,767 |
| 6 | විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය - පෑලියගොඩ | 2,733,955 |
| 7 | පොදු සේවා මධ්‍යස්ථානය, මාතර | 2,483,602 |
| 8 | පිත්තල භාණ්ඩ සේවා මධ්‍යස්ථානය - පමුණුව | 516,460 |
| එකතුව | | **13,980,859** |

- **අභ්‍යන්තර සේවා**

විවිධ අංශ මගින් සපයාදෙන ලද අභ්‍යන්තර ඉංජිනේරු සේවා වැඩවල වටිනාකම (සේවා පදනමින් පිරිවැය) පහත සඳහන් පරිදි වේ :

වගු අංක **4.6.2** – 2013 වර්ෂයේදී සපයාදෙන ලද අභ්‍යන්තර සේවාවල වටිනාකම

| යොමු අංකය | අංශය | නිම කරන ලද අභ්‍යන්තර සේවාවල වටිනාකම (රු.) |
|---|---|---|
| 1 | කම්හල - ප්‍රධාන කාර්යාලය | 178,466 |
| 2 | වාත්තු වැඩපොළ - ප්‍රධාන කාර්යාලය | 98,554 |
| 3 | සිවිල් ඉංජිනේරු සේවා - ප්‍රධාන කාර්යාලය | 1,771,460 |
| 4 | විදුලි ඉංජිනේරු සේවා - ප්‍රධාන කාර්යාලය | 1,433,484 |
| 5 | යෝ.තා.ප.සං.ම. - පන්නල | 97,620 |
| එකතුව | | **3,579,584** |

- **උපදේශණ / ව්‍යාප්ති සේවා**

2013 වර්ෂයේදී සැලසුම් සහ පිරිසැකසුම් පිළිබඳ තාක්ෂණික / ක්‍රියාවලි තොරතුරු සහ උපදේශණ සපයාදෙමින් කර්මාන්තකරුවන්ට උපදේශකත්ව සේවා 139 ක් සපයාදී ඇත. එම සේවා විවිධ අංශ අතර බෙදී ගොස් ඇති ආකාරය පහත සඳහන් පරිදි වේ:

- යෝ.තා.ප.සං.ම., පන්නල : 20
- විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය : 20
- ප්‍රධාන කාර්යාලය (කම්හල සහ ඉංජිනේරු කාර්යාලය) : 99

- **තාක්ෂණය ලබාදීමේ වැඩමුළු සහ පුහුණු වැඩසටහන්**

2013 වර්ෂයේදී ප්‍රධාන කාර්යාලයෙහි පිහිටි වාත්තු වැඩපොළ මගින් සමස්ත වශයෙන් පුද්ගලයින් 19 දෙනෙකු සඳහා අවස්ථා තුනකදී වාත්තු වැඩපොළ තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

- 2013 ජනවාරි - පෙබරවාරි මාස - දින 10 ක වැඩසටහනක් මගින් නාවික හමුදාවේ පුද්ගලයින් 05 දෙනෙකු සඳහා
- 2013 ජූනි මාසය - දින 10 ක වැඩසටහනක් මගින් පෞද්ගලික අංශයේ කර්මාන්තවල සහ රජයේ කර්මාන්ත ශාලාවේ පුද්ගලයින් 07 දෙනෙකු සඳහා
- 2013 ජූනි මාසය - දින 05 ක වැඩසටහනක් මගින් රත්මලාන ගුවන්සේවා පාසලේ පුද්ගලයින් 05 දෙනෙකු සඳහා

පන්නල පිහිටි යෝ.තා.ප.සං.ම. මගින් පහත සඳහන් තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් දෙක පවත්වන ලදී:

- 2013 අප්‍රේල් මාසයේදී කොළඹ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයෙහි (JICA) මූල්‍ය සැපයීම මත පුද්ගලයින් 09 දෙනෙකු සඳහා "පොල් තෙල් සිදීම" පිළිබඳ දින 05 ක පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී.
- 2013 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සඳහා පුද්ගලයින් 09 දෙනෙකු වෙනුවෙන් "කම්මල් වැඩ" පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී.

## 4.7 ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශකත්ව සේවා මධ්‍යස්ථානය

පේෂකර්ම සහ ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් 1989 දෙසැම්බර් 15 වැනි දින ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවකට අනුව ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශකත්ව සේවා මධ්‍යස්ථානය කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ඇති විශේෂ පුහුණු අංශයක් ලෙස පිහිටුවන ලදී. මෙම මධ්‍යස්ථානය විසින් දීප ව්‍යාප්ත මට්ටමින් කළමනාකරණ හැකියා සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පවත්වනු ලැබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ කාර්මික තාක්ෂණ තොරතුරු සේවා මධ්‍යස්ථානය, ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශකත්ව සේවා මධ්‍යස්ථානය සමග ඒකාබද්ධ කරන ලදී. එබැවින් කාර්මික තාක්ෂණ තොරතුරු සේවා මධ්‍යස්ථානය තවදුරටත් කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන අංශයක් ලෙස ක්‍රියාත්මක නොවේ.

කාර්මික තාක්ෂණ තොරතුරු සේවා මධ්‍යස්ථානයෙහි ප්‍රධාන කාර්යභාරය වන්නේ ශ්‍රී ලංකාව තුළ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වැඩිදියුණු කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා කාර්මික තොරතුරු සපයාදීම වේ. ව්‍යවසායකයින් සහ කාර්මික තාක්ෂණ තොරතුරු අතර ඇති පරතරය එමගින් නැති කර තිබේ. කාර්මික තාක්ෂණ තොරතුරු සේවා මධ්‍යස්ථානය පුස්තකාලයකින්, කාර්මික තොරතුරු ඒකකයකින්, තොරතුරු කුටියකින්, මුද්‍රණ සහ ප්‍රකාශණ අංශයකින් සහ එම සේවා සපයාදීමේ උප ඒකකයක් ලෙස ක්‍රියාත්මක තොරතුරු තාක්ෂණ ඒකකයකින් ද සමන්විත වේ. කාර්මික තාක්ෂණ තොරතුරු සේවා මධ්‍යස්ථානය සහ ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශකත්ව සේවා මධ්‍යස්ථානය ප්‍රතිව්‍යුහකරණය කිරීමේ ක්‍රියාවලිය යටතේ, තොරතුරු කුටිය සහ තොරතුරු තාක්ෂණ ඒකකය තාක්ෂණ සේවා අංශයටත්, මුද්‍රණ සහ ප්‍රකාශණ ඒකකය අලෙවිකරණ අංශයටත් අනුබද්ධ කරන ලදී.

ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශකත්ව සේවා මධ්‍යස්ථානයෙහි විෂය පථය යටතට පැවරෙන ප්‍රධාන අංශ වන්නේ ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශණ ඒකකය සහ පුස්තතකාලය සහ කාර්මික තොරතුරු ඒකකය වේ.

**ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශකත්ව සේවා මධ්‍යස්ථානයෙහි අරමුණු**

- නව ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීම
- ග්‍රාමීය ප්‍රදේශවල කාර්මික සංවර්ධය වේගවත් කිරීම
- පවතින කර්මාන්ත පුළුල් කිරීම සඳහා නව කළමනාකරණ ක්‍රමෝපායයන් හඳුන්වාදීම
- පුහුණුකරුවන් පුහුණු කිරීම (ව්‍යවසායකත්ව සංවර්ධනය සහ කළමනාකරණ උපදේශකත්වය)
- දේශීය කර්මාන්තකරුවන්ට තාක්ෂණික දැනුම සහ ව්‍යාපාර අත්දැකීම් සපයාදීම.
- කාලීන වශයෙන් වැදගත් වන ව්‍යාපාර සහ කර්මාන්ත ක්ෂේත්‍ර පිළිබඳව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ව්‍යවසායකයින් වීමේ දක්ෂතාවය සහිත පුද්ගලයින් දැනුවත් කිරීම
- මූලික උපදේශණ සේවා සහ කාර්මික තොරතුරු සපයාදීම

**ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශකත්ව සේවා මධ්‍යස්ථානය වෙත පැවරී ඇති කාර්යයන්**

- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- ව්‍යාපාර නිර්මාණය කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- කළමනාකරණ කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- දැනුවත්කිරීමේ වැඩසටහන් / සම්මන්ත්‍රණ පැවැත්වීම
- ව්‍යවසායකයින් සඳහා වාණිජ සහ ව්‍යාපාරික පුහුණුව ලබාදීම

- ව්‍යවසායිකයින්ගේ අවශ්‍යතා ඉටුකරදීම පිණිස ක.ස.ම. සහ කා.ස.ම. නොවන උපදේශක මණ්ඩලයක් පිහිටුවීම
- ක.ස.ම. තුළ 5 S වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- අන්තර්ජාල සහ ඊමේල් පහසුකම් සපයාදීම
- ප්‍රකාශණ අලෙවිකිරීම
- පුස්තකාල ද්‍රව්‍ය එකතුව වැඩිදියුණු කිරීම (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින්)
- පුස්කාල ද්‍රව්‍ය ක්‍රියාවලිගත කිරීම
- කාර්මික තොර්තුරු සංවිධානය කිරීම
- මූලික උපදේශණ සේවා සපයාදීම
- කා.සං.ම. සේවාදායකයින් අන්තර්ජාලගත දත්ත සංචිතයෙහි ලියාපදිංචි කිරීම
- අන්තර්ජාලගත දත්ත සංචිතයෙහි ලියාපදිංචි සේවාදායකයින් පිළිබඳ විස්තර ප්‍රාදේශීය කාර්යාල වෙත ලබාදීම.
- කර්මාන්තකරුවන්, සේවාදායකයින් සහ කා.සං.ම. කාර්යමණ්ඩලය වෙත කාර්මික තොරතුරු බෙදාහැරීම
- පුස්තකාලය වෙත අලුතින් ලබාගෙන ඇති ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු බෙදාහැරීම
- ග්‍රන්ථවිද්‍යාත්මක දත්ත, දේශීය යන්ත්‍රසූත්‍ර සහ භාණ්ඩ නිෂ්පාදකයින්, වාර්තා, ශ්‍රී ලංකා ප්‍රමිතීන්, උපකාරක ආයතන, පනත් එකතුව, සහ සම්පූර්ණ පාඨය සහිතව ''කර්මාන්ත'' සඟරාවේ ලිපි එකතුව පිළිබඳ දත්ත සංචිතය පවත්වාගෙනයාම සහ යාවත්කාලීන
- දේශීය සහ විදේශීය යන්ත්‍රසූත්‍ර පිළිබඳ තොරතුරු සපයාදීම
- කා.සං.ම. පුවත් සඟරාව සකස් කිරීම
- අත්පොත්, පැකේජ, අත්පත්‍රිකා, සුචිපත්‍ර සහ පත්‍රිකා ආදී ප්‍රකාශන සම්පාදනය කිරීම සහ යාවත්කාලීන කිරීම.
- විමසීම් සහ පිළිතුරු සේවාව
- විශේෂඥ උපදෙස් සඳහා යොමුකිරීම් සේවාව
- වැඩමුළු සංවිධානය කිරීම
- ප්‍රකාශණ අලෙවි කිරීම
- ඡායාපිටපත් සේවා සැපයීම
- තම යන්ත්‍රසූත්‍ර සහ නිෂ්පාදන කා.සං.ම. ප්‍රදර්ශනාගාර සහ කාර්මික ප්‍රදර්ශනවලදී ප්‍රදර්ශනය කිරීම සඳහා සේවාදායකයින් උනන්දු කරවීම.
- ප්‍රදර්ශන, සංසද, වැඩමුළු ආදිය සඳහා සහභාගීවීම සහ පුස්තකාල එකතුව යාවත්කාලීන කිරීම සඳහා නවතම තොරතුරු එක්රැස් කිරීම.

වගු අංක **4.7.1 -** ප්‍රධාන කාර්යසාධන ජයග්‍රහණ

| **යොමු අංකය** | **ආයතනික අරමුණු ඉටුකරගැනීම සඳහා ඉටුකළ ක්‍රියාකාරකම්** | **මිනුම් දර්ශකය** | **සාධනය** | **ආදායම (රු.)** |
|---|---|---|---|---|
| G1a.11 | ව්‍යවසායකත්ව සංවර්ධනය සහ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | 10 | 701,246 |
| | | සහභාගිවන්නන් සංඛ්යාව | 210 | |
| Gib.1 | දැනුවත් කිරීමේ වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | 4 | 20,000 |
| | | සහභාගිවන්නන් සංඛ්යාව | 120 | |
| Gib.2 | විෂයමාලා සංවර්ධනයකිරීම | විෂයමාලා සංඛ්‍යාව | 3 | - |
| Gib.3 | වෙළඳ සහ තාක්ෂණික පුහුණුව සපයාදීම | වැඩසටහන් සංඛ්‍යාව | 7 | 182,500 |
| | | සහභාගිවන්නන් සංඛ්යාව | 105 | |
| Gib.7 | උපදේශණය සහ උපදේශකත්වය | සපයාදෙන ලද සේවා සංඛ්‍යාව | 71 | - |
| G13.21 | කා.සං.ම. තුළ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම | වැඩසටහන් සංඛ්‍යාව | 1 | - |
| G11 | පුස්තකාල එකතුව සංවර්ධන කිරීම | පුස්තකාල ද්‍රව්‍ය සංඛ්‍යාව | 993 | |
| | **දත්ත සංචිතය පවත්වාගෙනයාම**<br>අන්තර්ජාලය හරහා ලියාපදිංචිවී ඇති සේවාදායකයින්<br>ගොඩනැගිලි ද්‍රව්‍ය 109<br>ආහාර පාන 1261<br>තෙල් සහ ෆයිබර් 205<br>රසායනික ද්‍රව්‍ය 907<br>දේශීය යන්ත්‍රසූත්‍ර සහ භාණ්ඩ නිෂ්පාදකයින්<br>ග්‍රන්ථවිද්‍යාත්මක දත්ත<br>Lotus SmartSuite ප්‍රවේශය<br>වාර්තා<br>උපකාරක ආයතන | සේවාදායකයින් ගණන<br>වාර්තා ගණන<br>වාර්තා ගණන<br>වාර්තා ගණන<br>වාර්තා ගණන<br>ආයතන ගණණ | 2,482<br>2,613<br>19,359<br>19,842<br>4,474<br>317 | |

| | | | | |
|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා ප්‍රමිති<br>පනත්<br>එච්.එස්. කේත (HS Code)<br>සම්පූර්ණ පාඨ සහිත ''කර්මාන්ත'' ලිපි<br>සම්පූර්ණ පාඨ සහිත පුවත්පත් ලිපි | ප්‍රකාශන ගණන<br>වාර්තා ගණන<br>වාර්තා ගණන<br>ලිපි ගණන<br>ලිපි ගණන | 1,315<br>690<br>307<br>3,153<br>222 | |

| යොමු අංකය | ආයතනික අරමුණ ඉටුකරගැනීම සඳහා ඉටුකළ ක්‍රියාකාරකම් | මිනුම් දර්ශකය | සාධනය | ආදායම (රු.) |
|---|---|---|---|---|
| G11 | **කාර්මික තොරතුරු ප්‍රචාරණය** | | | |
| | විමසුම් සහ පිළිතුරු සේවාව | ප්‍රශ්න ගණන | 917 | 92,769 |
| | **ප්‍රකාශන දෙපාර්තමේන්තුව** | | | 220,025 |
| | සිංහල භාෂාවෙන් මුද්‍රිත පත්‍රිකා | | 15 | |
| | දෙමළ භාෂාවෙන් මුද්‍රිත පත්‍රිකා | | 15 | |
| | අලුතින් ලබාගෙන ඇති ප්‍රකාශන | | 12 | |
| | ආහාර ආකලන ප්‍රකාශණය | | 01 | |
| | දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම | | | |
| | ''කර්මාන්තයක් ආරම්භ කරන්නේ | | 01 | |
| | කෙසේද'' දෙමළ භාෂාවට | | 01 | |
| | පරිවර්තනය කිරීම | | 01 | |
| | ''යෝගට්'' අත්පත්‍රිකාව | | | |
| | දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම | | | |
| | කා.සං.ම. ප්‍රකාශනවල සූචි සකස්කිරීම | | | |
| | **වැඩිදියුණු කරන ලද නිෂ්පාදන අත්පත්‍රිකා** | වැඩසටහන් සංඛ්‍යාව | 01 | |
| | යෝගට් | | 01 | |
| | නූඩ්ල්ස් | | 01 | |
| | ජෑම් | වැඩසටහන් සංඛ්‍යාව | 01 | |
| | කෝඩියල් | | 01 | |
| | පපඩම් | | 01 | |
| | විනාකිරි | | | |

| | | | | |
|---|---|---|---|---|
| | **පුස්තකාලය එස් 5 ක්‍රමය අනුව සකස්කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම**<br><br>**විශ්වවිද්‍යාල සිසුන් සඳහා දැනුවත්කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම** | | 01<br><br>01 | |
| එකතුව | | | | **1,216,540** |

**4.8** තාක්ෂණ සේවා අංශය

**සාමාන්‍ය**

ශ්‍රී ලංකාවේ කර්මාන්ත ප්‍රජාවේ තාක්ෂණික අවශ්‍යතාවයන් සපුරා දෙනු ලබන තාක්ෂණික සේවා අංශය කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ප්‍රධාන අංශ වලින් එකක් වේ. ව්‍යවසායකයින්ට සිය ව්‍යාපාර සැලසුම් සකස් කිරීම හරහා ආරම්භයේ සිට ක්‍රියාත්මක කිරීම දක්වාත්, පවතින ව්‍යාපාර පුළුල් කිරීම, නවීකරණය කිරීම, විවිධාංගීකරණය කිරීම සහ තත්ත්වය සහ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සඳහාත් අවශ්‍ය කරන තාක්ෂණික සහාය සපයාදීම තාක්ෂණික සේවා අංශයේ මූලික අරමුණ වේ. තාක්ෂණ සේවා අංශය මගින් සපයනු ලබන සේවාවන් ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ පරිගණක තාක්ෂණය යන උප අංශ පහ හරහා සපයනු ලබයි. තාක්ෂණ සහාය සපයාදීම ප්‍රධාන වශයෙන්ම හොඳින් සැලසුම්කළ ප්‍රායෝගික කොටසක් ද සහිත එක් දින තාක්ෂණය සපයාදීමේ වැඩමුළු හරහා සිදු කරනු ලැබේ. එයට අමතරව, මෑතකදී ආරම්භ කරන ලද කර්මාන්ත විද්‍යාපීඨය මගින් ඉහත සඳහන් කළ ක්ෂේත්‍ර ආවරණය වන සහතිකපත්‍ර පාඨමාලා ගණනාවක් පවත්වයි.

කාර්මික සංවර්ධන මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය සහ රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය තාක්ෂණ සේවා අංශය සමග ඒකාබද්ධ කරන ලදී.

එබැවින්, තාක්ෂණ සේවා අංශයෙහි විෂය පථය යටතෙහි ඇති ප්‍රධාන තාක්ෂණ අංශ සහ මධ්‍යස්ථාන පහත සඳහන් පරිදි වේ:

**තාක්ෂණ අංශ:** ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, ගොඩනැගිලි ද්‍රව්‍ය, පරිගණක තාක්ෂණ, රබර් නිෂ්පාදන, සහ පාවහන් සහ සම්භාණ්ඩ

මධ්‍යස්ථාන සමග අංශ: තොරතුරු කුටිය සහ තොරතුරු තාක්ෂණ ඒකකය ද ඇතුළත් ප්‍රධාන කාර්යාලය, කටුබැද්ද; සම්භාණ්ඩ සංවර්ධන මධ්‍යස්ථානය, කටුබැද්ද; සහ රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය, පැලියගොඩ.

**කාර්යසාධන ජයග්‍රහණ**

තාක්ෂණික සේවා අංශය විසින් එහි කාර්යයන් ඉටුකිරීමේදී 2011 වර්ෂයේ සංයුක්ත සැලැස්ම සැළකිල්ලට ගෙන ව්‍යවසායකයින් වීමට සිටින පුද්ගලයින්ගේ විශේෂිත අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සහ කා.සං.ම. ප්‍රමිතිය වැඩිදියුණු වන ආකාරයට එහි ප්‍රධාන ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත.

වගු අංක **4.8.1** – 2013 වර්ෂයේදී පහසුකම් සලසන ලද සහ සපයාදෙන ලද සේවාවලින් උපයාගත් ආදායම

| **තාක්ෂණ අංශය සහ මධ්‍යස්ථානය** | | **දළ ආදායම (රු.)** |
|---|---|---|
| 1 | ප්‍රධාන කාර්යාලය - තාක්ෂණ සේවා අංශය | 4,756,348.79 |
| 2 | රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය | 26,993,006.00 |
| 3 | සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය | 5,432,747.00 |
| එකතුව | | **36,182,101.79** |

තාක්ෂණ සේවා අංශය විසින් 2013 වර්ෂයේදී ඉටුකරන ලද කාර්යයන් පහත සඳහන් පරිදි වේ:

**G1a.12 පවත්වන ලද කාර්මික පුහුණු වැඩසටහන් සහ තාක්ෂණ නිදර්ශණ වැඩමුළු.**

- **තාක්ෂණය ලබාදීමේ එක්දින වැඩමුළු (Tech 4 SMEs)**

තාක්ෂණ සේවා අංශය විසින් කාර්මාන්ත විශේෂඥයින්, විද්වතුන් සහ කා.සං.ම. නිලධාරීන් සමග එක්ව තාක්ෂණික සේවා අංශයෙහිදී ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, සහ ගොඩනැගිලි ද්‍රව්‍ය යන උප අංශ යටතේ වැඩමුළු 46 ක් පවත්වන ලද අතර එම වැඩමුළු හරහා කර්මාන්තකරුවන් 423 දෙනෙකුට අධික පිරිසක් සඳහා පුහුණුව සහ සහයෝගය ලබාදෙමින් රු.1,326,000/- ක මුදලක් උපයාගෙන ඇත. මෙම අනාගත කර්මාන්තකරුවන්ට තාක්ෂණ සේවා අංශය විසින් හඳුන්වාදෙන ලද නව සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධන මෙවලමක් වන කා.සං.ම. වෙබ්අඩවියෙහි සපයාදී ඇති අන්තර්ජාලගත ලියාපදිංචිවීමේ ක්‍රමවේදය හරහා මගපෙන්වීම සිදු කරන ලද අතර 2013 වර්ෂයේදී එමගින් බාගත කර ගැනීම් 2,665 ක් සිදු කර ගෙන ඇත.

- **බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා තාක්ෂණය ලබාදීමේ වැඩසටහන්**

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මීගමුවේ පිහිටි තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයෙහි නිලධාරීන් සඳහා 2013 සැපතැම්බර් සහ ඔක්තෝබර් යන මාසවලදී තාක්ෂණ පුහුණු වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. රබර් මිශ්‍ර කොහු මෙට්ට නිෂ්පාදනය, ඉටිපපන්දම් සෑදීම, හඳුන්කූරු සහ රෙදි සෝදන සබන් නිෂ්පානය එසේ පවත්වන ලද වැඩසටහන් අතර විය. මෙම වැඩසටහන්වලට සහභාගීවූවන්ගේ සංඛ්‍යාව 42 ක් වන අතර එමගින් උපයාගත් ආදායම රු.69,200/- ක් විය.

- **සමාජ සේවා දෙපාර්තමේන්තුව සඳහා තාක්ෂණය ලබාදීමේ වැඩසටහන්**

සීදුව වෘත්තීය පුහුණු ආයතනයෙහිදී සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණුකරුවන් දෙදෙනෙකු සඳහා ඉටිපන්දම් නිෂ්පානය පිළිබඳ තාක්ෂණය ලබාදීමේ වැඩසටහනක් පවත්වන ලද අතර එයින් උපයාගත් ආදායම රු.19,750/- ක් විය.

**වගු අංක 4.8.2 - තාක්ෂණ අංශ විසින් පවත්වන ලද වැඩමුළු පිළිබඳ සාරාංශය - ප්‍රධාන කාර්යාලය**

| | වැඩමුළුවෙහි නම | පුහුණු කරන ලද සංඛ්‍යාව |
|---|---|---|
| 01 | **ආහාර අංශය** | |
| | ක්ෂණික පළතුරු බීම සහ කෝඩියල් | 17 |
| | යෝගට් | 25 |
| | රසකැවිලි | 12 |
| | අයිස් ක්‍රීම් | 5 |
| | සුළු කෑම වර්ග | 6 |
| | කුළුබඩු සැකසුම් කිරීම | 2 |
| | පපඩම් | 4 |
| | යෝගට් පානය සහ මුදවපු කිරි | 8 |
| | කෝඩියල් | 2 |
| | කෝඩියල් (ජෙල්ලි / මිදි) | 4 |
| | **වැඩසටහන් සංඛ්‍යාව** | **10** |
| | **සහභාගිවන්නන් සංඛ්‍යාව** | **85** |
| 02 | **රසායනික ද්‍රව්‍ය අංශය** | |
| | බෝතල් කළ පානීය ජලය | 47 |
| | ඩිටර්ජන්ට් (කුණු ඉවත්කරන ද්‍රව්‍ය) තාක්ෂණය | 25 |
| | ඉටිපන්දම් | 37 |
| | රෙදිසෝදන සබන් නිපදවීම | 13 |
| | හඳුන්කූරු නිපදවීම | 14 |
| | **වැඩසටහන් සංඛ්‍යාව** | **05** |
| | **සහභාගිවන්නන් සංඛ්‍යාව** | **136** |

| | | |
|---|---|---|
| 03 | **තෙල් සහ කෙඳි අංශය** | |
| | අතින් නිපදවන කඩදාසි | 2 |
| | අභ්‍යාස පොත් සහ ලියුම් කවර සෑදීම | 24 |
| | **වැඩසටහන් සංඛ්‍යාව** | **02** |
| | **සහභාගිවන්නන් සංඛ්‍යාව** | **26** |
| 04 | **ගොඩනැගිලි ද්‍රව්‍ය අංශය** | |
| | සිමෙන්ති ගල් සහ බිමට අල්ලන ගල් | 188 |
| | ෆයිබර් ග්ලාස් තාක්ෂණය | 20 |
| | මෘදු දැව පිරියම් | 5 |
| | ඩොලමයිට් පොහොර | 1 |
| | සිමෙන්ති ස්ථායිකළ මැටිගල් | 1 |
| | සිමෙන්ති මල්පෝච්චි | 5 |
| | **වැඩසටහන් සංඛ්‍යාව** | **06** |
| | **සහභාගිවන්නන් සංඛ්‍යාව** | **220** |
| | **එකතුව වැඩසටහන් සංඛ්‍යාව** | **23** |
| | **එකතුව සහභාගිවන්නන් සංඛ්‍යාව** | **467** |

තාක්ෂණ සේවා අංශයෙහිදී සහ ඉන් පිටතදී පවත්වන ලද එක්දින තාක්ෂණ පුහුණු වැඩසටහන් හරහා සමස්ත ලෙස පුද්ගලයින් 467 දෙනෙකු පුහුණු කර සහයෝගය ලබා දෙන ලද අතර එමගින් උපයාගත් ආදායම රු. 1,414,950/- ක් වේ.

## G1a.13 සපයා දෙන ලද තාක්ෂණික සහාය, උපදෙස් සහ උපදේශණ සේවාවන්

**බෝරෝන් ප්‍රතිකාර ද්‍රාවණය අලෙවි කිරීම**

කර්මාන්ත ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව තාක්ෂණ සේවා අංශය විසින් දැව පරීක්ෂා කිරීම සඳහා බෝරෝන් ප්‍රතිකාර ද්‍රාවණය අලෙවි කිරීම වැනි උපකාරක සේවා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වෙත සපයා දී ඇත. බෝරෝන් ප්‍රතිකාර ද්‍රාවණය අලෙවි කිරීමෙන් උපයාගත් ආදායම රු.51,000/- ක් විය.

**ශ්‍රී ලංකාව තුළ රසායනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීම පිළිබඳ ජාතික කාර්යසාධක බලකායෙහි සාමාජිකයකු ලෙස**

ලෝක සෞඛ්‍ය සංවිධානයෙහි සීඝ්‍ර ආරම්භය වැඩසටහන් භාරකාර අරමුදලෙහි ජාතික නියමු ස්ථාන ලේකම් කාර්යාලය ලෙස මධ්‍යම පරිසර අධිකාරිය විසින් ශ්‍රී ලංකාව තුළ රසායනික ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික කාර්යසාධක බලකායක් පිහිටුවීම සඳහා වන සංසදයක් මාර්තු මාසයේදී සංවිධානය කළේය. මෙම ව්‍යාපෘතියෙහි "කාර්මික නිෂ්පාදන අංශ රසායනික ද්‍රව්‍ය ක්‍රියාකාරී කණ්ඩායමෙහි" සාමාජිකයෙකු ලෙස කාර්මික සංවර්ධන මණ්ඩලය නියෝජනය කරමින් තාක්ෂණ සේවා අංශය මෙම සංසදයට සහභාගී වූ අතර, එය ශ්‍රී ලංකාව තුළ රසායනික ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික කාර්ය සාධක බලකායෙහි කණ්ඩායම් නායකයින් අට දෙනාගෙන්

එක් අයෙකු ලෙස පත් කරනු ලැබ ඇත. ශ්‍රී ලංකාව තුළ **"රසායනික ද්‍රව්‍ය පූර්ණ ලෙස කළමනාකරණය කිරීම"** සඳහා ජාතික සැලසුම් සම්පාදනය කිරීමේ වගකීම මෙම ජාතික කාර්යසාධක බලකායට පැවරී තිබේ.

**ප්‍රදර්ශනවලට සහභාගීවීම**

- **2013 ඔක්තෝබර් 24** වැනිදා සිට **27** වැනිදා දක්වා ශ්‍රී ලංකා ප්‍රදර්ශන සහ සම්මේලන මධ්‍යස්ථානයෙහිදී පැවති "InFoTEL 2013" ප්‍රදර්ශනයෙහිදී **කාර්මික සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ දැවැන්තයින් අතර සිටි ආයතනයකි. මෙම ප්රදර්ශනය විසින් කා.සං.ම. වෙබ් අඩවිය, කාර්මික විද්‍යාපීඨ ෆේස් බුක් පිටුව සහ** You Tube **වීඩියෝ මගින් ප්‍රවේශ විය හැකි සිය "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධන සේවා" ප්‍රදර්ශනය කිරීම සඳහා වේදිකාවක් කා.සං.ම. වෙත සපයා දුන්නේය.**

**කාර්මික විද්‍යාපීඨය මගින් පවත්වනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව**

පරිගණක දෘඩාංග පාඨමාලාවේ 14 වැනි කණ්ඩායමෙහි සහ පරිගණක ජාලකරණය සහ ආරක්ෂාව පාඨමාලාවේ දෙවැනි කණ්ඩායමෙහි අවසන් විභාග ජනවාරි මාසයේදී නිම කරන ලද අතර පරිගණක දෘඩාංග පාඨමාලාවෙහි 15 වැනි කණ්ඩායම සිසුන් 06 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලදී. එයින් උපයාගත් ආදායම රු. 126,000**/-** ක් විය.

**වගු අංක** 4.8.3 – **2013 වර්ෂයේදී කාර්මික විද්‍යාපීඨය විසින් පවත්වන ලද පාඨමාලාවන්හි සාරාංශය**

| පාඨමාලාවේ නම | | **2013** බඳවාගැනීම | සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | තීන්ත සහ ආලේප තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 12 | 10 |
| 02 | විලවුන් තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 06 | 06 |
| 03 | කුළුබඩු සැකසුම් තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 05 | 05 |
| 04 | පරිගණක දෘඩාංග සහ ව්‍යවසායකත්වය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 06 | 02 |
| එකතුව | | **29** | **23** |

G12.5 **කා.ස.මං. වෙබ් අඩවියේ සමාජිකයින්ගේ අවකාශයේ සුදුසු ලෙස සංස්කරණය කළ සහ ආකෘති යළි සකසන ලද පසුගිය සමීක්ෂණ, වෙළඳපොළ සහ තාක්ෂණික වාර්තා, තොරතුරු ආදිය පළකිරීම.**

කා.සං.මං. වෙබ් අඩවිය මගින් කර්මාන්තකරුවන්ගේ ව්‍යාපාර ආශ්‍රිත කරුණු ඇතුළත් ලිපි අඩංගුවන, 80 ට අධික ලිපි සංඛ්‍යාවක් සහිත සාමාජික අවකාශයකට පහසුකම් සලසා තිබේ. කර්මාන්ත ලියාපදිංචි කිරීම් අලුත්කිරීමෙන් උපයාගත් ආදායම රු.11,000/- ක් විය.

වගු අංක **4.8.4 -** ආදායම් සාරාංශය -2013

| යොමු අංකය | ක්‍රියාකාරකම | ආදායම (රු.) |
|---|---|---|
| G1a.9 | තාක්ෂණ සහ අදාළ අනෙකුත් සහාය සපයා දෙමින් නව ව්‍යාපාර ආරම්භ කිරීම සහ නව ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම: කෙසෙල් කෙඳි ව්‍යාපෘතිය සහ LIBCOS කිරිපට්ටි ව්‍යාපෘතිය. | 1,613,631.98 |
| G 1a.10 | තිබෙන ව්‍යාපාර වැඩිදියුණු කිරීම / පුළුල් කිරීම / නවීකරණය කිරීම සඳහා තාක්ෂණික සහ අදාළ අනෙකුත් සහාය සපයාදීම | 3,000.00 |
| G1a.12 | තාක්ෂණික පුහුණු වැඩසටහන්, තාක්ෂණය ලබාදීමේ නිදර්ශන සහ වැඩමුළු පැවැත්වීම | 1,414,950.00 |
| G 1a.13 | තාක්ෂණික සහාය, උපදෙස් සහ උපදේශන සේවා සැපයීම<br>බෝරෝන් ප්‍රතිකාර ද්‍රාවණය අලෙවි කිරීම සහ තාක්ෂණ පැකේජ අලෙවිකිරීම | 52,500.00 |
| G 1a.23 | සහතික කිරීම් ලබාගැනීම සඳහා ව්‍යාවසායකයින්ට සහායවීම: SWITCH Asia ව්‍යාපෘතිය | 1,132,266.81 |
| G 1b.3 | ව්‍යාවසායකයින් සඳහා වාණිජ සහ තාක්ෂණික පුහුණුව සපයාදීම<br>පරිගණක දෘඩාංග පුහුණුව<br>කාර්මික විද්‍යාපීඨ සහතිකපත්‍ර පාඨමාලාව | <br>126,000.00<br>403,000.00 |
| G 12.5 | කා.සං.ම. වෙබ් අඩවියේ පළකිරීම සඳහා එක්රැස් කර ඇති කර්මාන්තකරුවන් පිළිබඳ තොරතුරු එකතුව කා.සං.මං. වෙබ් අඩවියේ සාමාජික අවකාශයේ පළකිරීම | 11,000.00 |
| මුළු ආදායම | | 4,756,348.79 |

## රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය

රබර් ආශ්‍රිත දේශීය කර්මාන්ත සඳහා, විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා සහාය ලබාදීම පිණිස ලෝක බැංකුවේ මග පෙන්වීම සහ මූල්‍ය සහයෝගය යටතේ 1980 වර්ෂයේදී රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය පැලියගොඩදී පිහිටුවන ලදී. එතැන් සිට මෙම මධ්‍යස්ථානය මගින් දේශීය රබර් නිෂ්පාදන කර්මාන්තකරුවන්ට සේවා සපයා දෙමින් සිටියි. දීර්ඝ කාලීනව රබර් පදනම් කරගත් කර්මාන්තවල යෙදී සිටින, මෙම මධ්‍යස්ථානයේ නිත්‍ය පාරිභෝගිකයින් වන කර්මාන්තකරුවන් 200 ට ආසන්න පිරිසක් සිටින අතර ඔවුන් මෙම මධ්‍යස්ථානයෙන් පහත සඳහන් ආකාරයේ සේවාවන් ලබා ගනිති.

- තාක්ෂණික උපදේශණ සහ ව්‍යාප්ති සේවා
- නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය

- පරීක්ෂණ සහ තත්ත්ව සහතික කිරීම
- අර්ධ-වාණිජමය සේවා සැපයීම
- නව වෙළඳපොළ අවශ්‍යතාවලට හැඩගැසීම
- අධ්‍යයන සහ පර්යේෂණ හා සංවර්ධන ආයතන සහ පොදුවේ කර්මාන්ත අතර සම්බන්ධකයක් ලෙස කටයුතු කිරීම

2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබන නව ආයතනික සැලැස්ම (2011-2013) අනුව, මෙම අංශයේ 2013 වර්ෂයේ කාර්යසාධනය පහත සඳහන් පරිදි වේ:

වගු අංක **4.8.5 –** රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානයේ කාර්යසාධනය

| ආයතනික අරමුණ | ආයතනික අරමුණ ඉටු කර ගැනීමේ ක්‍රියාකාරකම | | මිනුම් දර්ශකය | කාර්යසාධනය |
|---|---|---|---|---|
| **G1a.** කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම | 8 | ස්වයං රැකියා ඒකක නිර්මාණය කර ආරම්භකිරීම | ඒකක ගණන | 16 |
| | 9 | නව කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පිහිටුවා ක්‍රියාත්මක කිරීම | ඒකක ගණන | 2 |
| | 10 | පවතින කර්මාන්ත / ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වැඩිදියුණු කිරීමට සහාය සපයාදීම | ඒකක ගණන | 29 |
| | 12/14 | තාක්ෂණික පුහුණු සහ තාක්ෂණය ලබාදීමේ වැඩසටහන්, නිදර්ශන සහ වැඩමුළු පැවැත්වීම; ඊමේල් / ජනමාධ්‍ය සහ වෙබ් අඩවියේ පොදු අවකාශය හරහා සපයන සේවා ප්‍රවර්ධනය කිරීම. | | |
| | (i) | තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | 24 |
| | (ii) | පුහුණුලාභීන්ගේ අවශ්‍යතාවයට අනුව සකස්කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන් සංඛ්‍යාව | 01 |
| **G1b.** ව්‍යවසායකයින් | **7.** | ව්‍යවසායකයින් සඳහා අලෙවිකරණය, තාක්ෂණය, මූල්‍යය, කළමනාකරණය, නිෂ්පාදනය ආදිය පිළිබඳ උපදේශනය සහ උපදේශකත්වය සපයාදීම. | | |

| | | | | |
|---|---|---|---|---|
| පුහුණු කිරීම, සංවර්ධනය කිරීම සහ උපදේශණය සපයාදීම | (i) | තාක්ෂණික සහාය සහ උපදේශකත්වය | ව්‍යවසායකයින් සංඛ්‍යාව | 95 |
| **G9.** ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් ලබාදීම ද ඇතුළත්ව කර්මාන්ත ව්‍යාපාර සඳහා අවශ්‍ය සියලුම සේවා සහ පහසුකම් සැපයීම | **4.** | රබර් නිෂ්පාදන සහ සංයෝග සකස්කිරීමේ පහසුකම් සපයාදීම | | |
| | (i) | නිෂ්පාදන සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම | වැඩ සංඛ්‍යාව | 53 |
| | | | කර්මාන්ත සංඛ්‍යාව | 45 |
| | (ii) | උප-කොන්ත්‍රාත්තුමය ඇණවුම් සඳහා පහසුකම් සැලසීම | වැඩ ඇණවුම් සංඛ්‍යාව | 7 |
| | (iii) | තත්ත්ව පරීක්ෂණ සහ සහතික කිරීම් සපයාදීම | සහතිකකිරීම් සංඛ්‍යාව | 89 |
| | | | පරීක්ෂා කරන ලද සාම්පල සංඛ්‍යාව | 2,129 |
| | | | සේවා සපයන ලද කර්මාන්ත සංඛ්‍යාව | 10 |
| | 13.4 | නිෂ්පාදන වැඩ ඇණවුම් භාරගැනීම | නිෂ්පාදන වැඩ ඇණවුම් සංඛ්‍යාව | 18 |

රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානයේහි සියලුම ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් මගින් උපයාගත් ආදායම පහත සඳහන් වගුවේ දක්වා ඇත:

වගු අංක **4.8.6 –** රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානයේ ආදායම

| ආයතනික අරමුණු | ආදායම් උත්පාදනය: අමුද්‍රව්‍ය පිරිසැකසුම් කිරීම සහ සැපයීම, නියැදි පරීක්ෂාකිරීම සහ සහතිකකිරීම, අර්ධ-නිමි සහ නිමි නිෂ්පාදන ආදිය. | | **ප්‍රමාණය** | ආදායම (රු.) |
|---|---|---|---|---|
| **G1a.12, 14, 25, G9.4, 9.5,** සහ **G.13.2, 13.3, 13.4** ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් ලබාදීම ද ඇතුළත්ව | (i) | ස්වාභාවික සහ කෘතිම රබර් සංයෝග සහ රසායනික ද්‍රව්‍ය | කි.ග්‍රෑ. 38,921 | 21,220,078 |
| | (ii) | රබර් සංයෝග ඇඹරීම | කි.ග්‍රෑ. 17,341 | 336,607 |
| | (iii) | කේන්ද්‍රඅපසාරික රබර්කිරි සහ සංයෝගය | ලීටර් 11,147 | 3,758,666 |
| | (iv) | උප කොන්ත්‍රාත් දීම | 07 | 923,209 |
| | (v) | තත්ත්ව පාලනය සහ රසායනාගාර පරීක්ෂණ | | |
| | | සහතික නිකුත් කිරීම | 89 | 455,996 |
| | | නිෂ්පාදන සාම්පල පරීක්ෂා කිරීම | 2,129 | |
| | (vi) | නිෂ්පාදන සංවර්ධන සේවා | 53 | 44,685 |

| | | | | |
|---|---|---|---|---|
| කාර්මික කාර්යයන් සඳහා අවශ්‍ය සියලුම සේවා සහ පහසුකම් සැපයීම | (vii) | පුහුණුලාභීන්ගේ අවශ්‍යතාවයට අනුව සකස් කරන ලද පුහුණු පහසුකම් සපයාදීම | 01 | 11,600 |
| | (viii) | නිෂ්පාදන වැඩ ඇණවුම් භාරගැනීම | 18 | 47,483 |
| | (ix) | තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් | 24 | 194,682 |
| **එකතුව** | | | | **26,993,006** |

## සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධනය කිරීමේ මධ්‍යස්ථානය

ශ්‍රී ලංකාවේ සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් කර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා 1998 වර්ෂයේදී සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවන ලදී. මෙම මධ්‍යස්ථානය විසින් කෙටිකාලීන සහ දිගුකාලීන පාඨමාලා පැවැත්වීම, පුහුණු කම්කරුවන් සැපයීම, සුදුසු තාක්ෂණික තොරතුරු සපයාදීම සහ පාවහන් නිෂ්පාදනය සහ සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් සපයාදීම ආදී සේවාවන් සපයනු ලබයි. මෙහි ප්‍රධාන මධ්‍යස්ථානය මොරටුව, කටුබැද්දෙහි පිහිටා ඇති අතර වාරියපොළ සහ විතාරන්දෙනිය යන නගරවල ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිහිටුව ඇත.

මෙ මධ්‍යස්ථානය මගින් සපයාදෙනු ලබන සේවාවන් පහත සඳහන් පරිදි වේ:

- පාවහන් නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණය ලබාදීමේ වැඩමුළු පැවැත්වීම
- සම්භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණය ලබාදීමේ වැඩමුළු පැවැත්වීම
- පාවහන් සැලසුම් කිරීම සහ මෝස්තර සැකසීම
- නව නිෂ්පාදන සහ නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ නවෝත්පාදන අදහස් සහ තොරතුරු සපයාදීම
- වෙළඳ සහ යන්ත්‍රසූත්‍ර තොරතුරු සපයාදීම
- ඉන්කියුබේටර් පහසුකම් සපයාදීම
- කර්මාන්තය සඳහා පුහුණු ශ්‍රමිකයින් සපයාදීම
- පුහුණු සහ කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

    - සැලසුම් සහ මෝස්තර සකස් කිරීම
    - පාවහන්වල ඉහළ වැස්ම
    - කාන්තා පාවහන් නිෂ්පානය
    - පිරිමි පාවහන් නිෂ්පාදනය
    - සම් භාණ්ඩ නිෂ්පාදනය

**මධ්‍යස්ථානයේ පහත සඳහන් පහසුකම් ලබාගැනීමට ඇත:**

- සම් කැපීමේ යන්ත්‍ර
- පැලුම් යන්ත්‍ර
- සම් පටිකැපීමේ යන්ත්‍ර
- හැඩ කැපීමේ යන්ත්‍ර
- සම්පීඩනය කිරීමේ සහ දියර විදීමේ කාමරය
- ඔපකිරීමේ සහ නිමාව ගැනීමේ යන්ත්‍ර
- පාවහන්වල අඩිය තද කිරීමේ යන්ත්‍ර
- ප්‍රතික්‍රියක යන්ත්‍ර

වගු අංක 4.8.7 – සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානයේ කාර්යසාධනය

| ආයතනික අරමුණ | ආයතනික අරමුණ ඉටු කර ගැනීමේ ක්‍රියාකාරකම් | | මිනුම් දර්ශක | කාර්යසාධනය |
|---|---|---|---|---|
| **G1a** කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම | **8.** | ගෘහ-පාදක කර්මාන්ත ආර්ථික ඒකක නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම | | |
| | (i) | ගෘහ-පාදක කර්මාන්ත ආර්ථික ඒකක ක්‍රියාත්මක කිරීම | ඒකක ගණන | 70 |
| | **9.** | නව ව්‍යාපාර ආරම්භ කිරීමට සහ නව ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමට තාක්ෂණික සහ ඒ අදාළ සහාය සපයාදීම | | |
| | (i) | නව පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන ඒකක ස්ථාපිත කිරීම සඳහා සෘජුවම සේවා සපයා දෙන ලදී | ඒකක ගණන | 12 |
| එකතුව | 193,765,041 | **101,999,207** | **130,709,877** | **96,359,276** |

## 26 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිතවූ මුදල්

බදු ගෙවීමට පෙර ලාභය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිතවූ මුදල්වලට සැසඳීම:

| | 2013 | 2012 | 2011 |
|---|---|---|---|
| බදු ගෙවීමට පෙර අලාභය | **(95,048,744)** | (21,833,618) | 23,837,941 |
| **ගැළපීම්:** | | | |
| ක්ෂයවීම | **25,663,385** | 26,621,102 | 26,050,256 |
| මෝටර් වාහන (ප්‍රත්‍යාගණනය) / අවප්‍රමාණය කිරීම | | 1,683,477 | (3,365,343) |
| මූල්‍ය පිරිවැය | **405,180** | 347,150 | 445,211 |
| කාරක ප්‍රාග්ධනයෙහි වෙනස්වීම් | | | |
| - තොග | (4,165,280) | 5,778,777 | (4,857,104) |
| - වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 12,553,891 | (24,026,243) | (23,484,921) |
| - වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | 90,830,071 | (29,162,059) | 33,780,130 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | 26,973,956 | 14,017,513 | (10,422,573) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල්** | **57,212,458** | **(26,573,902)** | **41,983,597** |

# විගණකාධිපති වාර්තාව

# සහ

# මණ්ඩලයේ පිළිතුරු

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT


| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | එල්එස් /එච්/අයිඩීබී/1/13/41 | ඔබේ අංකය / உமது இல. / Your No. | |
| දිනය / திகதி / Date | 2015 ජූලි 20 දින | | |

සභාපති,
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය.

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතේ 38(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2014 දෙසැම්බර් 23 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000-1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

ආයතනය දිගින් දිගටම අලාභ ලැබීම මත 2012 දෙසැම්බර් 31 දිනට පැවැති රු.**289,942,677** ක් වූ ශුද්ධ වත්කම් වටිනාකම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.**168,789,170** ක් දක්වා හීන වීමක් පෙන්නුම් කලද 2014 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද දේපළ පිරියත ප්‍රත්‍යාගණයේ බලපෑම හේතුවෙන් මුළු වත්කම් හා ශුද්ධ වත්කම් වල අගය රු.941,908,020 කින් ඉහල ගොස් තිබුණි.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 | ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී, ස්කන්ධ අයිතම වල ආරම්භක ශේෂයන්ගේ සිදුවන වෙනස්වීම්වලට හේතුවන එක් එක් වසර වලදී ලද රාජ්‍ය ප්‍රදාන, වාර්ෂික ක්‍රමක්ෂය යනාදි අයිතමයන් වෙන් වෙන්ව ඉදිරිපත් කර නොතිබුණි. |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 | පිරිවැය හා උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොග ආගණනය කල යුතු වුවද රු.37,483,282 ක තොග සම්බන්ධයෙන් එවැනි සාධාරණ ඇගැයීමක් කර නොතිබුණි. |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 | ධාරණ අගය රු 243,201,773 ක් වූ දේපළ හා පිරියත ප්‍රත්‍යාගණනයක් සිදුනොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වලින් දේපළ පිරියත සම්බන්ධයෙන් සාධාරණ අගයක් නිරූපණය වී නොතිබුණි. |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18 | ලක්කම් අලවි මධ්‍යස්ථානයේ ආදායම් හඳුනාගෙන ඇත්තේ එම ආදායම උත්පාදනය වන අවස්ථාවේදී නොවන අතර සැපයුම්කරුවන්ට මුදල් බේරුම් කරන අවස්ථාවේදීය. ඒ අනුව ප්‍රමිතියට පටහැනිව එකතුව රු.1,767,589 ක් වූ ආදායම් හඳුනාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 36 | වත්කම් සම්බන්ධ සාධාරණ හානිකරණ දර්ශකයන් (Impairment Indicators) පවතින බව හැඟීයන්නේ නම් හානිකරණය කොට එම වත්කම් සාධාරණ අගයකට මූල්‍ය වාර්තා තුළ නිරූපණය කිරීම සඳහා ප්‍රමාණවත් ගිණුම්කරණ ක්‍රියාමාර්ගයක් අනුගමනය කල යුතු වුවද එකතුව රු.298,144,587 ක් වූ දේපළ පිරියත උපකරණ, අවසන් තොග හා දිගුකාලීන ණයගැති ශේෂ සම්බන්ධයෙන් ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 | සටහන් අංක 2.4.2 පරිදි ණය හා අත්තිකාරම් සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කරන බව සඳහන් කර තිබුණද එකතුව රු.40,356,404 ක් වූ ණය හා අත්තිකාරම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 සහ 39 පරිදි ක්‍රියාකොට සාධාරණ අගයකට නිරූපනය කර නොතිබුණි. |

### 2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කිසියම් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන්නේ නම් එය විනිවිද හා සාධාරණ මූල්‍ය තත්ත්වයක් නිරූපණය කිරීමට ඉවහල් වන හා සංගතව අනුගමනය කළ හැකි ප්‍රතිපත්තියක් විය යුතුය. එහෙත් වසර 05 ක් ඉක්මවන ණයගැතියන් සඳහා සියයට 100 ක අඩමාන ණය වෙන් කිරීමක් හා වසර 05ට අඩු සියළු ණයගැතියන් සඳහා සියයට 10 ක වෙන් කිරීමක් කර තිබුණි.

(ආ) වත්කම් ප්‍රාග්ධනිත කිරීමට අදාලව උචිත ගිණුම්කරණ ප්‍රතිපත්තියක් කළමනාකරණය විසින් සකස් කිරීමකින් තොරව ප්‍රමාණාත්මක නොවන, වටිනාකම අඩු අගයන් සහිත අයිතම ප්‍රාග්ධනිත කර තිබුණි.

### 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් මිළදී ගැනීම හා වියදම් සඳහා දරන ලද රු. 3,191,492 ක්, කලින් ගෙවීම් ගිණුම තුළ රඳවා තැබීම නිසා වත්කම් ඌණ ගණනයක් සිදුවී තිබෙන අතර, වියදම් හඳුනා නොගැනීම නිසා ලාභය අධිගණනය වී තිබුණි.

### 2.2.5 අසම්භාව්‍ය බැරකම්

මණ්ඩලයට එරෙහිව සේවකයන් හා කර්මාන්තකරුවන් විසින් පවරා ඇති නඩු 20 ක් සම්බන්ධයෙන් රු.4,406,388 ක් අසම්භාව්‍ය බැරකම් සඳහා ප්‍රතිපාදනය කර තිබුණ ද විධිමත් වෘත්තීය විනිශ්චයන් මත පදනම්ව එය සිදුකර නොතිබුණි.

### 2.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.61,704,896ක ණයගැති ශේෂයෙන් රු.47,265,947 ක් නියෝජනය වන්නේ වසරක් ඉක්මවූ ශේෂයන් වන අතර, එයින් රු.34,091,170 ක් වසර 05 ක් ඉක්මවූ ශේෂයන් නිරූපණය විය. මෙම ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් සාධාරණ උත්සාහයක් ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය, රු.95,048,744 ක ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේදී එය රු.21,833,618ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.73,215,126ක පිරිහීමක් දක්නට ලැබුණි. එමෙන්ම 2013 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ කාරක ප්‍රාග්ධනය රු.110,896,947 වූ අතර ඉකුත් වර්ෂයට අනුරූපීව එය රු.138,109,179 ක පිරිහීමක් පෙන්නුමක් බව නිරීක්ෂණය විය.

### 3.2 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම්

සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම් රු.මිලියන 481ක් වූ අතර පසුගිය වර්ෂයේ එය රු.මිලියන 355කි. එම වියදම් ඉහලයාම කෙරෙහි සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා වෙන් කිරීම්, බොල්ණය සඳහා වෙන් කිරීම්, ප්‍රදර්ශන වියදම් හා පුහුණු කිරීමේ වියදම් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

එක් එක් අංශ විසින් ඉටුකල ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ප්‍රාදේශීය සංවර්ධන අංශයට අදාළ ව්‍යාපෘති 03 ක් සහ ක්‍රියාකාරකම් 06 ක ප්‍රගතිය පරීක්ෂා කිරීමට සාක්ෂි නොතිබුණි. තවද අනෙකුත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සියයට 60 සිට 29 දක්වා පරාසයක පැවතුණි.

(ආ) රබර් අංශයට අයත් ක්‍රියාකාරකම් 7 ක් වර්ෂය තුළ කිසිදු ආකාරයකින් හෝ ඉටුකර නොතිබුණි. එමෙන්ම ඉටුකරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සියයට 13 සිට සියයට 148 දක්වා වූ පරාසයක පැවතුණි.

(ඇ) අලෙවි අංශයට අයත් ක්‍රියාකාරකම් 51 ක් වර්ෂය තුළ ඉටුකර නොතිබුණි.

(ඈ) සැලසුම් අංශයෙහි ප්‍රගති වාර්තා 2013 මැයි දක්වා පමණක් පිළියෙල කර තිබු බැවින් ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඉ) මුදල් හා පරිපාලන අංශවල ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබු බැවින් ප්‍රගතිය පරීක්ෂා කල නොහැකි වූ අතර තාක්ෂණික සේවා අංශයෙහි ප්‍රගතිය සංඛ්‍යාත්මක වශයෙන් දක්වා නොතිබීම නිසා පරීක්ෂා කළ නොහැකි විය. කාර්මික ජනපද අංශයෙහි ක්‍රියාකාරකම් 3 ක් වර්ෂය තුල ඉටුකර නොතිබුණි. තවද ඉටුකර ඇති සමහර ක්‍රියාකාරකම් පිළිබඳ පරීක්ෂා කිරීමේදී පිහිටුවා ඇති ඉලක්කයන් තාත්වික නොවන බවද නිරීක්ෂණය විය.

### 4.2. කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) අබලි අංශය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියේ අරමුදල් වෙනත් කටයුතු වලට මාරුකල නොහැකි වුවද දැයට කිරුළ ප්‍රදර්ශනයේ රාජකාරි වෙනුවෙන් දරන ලද ගමන් වියදම් හා අතිකාල සඳහා රු.416,641ක්, අනියම් සේවක වැටුප් ගෙවීම සඳහා රු. 7,000,000 ක් සහ දිරි දීමනා සඳහා රු. 500,000 ක් හා සුභසාධක සංගමයට රු. 60,000 ක් ලබා දී තිබුණි.

(ii) අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියේ අරමුණ වනුයේ විවිධ රාජ්‍ය ආයතනයන්ගෙන් මිලදී ගන්නා අබලි ද්‍රව්‍ය සහන මිලකට කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට අලෙවි කිරීම වුවද 2013 ජනවාරි සිට මැයි දක්වා වූ රු. 18,404,967 ක විකුණුම් වලින් සියයට 20ක් අලෙවි කර ඇත්තේ ගැනුම්කරුවන් දෙදෙනෙකු වෙත පමණක් වූ බැවින් කුඩා කර්මාන්තකරුවන් නඟා සිටුවීමේ ව්‍යාපෘති අරමුණ ඉටුවී නොමැති බව නිරීක්ෂණය විය.

(iii) පිරිවැය රු.2,800,922 ක් වූ සත්‍යාපනය නොකරන ලද අයිතම 13 ක් අවසන් තොගයට ඇතුළත් කර තිබුණි. එමෙන්ම භෞතික තොග සත්‍යාපනයේදී තොග ඌනතා හා අතිරික්තතා හඳුනාගෙන තිබූ අතර සමීක්ෂණ කමිටුවෙන් ඒ සඳහා කිසිදු නිර්දේශයක් ලබාදී නොතිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) මණ්ඩලය විසින් බාහිර පාර්ශවයන් වෙත ඉටුකරන විවිධ කාර්යයන් වලට අදාළව, ගණනය කරන ලද පිරිවැය තුළ පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) පිරිවැය අත්පොත් භාවිතයක් නොමැතිවීම.
(ii) පිරිවැය මූලිකාංග සඳහා යොදා ගන්නා පදනම් යල්පැන තිබීම.
(iii) පිරිවැය ගණනය කිරීමේදී ඇතැම් පිරිවැය වර්ග අදාළ වන නමුත් ඒවා අදාල පිරිවැය ලෙස සැලකිල්ලට ගෙන නොතිබීම.
(iv) පිරිවැය ඇස්තමේන්තුකරණයේදී සාමාන්‍ය හානි හඳුනා නොගැනීම.
(v) ඇස්තමේන්තුගත පිරිවැය හා සත්‍ය පිරිවැය සසඳා පිරිවැය විචලනයන් හඳුනා නොගැනීම.
(vi) පිරිවැය ගිණුම් තැබීමක් සිදු නොවීම.
(vii) මණ්ඩලය භාවිතා කරන කල්පත්‍ර තුළ යන්ත්‍ර කාලය අපැහැදිලි ලෙස සටහන් වීම.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

ජංගම ගිණුම් 07ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.10,155,405 ක් හා ඉතිරි කිරීමේ ගිණුම් 03 ක් තුළ රු.23,065,453 ක ශේෂයක් පැවති අතර, එය ඵලදායි ආයෝජන මාර්ගයක යොදවා නොතිබුණි.

## 4.5 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පිරිවැය රු.4,454,473 ක් වූ මුද්‍රණ යන්ත්‍ර 05 ක් සමාලෝචිත වර්ෂය තුළ නිශ්කාර්යව පැවතුණි.

(ආ) 2009 වර්ෂයේදී රු.7,950,000 කට මිලදී ගන්නා ලද ජංගම තාක්ෂණ බස් රථය පසුගිය වර්ෂ කීපය තුල ඌන උපයෝජන මට්ටමක පැවති අතර සමාලෝචිත වර්ෂය තුළදී එය භාවිතයට ගෙන නොතිබුණි.

(ඇ) රු. මිලියන 18.7 ක් වැයකර තාක්ෂණ සේවා අංශයේ රසායනාගාර පහසුකම් පුළුල් කිරීම සඳහා 2010 දෙසැම්බර් මාසයේ ඉදිකිරීම් ආරම්භ කොට 2012 අගෝස්තු මාසයේ වැඩ අවසන් කරන ලද ගොඩනැගිල්ල වාර්තා කරන ලද දිනය දක්වාම නිශ්කාර්යව පැවතුණි.

## 4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට අයත් රියදුරෙකු අමාත්‍යාංශ සේවයේ යොදවා ඔහු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.349,440 ක් වැටුප් හා දීමනා සඳහා වැයකර තිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ කළමනාකරණ මට්ටමේ තනතුරු 10 ක්, විධායක තනතුරු 100 ක් හා විධායක නොවන තනතුරු 160 ක් පුරප්පාඩු වී පැවති අතර එය මණ්ඩලයේ මෙහෙයුම් හා පරිපාලන කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය.

## 4.8 වාහන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාවිතයේ පවතින වාහන 21 ක උපයෝජනය ඉතා අවම මට්ටමක පැවති අතර වාහන නඩත්තු කිරීමේ පිරිවැය සමඟ සැසඳීමේදී පිරිවැයට සරිලන ප්‍රතිලාභයක් අත් වී නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) කිසිදු ධාවනයක් සිදුකර නොමැති වාහන 05 ක් සඳහා වර්ෂය තුළ රු.275,926 ක නඩත්තු වියදමක් දරා තිබූ අතර එම වියදම නිෂ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය විය.

(ඇ) මණ්ඩලයට අයත් නොවන වාහන දෙකක් වෙනුවෙන් රු.173,354 ක නඩත්තු හා අලුත්වැඩියා වියදම් දරා තිබූ අතර අදාළ වාහනය විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක, පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6:5:1 ඡේදය ප්‍රකාරව සෑම රාජ්‍ය සංස්ථාවකටම හා සම්බන්ධ කෙටුම්පත්, වාර්ෂික වාර්තා හා ගිණුම් මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2013 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ 2014 නොවැම්බර් 20 දිනදීය.

### 5.2 අභ්‍යන්තර විගණනය

මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මකව තිබුණද සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන සැලසුමට අනුව විගණන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

මණ්ඩලය විසින් ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළදී භාවිතයට ගෙන තිබුණේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදන මුදලින් සියයට 87.6 ක් පමණක් වන අතර, පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් ඇස්තමේන්තු සීමාව සියයට 12 සිට සියයට 12,540 දක්වා පරාසයක ඉක්මවා යාමක් නිරීක්ෂණය විය.

### 5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව විගණන දිනය තෙක් සභාගත කර නොතිබුණි.

### 5.5 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාර්ලිමේන්තු පොදු ව්‍යාපාරකාරක සභාව විසින් ලබා දී තිබූ පහත සඳහන් නියෝග සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබුණි.

| | විෂයය | පොදු ව්‍යාපාර කාරක සභාවේ නියෝගය | ව්‍යාපාර කාරක සභාව රැස්වීමේ දිනය | වර්තමාන තත්ත්වය/නිරීක්ෂණ |
|---|---|---|---|---|
| (i) | මුදල් කළමනාකරු තනතුරේ පුරප්පාඩුව | සියළුම තනතුරු සම්බන්ධයෙන් බඳවා ගැනීමේ ක්‍රමය පිළිබඳ අධීක්ෂණය කර සියළු පුරප්පාඩු පිරවීම. | 2010 දෙසැ. 09 | මුදල් කළමනාකරු තනතුර ඇතුළුව තනතුරු 260ක පුරප්පාඩු පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | අත් සකපෝරු 68 ක් දෝෂ සහිත වූ අතර තවත් සකපෝරු 79ක ඌනතා පැවතීම | තොග ඌනතා නිරීක්ෂණය වූ අත් සකපෝරු 79 සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලෙස දන්වා ඇත. | 2012 නොවැ.16 | පරීක්ෂණ පවත්වා අවසන් කර නොමැත |
| (iii) | රු.1,412,100ක් වූ බදුල්ල නිෂ්පාදන ප්‍රදර්ශනාගාරය | අපේක්ෂිත කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගන්නා ලෙස දන්වා ඇත. | 2012 නොවැ.16 | ප්‍රදර්ශනාගාරය ඉදිකිරීම් අවසන් කර තිබුණද මෙම වාර්තාවේ දිනය තෙක් අපේක්ෂිත කාර්යයන් සඳහා භාවිතයට ගෙන නොතිබුණි. |

(ආ) ගෝනපුර ආහාර ව්‍යාපෘතිය සඳහා 2006 පෙබරවාරි 03 දින එකක් රු.98,500 බැගින් රු.295,500 ක් වැය කොට මිළදී ගන්නා ලද යන්ත්‍ර 03ක් ගබඩාවේ පැවති අතර ඒවායේ ප්‍රයෝජනවත් ජීව කාලය ඉක්ම යමින් පැවතුණි.

(ඇ) මහියංගනය මියුනුගම දිඹුල්වත්ත නමින් වූ පර්චස් 80ක ඉඩම තුළ පිහිටි වර්ග අඩි 1,400 කින් යුතු ජල විදුලිය සහිත ගොඩනැගිල්ල හා ඉඩම වසර 15කට අධික කාලයක සිට කිසිදු කාර්යයකට යොදා නොගෙන තිබුණි.

(ඈ) පන්නල යෝග්‍ය තාක්ෂණ මධ්‍යස්ථානයේ 25 දෙනෙකුට පමණ නවාතැන් ගත හැකි නේවාසිකාගාරයක් පවතින අතර 2004 වසරේ සිට එය වසා දමා තිබුණි.

(ඉ) බිම්මල් ව්‍යාපෘතියක් සඳහා රු.1,180,000 වැයකර මිළදීගෙන තිබූ බිම්මල් වියලන යන්ත්‍රයේ ඇතැම් කොටස් අස්ථානගතවී ඇති අතර එම යන්ත්‍රය නිශ්ක්‍රීයව මණ්ඩලීය පරිශ්‍රය තුළ පැවතුනි.

(ඊ) ලක්කම් අලෙවි මධ්‍යස්ථානය සඳහා රු.306,750ක වියදමක් දරා 2008 වසරේදී මිළදීගෙන තිබූ බිල්පත් මුද්‍රණ යන්ත්‍රය හා මෘදුකාංග පද්ධතිය සමාලෝචිත වර්ෂයේදී භාවිතයට ගෙන නොතිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අබලි ද්‍රව්‍ය විකිණීම

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) වාහන භාවිතය සහ ලේඛන නඩත්තුව

(ඉ) අත්තිකාරම් ලබාදීම හා පියවීම

(ඊ) ණයගැති හා ණයහිමි පාලනය

(උ) කළමනාකරණ මට්ටමේ තනතුරු පුරප්පාඩු

(ඌ) තොග පාලනය

(එ) අයවැය පාලනය

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

## 2013

## 14 (2) (C) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

**විගණන මතයට පදනම් වූ ඡේද සඳහා විසඳුම් සහ වර්තමාන තත්ත්වය**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

2.2.1 ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය පවත්වාගෙන යාම සඳහා භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන ලබාදෙනු ලැබේ.

| වර්ෂ | පුනරාවර්තන | ප්‍රාග්ධනය |
|---|---|---|
| 2010 | 221,250,000 | 60,600,000 |
| 2011 | 228,000,000 | 29,000,000 |
| 2012 | 227,360,000 | 30,200,000 |
| 2013 | 231,000,000 | 25,000,000 |
| 2014 | 251,000,000 | 35,000,000 |
| 2015 | 263,000,000 | 45,000,000 |

වැටුප්, පාරිතෝෂික, ප්‍රාග්ධන වැය පියවීම් සඳහා ඉහත ප්‍රතිපාදන ප්‍රමාණවත් වන අතර අනිකුත් වියදම් මණ්ඩලයේ ආදායමින් පියවා ගැනීමේ හැකියාව ඇත. එමෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලය පිහිටුවීමේ 1969 අංක 36 දරණ පනත අනුව අප සේවා ආයතනයක් බවද සඳහන් කරමි.

**2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

(අ) මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව ගිණුම්කරණ ඒකකය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ලෙස නිවැරදි කරන ලදී.

(ආ) මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සියළු ස්කන්ධ අයිතම ඇතුලත් කර නිවැරදි කරන ලදී.

(ඇ) තොග සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 2 ට අනුව පිරිවැය හා උපලබ්ධි යන අගයන් දෙකෙන් අඩු අගයට තොග ආගණනය කර ඇත. එමෙන්ම සෙමෙන් චලනය වන තොග සඳහා හානිකරන පරීක්ෂණයක් සිදුකර එම ප්‍රමාණයන් සඳහා වෙන් කිරීම් ජර්නල් සටහන් ඇතුලත් කරන ලදී.

| | | | |
|---|---|---|---|
| i | ලිපිද්‍රව්‍ය | - | රු.439,999.59 |
| ii | වෙනත් අමුද්‍රව්‍ය | - | රු.55,085.68 |

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව ප්‍රත්‍යාගණිත වාහන විකුණන විට එම වාහනවලට අදාල ලාභය ප්‍රත්‍යාගණන සංචිතයෙන් ඉවත් කිරීම සඳහා ජර්නල් සටහන් ඇතුලත් කරන ලදී. සේජ් (Sage) දත්ත ඇතුලත් කිරීමේ අංක 88226 හා 88227 .

(ඉ) 2010 දෙසැම්බර් 31 දින සිට ගැලපීම් කර 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අන්තර් ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට අනුව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 ට අනුව වත්කම් සම්බන්ධ සාධාරණ හානිකරණ දර්ශකයන් පවතින වත්කම් සාධාරණ අගයකට මූල්‍ය වාර්තා තුල නිරූපණය කිරීම සඳහා හානිකරණ වෙන් කිරීම් කරන ලදී. 2014 ගිණුම්වලදී ඉතිරි ගැලපීම් සිදුකරනු ලැබේ.

(ඊ) අන්තර් ජාතික මූල්‍ය වාර්තා ප්‍රමිත අනුව දේපළ පිරියත සම්බන්ධව වර්තමාන වෙළඳපල අගය පොත්වලට ගැනීම සඳහා ප්‍රත්‍යාගණනයක් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව අවශ්‍ය කටයුතු කරගෙන යාමට උපදෙස් ලබාදෙන ලදී. හානිකරණ දර්ශක ඇති වත්කම් මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීම සඳහා කමිටුවක් පත්කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හා මෙ සම්බන්ධව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණ ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව ක්ෂය ගණනය කළ යුත්තේ අදාල වත්කම භාවිතයට සූදානම්ව තබන අවස්ථාවේ බැවින් අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා ජර්නල් සටහන් ඇතුලත් කරන ලදී. සේජ් (Sage) 87949 සිට 88202 දක්වා නිවැරදි කිරීම් ඇතුලත් කර ඇත.

(ඌ) ලිබඩු හා සවිකිරීම් අයිතම යටතට , එකිනෙකට වෙනස් ක්ෂය අනුපාතයන් සහිත වත්කම් වර්ග 09 ක් එකතු කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබූ අතර එය නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන කට්ටලය සකස් කරන ලදී.

(එ) අත්තිකාරම් හා ණය හැර වෙනත් ජංගම වත්කම් වලින් රු. 17,459,532.00 ක ශේෂය නිරවුල් කරගත යුතු වුවත් එහි ඇති ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීමට ජර්නල් සටහන් ඇතුලත් කල අතර සාධාරණ අගයට නිරූපනය කිරීම සඳහා හානිකරණ වෙන් කිරීම් ඇතුලත් කරන ලදී. 2014 වසරේ ගිණුම්වලදී ඉතිරි ගැලපීම් සිදුකරනු ලැබේ.

(ඒ) වෙනත් ජංගම වත්කම් යටතේ ඇක්වෙන සේවක මණ්ඩලය වෙත ලබාදී ඇති ණය හා අත්තිකාරම් රු.40,356,404/- සාධාරණ අගයට නිරූපනය කිරීම සඳහා වෙන් කිරීම් ඇතුලත් කරන ලදී. 2014 වසරේදී ගිණුම්වලදී ඉතිරි ගැලපීම් සිදුකරනු ලැබේ.

(ඔ) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය 2012.12.31 දිනට මූල්‍ය වාර්තා අන්තර් ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට සැකසීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 පරිදි ආයෝජනය සම්බන්ධයෙන් පැහැදිලි හානිකරණ දර්ශක තිබූ ආයෝජනය රු.5,299,990/- එම දර්ශක උපයෝගි කරගෙන ගිණුම් නිවැරදි කරන ලදී. සේජ් (Sage) 88253,88254 2014

(ඕ) ලක්කම් මධ්‍යස්ථානයේ කර්මාන්තකරුවන් ගේ විකුණු භාණ්ඩ සඳහා මුදල් ගෙවනු ලබන්නේ මාසිකව වන අතර, ඒ අවස්ථාවේදී මණ්ඩලීය ආදායම වෙන්ව දැක්වේ. කෙසේ වුවත් විගණනය පෙන්වා දී ඇති

පරිදි එය ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ට පටහැනි වන බැවින්, 2015 ජනවාරි මස සිට දිනපතා මණ්ඩලයීය ආදායම ගණන් බලා මුදල් අංශයට යොමු කිරීමට උපදෙස් දෙන ලදී.

(ක) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව වෙනත් ජීව කාලයක් සහිත වත්කම් වෙන් වෙන්ව වර්ගී කරණ කළයුතුවීම අනුව (i) ,(ii) (iv) නිවැරදි කර මුල්‍ය ප්‍රකාශන කට්ටලය සකසන ලදී.

(iii) වාහනවලට සවිකරන ලද ආරක්ෂක පද්ධතින් හා අනිකුත් උපාංග එම වාහනය විකුණන්නේ නම් හෝ ප්‍රත්‍යාගණනය කරනු ලබන්නේ නම් එක් අයිතමයක් යටතට ගැණෙන නිසා එක්ව වර්ග කර ඇත.

2.2.3 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

(අ) කිසියම් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන්නේ නම් එය විනිවිධ හා සාධාරණ මුල්‍ය තත්ත්වයක් නිරූපණය කිරීමට ඉවහල් වන පරිදි සංගතව අනුගමනය කල හැකි ප්‍රතිපත්තියක් විය යුතු නිසා හානිකරණ වෙන් කිරීම් කරන ලදී. 2014 ගිණුම්වලදී ඉතිරි ගැලපීම් සිදුකරනු ලැබේ.

(ආ) වත්කම් ප්‍රාග්ධනිත කිරීම කිසිදු පදනමකින් තොරව සිදුකර තිබීම නිසා ඇතිවී ඇති අඩුපාඩු වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම, ප්‍රාග්ධනිත කිරීමේ මුල්‍ය සීමාවන් තීරණය කිරීම 1967 වැනි කාලවකවානුවල මිළදී ගත් අපහරණය කළ හැකි වත්කම් පොත්පත් ලියාහැරීම 2014 ගිණුම් වසර සඳහා සිදුකරනු ලැබේ.

2.2.4 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) අවසන් තොග ආගණනයේදී සෙමින් චලනය වන තොග, අලෙවි නොවන තොග හඳුනාගෙන අවශ්‍ය වෙන් කිරීම් ජර්නල් සටහන් ඇතුලත් කරන ලදී .

| | | | |
|---|---|---|---|
| i | පන්නල යෝ.තා.ප.හා.සං.ම. උපගබඩාව | - | රු.207,980.98 |
| ii | වාත්තු අංශය | - | රු.62,140.50 |
| iii. | පොදු සේවා මධ්‍යස්ථානය-මාතර | - | රු.65,866.12 |
| iv | ප්‍රධාන ගබඩාවේ විවිධ අමුද්‍රව්‍ය | - | රු.378,992.82 |
| v | ප්‍රධාන ගබඩාවේ අමුද්‍රව්‍ය තොග | - | රු.869,259.11 |

වෙන් කිරීම් සඳහා ජර්නල් සටහන් ඇතුලත් කරන ලදී.

(ආ) යන්ත්‍ර හා පිරියත (පරිගණක ) යටතට ඇතුලත් කර ඇති මෘදුකාංග පද්ධතිය වෙනම ගිණුම්ගත කරන ලදී.

(ඇ) උපයෝජන සේවා යටතේ ඇති රු.2,254,254/- ක වියදම ජර්නල් සටහන් යොදා නිවැරදිව ගිණුම්ගත කරන ලදී. සේජ් (Sage) 88245 සිට 88250

(ඉ) ලක්කම් අලෙවි මධ්‍යස්ථානය ආරම්භයේ සිට භාණ්ඩ විකිණීමේදී නිකුත් කරනු ලැබුවේ විකුණුම් ඉන්වොයිසිපතකි. 2015 ජනවාරි මස සිට විකුණුම් සඳහා මුදල් ලදුපතක් නිකුත් කිරීමට කටයුතු කරන ලෙසට උපදෙස් දෙන ලදී.

(ඊ) ලක්කම් අලෙවි මධ්‍යස්ථානයේ දේශනාගාරය සඳහා වැයවන විදුලි වියදමද ඇතුළත් වන බැවින්, දේශනාගාරය භාවිතා කිරීමේදී අතිරේකව වැයවන ඒකක ගණනය කිරීම සඳහා අතිරේක මීටරයක් සවි කිරීමට කටයුතු කෙරේ.

(උ) රු.135,000 ක් සඳහා වෙන්කිරීම් ජර්නල් ඇතුලත් කරන ලදී.

2.2.5 අසම්භාව්‍ය බැරකම්

රු.4,406,388.54 සඳහා ජර්නල් සටහන් ඇතුලත් කරන ලදී.

2.2.6 පැහැදිලි නොකල වෙනස්කම්

මුල්‍ය ප්‍රකාශන වල සඳහන් බැංකු ශේෂ නිවැරදිය. 2013 ගිණුම්වල වෙනස්කම් සඳහා සටහන් යොදා ඇත්තේ 2014 පෙබරවාරි මාසයේදීය. නිවැරදි බැංකු සැසඳුම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලදී.

2.2.7 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

i, iii, iv, v } ණයගැති කාල විශ්ලේෂනයට අනුව ණයගැතියන් සඳහා හානිකරණ වෙන් කිරීමක් සඳහා ජර්නල් සටහන් ඇතුලත් කර නිවැරදි කිරීම් කරන ලදී.

ii සමාලෝචිත වර්ෂය තුලදී රු.3,191,492/- ක වියදම් සහ වත්කම් මිලදී ගැනීම් වෙනුවෙන් කලින් ගෙවීම් සඳහා අවශ්‍ය නිවැරදි කිරිමේ සටහන් ඇතුලත් කරන ලදී.

vii,viii පිරිවැටුම් බදු වශයෙන් දක්වා ඇති 184768 ක බදු බර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තක්සේරු ඉදිරිපත් කර නැති අතර මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ පොත්පත් අනුව සිදුවී ඇති අතිරික්ත බදු බැරකම ගිණුම්කරණ දෝෂයක් සේ සලකා නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

එකතු කල අගය මත රඳවා ගැනීමේ බදු වශයෙන් පෙන්වා ඇති රු.367220/- බැර ශේෂය සඳහාද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් නොමැති අතර එම ප්‍රමාණයද පසුගිය වර්ෂවල සිදුවී ඇති ගිණුම්කරණ දෝෂයක් සේ සලකා එය නිවැරදි කිරීමට පහත සඳහන් ජර්නල් සටහන් ඇතුලත් කරන ලදී.

ජාතික ආරක්ෂක බදු වශයෙන් දක්වා ඇති රු.652,228 (හර) ශේෂය සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ගෙවිය යුතු ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර නැත. එසේම මණ්ඩලයද මෙම බදු වර්ගය සඳහා ගෙවීම් ක්‍රමානුකූලව සිදුකර ඇත. එබැවින් තවදුරටත් ගෙවිය යුතු හෝ අයවිය යුතු ශේෂයන් නිරීක්ෂණය නොවේ. එබැවින් මෙයද ගිණුම්කරණ දෝෂයක් සේ සලකා පහත ජර්නල් සටහන් ඇතුලත් කරන ලදී.

3. මුල්‍ය සමාලෝචනය

3.1 මුල්‍ය ප්‍රතිඵල හා මුල්‍ය තත්ත්වය

(අ) මුල්‍ය ප්‍රතිඵල

මුල්‍ය තත්ත්වයේ ඉදිරි වර්ධනය සඳහා කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

(ආ) කාරක ප්‍රාග්ධන තත්ත්වයද වැඩිදියුණු කරගැනිමට අවශ්‍ය උපදෙස් දෙන ලදී.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරි කටයුතු සඳහා සටහන් කර ගතිමි.

3.3 ආයතනයට එරෙහිව හා ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

2013.12.31 දිනට ආයතනය විසින් පවරා විසඳී නොමැති නඩු 09 ක්දආයතනයට විරුද්ධව පවරා විසඳී නොමැති නඩු 11 ක් සම්බන්ධයෙන් වෙන් කිරීම් කළ හැකි අවස්ථා සඳහා සේජ් (Sage) 88251 හා 88252 මගින් වෙන් කිරීමක් කරන ලදී.

3.4 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම

සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් , ජීවන වියදම් දීමනාව සඳහා 2006 වර්ෂයේ සිට 2012 ජූලි මාසය දක්වා අදාල කරගෙන නොමැත. මේ සඳහා සී වාර්තාවන් සකසා කම්කරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර වාරික වශයෙන් ගෙවීම් කිරීමට අනුමැතිය ඉල්ලා ඇති අතර ගෙවීම් කිරීම සඳහා අතිරේක ප්‍රතිපාදනද භාණ්ඩාගාරයෙන් ඉල්ලා ඇත.

බොල් ණය වෙනුවට හානිකරණ වෙන් කිරීමක් ගිණුම්වල ඇතිකර ඇත. 2014 ගිණුම් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අවශ්‍ය ගැලපීම් කරනු ලැබේ.

ප්‍රදර්ශන රාජකාරි හා පුහුණු කිරීම් මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් වන අතර මෙම කාර්යයන් ඉටුකිරීම සඳහා අය කිරීම් සහ අමාත්‍යාංශ ප්‍රතිපාදන ලබාදෙනු ලැබේ.

4.1 එක් එක් අංශවල ප්‍රගතිය පරික්ෂා කිරීමෙන් මතු කළ කරුණු සඳහා පහත තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ. කාර්ය සාධනය යටතේ (අ) සිට (ඌ) දක්වා වූ අංශ මගින් ඉටුකරන ලද අදාල කාර්යයන්හි සඳහන් කර ඇති දුර්වලතා එක් එක් ආංශික ක්‍රියාකාරි සැලසුම් සකස් කිරීමේදී සහ ඒවා නිසියාකාරව ඇගයීමට ක්‍රමවේදයක් නොමැති වීම නිසා පැන නැගී ඇති බව අවධාරණය වේ. තවද 2012 වසරේදී ආරම්භ කරනු ලැබූ ආයතනය ප්‍රතිව්‍යුහගත කරන ක්‍රියාවලිය සහ එතෙක් පැවති සැලසුම් හා පරිපාලනමය තත්ත්වය අතර වූ පරතරය ද එයට හේතු වී ඇත. එම නිසා නිසි මානව සම්පත් කළමනාකරණයත්, මානව සම්පත් සංවර්ධනයත් නොමැති වීමත්, උචිත මානව සම්පත්හි ඌනතාවයත් අදාල සංවර්ධන ක්‍රියාකාරි සැලසුම් සෑදීමේදී එම සාධක නිසියාකාරව යෝග්‍ය කර ගැනීමට නොහැකි වී ඇත. එම නිසා 2015 වසරේ සිට ප්‍රතිව්‍යුහගතකරණයෙන් ඉදිරිපත් වූ නිර්නායක මත පදනම්ව අදාල අංශයන්ද එමගින් ප්‍රතිඵල පාදක කරගත් කාර්ය සාධනයන්ටද අනුකූලව සැලසුම් සකස් කිරීමටත් කටයුතු යොදා ඇත. තවද මානව සම්පත් කළමනාකරණයටත් මානව සම්පත් සංවර්ධනයටත් හැකි වන පරිදි ප්‍රතිඵල පාදක කරගත් ඇගයීමක් මගින් ඔවුන්ව අභිප්‍රේරණය කර කාර්ය සාධනය ඉහල නැංවීමටත් ඊට උචිත ඌනව පවතින මානව සම්පත් බඳවා ගැනීමටත් කටයුතු කෙරෙමින් පවතී. තවද පරිගණක ආශ්‍රිත තොරතුරු හා කළමනාකරණ පද්ධතියක් මගින් සියළුම සංවර්ධන තොරතුරු ගොනු කර ඇගයීමටත් කටයුතු කෙරේ.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) අබලි අංශය

i අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියේ අරමුදල් මෙම වියදම් සඳහා යොදා ගැනීමට සිදුවූයේ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා ප්‍රතිපාදන අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කළද ප්‍රමාණවත් මුදල් නොලැබීම නිසාය. එම අරමුදලේ ලාභය දිරිදීමනා හා සුභසාධක සංගමය සභාපතිතුමාගේ විධිමත් අනුමැතිය යටතේ ලබාදී ඇත.

ii අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියේ අරමුණ අනුව 2013 වසරේ ලියාපදිංචි කර්මාන්තකරුවන් 558 ක් අතරේ භාණ්ඩ අලෙවි කර ඇති අතර, යකඩ මිලදී ගැනීමට ලියාපදිංචිව සිටි කර්මාන්තකරුවන්49 දෙනෙකුට යකඩ ටොන් 392 ක් අලෙවි කර ඇත.

(ආ) කිතුල් ව්‍යාපෘතිය

i මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ට මේවනවිට මෙම උදුන් බෙදා දී අවසන් කර ඇත.

ii මෙම ව්‍යාපෘතියේ ඉතිරිව තිබූ හෙල්මට් , වැහි කබා හා ආරක්ෂක පටි කිතුල් කාර්මිකයන් අතරේ මේ වනවිට බෙදා අවසන් කර ඇත.

iii කිතුල් ව්‍යාපෘතිය සඳහා මිළදී ගෙන විනාශ වී තිබූ වැහිකබා සහ හෙල්මට් සඳහා හානිකරණ වෙන් කිරීමක් කරන ලදී.

(ඇ) වෙනත් ජංගම වත්කම්වල දක්නට ලැබෙන අගයෙන් රු.15,041,721/- සඳහා හානිකරණ වෙන් කිරීමක් කරන ලදී.

(ඈ) කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය ලබාගැනීමට පහසුකම් වශයෙන් අවශ්‍ය අරමුදල් සම්පාදනය සඳහා චක්‍රිය අරමුදලක් පිහිටුවීමේ අරමුණින් 2009 වසරේ සිට ලබාදී තිබූ සෙස් අරමුදල 2014 වර්ෂයේදී අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියේ අමුද්‍රව්‍ය මිළදි ගැනීම සඳහා යොදා ගන්නා ලදී.

(ඉ) ඉතිරි කිරීමේ ගිණුම්වල තැන්පත් කර ඇති කාර්මික ජනපදවල කර්මාන්තකරුවන් ගේ තැන්පතු රු.මිලියන 10 ක් 2014 වසරේදී ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කරන ලදී. අනිකුත් ඉතිරි කිරීමේ ගිණුම්වල පවතින මුදල් නිතර පරිහරණය සඳහා අවශ්‍ය බැවින්, රඳවා ගැනීමට සිදුවී ඇත.

(ඊ) මේ සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2013.11.28 සහ 2014.03.06 දිනයන්හි අදාල භාණ්ඩ හා සේවා බදු ශේෂය සම්බන්ධතොරතුරු විමසන ලද අතර, මණ්ඩලය පසුගිය වර්ෂයන්හි ගැණුම් සහ විකුණුම්වලට අදාල අයකරන ලද සහ ගෙවන ලද බදු ඇතුලත් පූර්ණ වාර්තාවක් කාර්තුමය වශයෙන් ලබාදෙන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව දැනට මාස 03 ක වාර්තාවක් සකස් කර ඇති අතර එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණය සඳහා ඉදිරිපත් කර එය නිවැරදි නම් අනෙක් මාසවල තොරතුරුද සකස් කිරීමට කටයුතු කර ඉදිරිපත් කිරීම සිදුකරනු ඇත.

(උ) මණ්ඩලය විසින් අය කරගනු ලබන ජාතිය ගොඩනැගීමේ බදු ප්‍රමාණයෙන් මණ්ඩලය විසින් මිලදී ගනු ලබන භාණ්ඩ හා සේවා වෙනුවෙන් ප්‍රභවයේදී ගෙවා තිබූ ජාතිය ගොඩනැගීමේ බදු මුදල අඩුකර ඉතිරි මුදල පමණක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීමට කටයුතු කර ඇත. ඒ අනුව 2013.12.31 දිනට ගිණුම් වාර්තා අනුව පෙන්වා ඇති රු.1726967 ක බදු බර නිවැරදිතාවය පරික්ෂා කර ගෙවීම් කිරීමට කටයුතු කර ඇත.

(ඌ) තනතුරුවලඅදාල බඳවා ගැනීමේ පරිපාටිය අනුව සපුරා තිබිය යුතු සුදුසුකම් සම්බන්ධව ලබාදෙන සහතිකවලට අදාල ඡායා පිටපත් විධිමත් ලෙස සහතික කර ගැනීම ආරම්භ කර ඇති අතර, පරිවාස කාලය අවසන් කරන නිලධාරීන් ස්ථිර කිරීමේදී අදාල සුදුසුකම් ලබාගත් ආයතනයෙන් තහවුරු කිරීම් ලබාගැනීමට කටයුතු ආරම්භ කර ඇත.

(එ) තොග සත්‍යාපනය

i,ii අබලි තොග පවත්වාගෙන යන ගබඩාවේ ඉඩකඩ සීමිත බැවින් එලිමහනේද සමහර තොග පවත්වා ගැණුනි. මෙහිදී ඩෙංගු මදුරු උවදුර මත උසාවිය මඟින් නඩු පැවරූ බැවින් සියළු අනාරක්ෂිත අබලිද්‍රව්‍ය තොග ඉවත් කර විකිණීමට කටයුතු කර ඇත. මෙම කටයුතු සිදුවූයේ 2013.09.26 දිනදී කරන ලද අබලි

ද්‍රව්‍ය සමීක්ෂණයට පෙරදීය. පැවති ප්‍රායෝගික තත්ත්වයන් යටතේ සියළුම තොග සත්‍යාපනය කිරීමටද නොහැකි විය. තවද අබලි ද්‍රව්‍ය තොග සත්‍යාපනයට පහත සඳහන් ප්‍රායෝගික ගැටළුද බලපාන ලදී.

අ අබලි තොග කිරා මැනීම සඳහා අවශ්‍ය පාලම් තරාදි නොමැතිවීම
ආ පිහිටා ඇති ගබඩා පරිශ්‍රයේ ප්‍රමාණවත් ඉඩකඩ නොමැතිවීම
ඇ එම කාර්යයේ නිරත කරවීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය නොමැතිවීම.
කෙසේ වෙතත් 2014 වර්ෂයට සම්පූර්ණ තොග සත්‍යාපනය කිරීමට කටයුතු යොදා ඇත.

4.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) 2015 වසරේ සිට පිරිවැය ගැලපීම් නිසි පරිදි ඇතුලත් කිරීමට කළමනාකාරිත්වයේ අවධානය යොමු වී ඇත.

(ආ) තල ඇට අඹරන යන්ත්‍රය සඳහා ආපසු ගෙවීමට සිදු වී ඇත්තේ මෙම යන්ත්‍රය සෑදීමට වැඩි කාලයක් ගතවන බැවින් හා එම යන්ත්‍රය අනවශ්‍ය බව ලිඛිතව දන්වන ලද බැවිණි.

4.4 **අරමුදල් ඌන උපයෝජනය**

(අ) බැංකු ගිණුම්වල 2013.12.31 දිනට පැවති ශේෂ අයිරාවන් ලෙස පැවතීමට හඳුනා නොගත් තැන්පතු හා තැන්පත් කරන ලද චෙක්පත් උපලබ්ධි වීමට ගතවන කාලය බලපා ඇත. නමුත් බැංකු ප්‍රකාශනය අනුව අයිරා ශේෂ පෙන්නුම් නොකෙරේ. එමෙන්ම එක් එක් කාර්යයන් සඳහා විවෘත කරන ලද බැංකු ගිණුම් තව කාර්යයකට යොදා ගැනීමට නොහැකි තත්ත්වයන් යටතේ මෙවැනි අවස්ථාවන්ට මුහුණපෑමට සිදුවේ. කෙසේ වෙතත් ඉදිරියේදී බැංකු අයිරා ශේෂ ඇති නොවන පරිදි කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී.

(ආ) අග්‍රිම ගිණුම, විශේෂ අග්‍රිමය, මාර්ගස්ථ මුදල් එකතුව වන රු.138,810.74 න් 2014 වර්ෂයේ පියවීම් ලද ප්‍රමාණය රු. 10,385.10 වන අතර අනික් ප්‍රමාණයන් පොත්පත් පරීක්ෂා කිරීමේදී ගිණුම්කරණ දෝෂ බව හඳුනා ගන්නා ලදී. මේ සඳහා අවශ්‍ය නිවැරදි කිරීම් කර මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු කරන ලදී.

(ඇ) ඉතිරි කිරීමේ ගිණුම්වල ශේෂ ඵලදායි ලෙස ආයෝජනය කිරීමේදී පහත ක්‍රියාමාර්ග ගන්නා ලදී. ප්‍රාග්ධන ගිණුමේ ශේෂය 2014 වර්ෂයේදී මිලදී ගැනීම් සඳහා භාවිතා කරන ලදී. සෙස් අරමුදල අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතියේ අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා භාවිතා කරන ලද අතර කර්මාන්තකරුවන් ගේ තැන්පත් මුදලින් රු.10,000,000/- ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කර ඇත.

(ඇ) නිසි ප්‍රතිලාභයක් නොලබා පවතින බැංකු ගිණුම් විවිධ කාර්යයන් සඳහා විවෘත කරන ලද බැංකු ගිණුම් වන අතර එම කාර්යම සඳහා යොදා ගැනීමට සිදුවීමෙන් මෙම තත්ත්වය ඇතිවී ඇත. මෙය ඵලදායි වන ලෙස ආයෝජනය කිරීමට කළමනාකාරිත්වයේ අවධානය යොමු වී ඇත.

4.5 **නිශ්ක්‍රිය හා ඌන උපයෝජන වත්කම්**

(අ) **මුද්‍රණ යන්ත්‍ර**

i මුද්‍රණ අංශයේ දක්නට ලැබෙන ඉන්දියාවේ නිෂ්පාදිත (විජිතා) යන්ත්‍රය රු.1,806,178 ක් ලෙස පොත්පත්වල සඳහන්ව තිබේ.

ii ප්‍රත්‍යාගණනය කර මෙම යන්ත්‍ර විධිමත් පරිදි අපහරණය කර නව යන්ත්‍ර මිලදී ගැනීමට කළමනාකාරිත්වයේ අවධානය යොමු වී ඇත.

(ආ) 2009 වයශර්දී රු.7,950,000 කට මිලදී ගන්නා ලද NA – 7086 ජංගම තාක්ෂණ බස් රථය අඩු උපයෝජන මට්ටමක පැවතුනේ වියදම් අධික බැවිනි. එම නිසා මෙ සම්බන්ධව තීරණ ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කළමනාකාරිත්වයේ අවධානය යොමු කර ඇත.

(ඇ) තාක්ෂණික සේවා අංශයේ ආහාර ක්ෂේත්‍රයේ පරික්ෂණ සඳහා රසායනාගාර පහසුකම් පුළුල් කිරීමේ අරමුණින් තනන ලද ගොඩනැගිල්ල 2015 වසරේ සිට ප්‍රයෝජනයට ගනු ලැබේ.

**4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයීය සම්පත්**

මණ්ඩලීය කාර්ය මණ්ඩලයට අයත් රියැදුරු මහතාට අදාල රු.349,440/- ක මුදල රේඛීය අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

2013.12.31 දිනට මුලු සේවක පුරප්පාඩු සංඛ්‍යාව 262 ක් වු අතර, 2014 වර්ෂය තුල පුරප්පාඩු පිරවීම සඳහා අභ්‍යන්තරව හා බාහිරව අයදුම්පත් කැඳවා අදාල තනතුරුවලට සුදුසුකම් ඇති අයදුම්කරුවන් බඳවා ගැනීමට කටයුතු කරනලදී. 2006 කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 අනුව නව බඳවා ගැනීම් සහ උසසස්වීම් පරිපාටිය අනුමතවීම 2013 වර්ෂයේ පෙබරවාරි මස සිදුවීමහේතුවෙන් සහ අනුමත බඳවා ගැනීම් හා උසස්වීම් පරිපාටියේ දෝෂ පසුව හඳුනාගැනීම නිසා එම දෝෂ නිවැරදි කර ගැනීමට අවශ්‍ය බැවින් ඇතැම් තනතුරුවල පුරප්පාඩු පිරවීමද ප්‍රමාද වී ඇත.
තවද මේවනවිට පුවත්පත් මගින් අයදුම්පත් කැඳවා ඇති ඉහළ කළමනාකාර, මධ්‍යම කළමනාකාර සහ කළමනාකරණ සහකාර තනතුරු සඳහා සම්මුඛ පරික්ෂණ සුදානම් කර ඇති අතර දැනට පවතින මැතිවිරණ කාලසීමාව හේතුවෙන් තාවකාලිකව අත්හිටුවා ඇත.

**4.8 වාහන උපයෝජනය**

(අ) භාවිතයේ පවතින වාහන ඌන උපයෝජන ලෙස හඳුන්වා ඇති වාහන 21 කි. ඉන්

| | | |
|---|---|---|
| 14 | - | ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත කර ඇත. |
| 05 | - | ප්‍රධාන කාර්යාලයේ වන පෙට්‍රල් මාදිලියේ වාහන වේ. |
| 02 | - | ලොරි රථ වේ. |

ප්‍රාදේශීය කාර්යාල සඳහා වෙන් කෙරෙන රු.5000/- ඉන්ධන සීමාව තුළ ධාවනය කර ඇත. පෙට්‍රල් මාදිලියේ වාහන 05 ඉන්ධන පිරිවැය සලකා දෛනික කෙටි ධාවනයන් සඳහා යොදා ගෙන ඇත. ලොරි රථ අවශ්‍යතාවලදී ධාවනය කර ඇති අතර මේ හේතුවෙන් ඌන උපයෝජනයක් මෙන් පෙනී යයි.

(ආ) වාහනවලට දරා ඇති වියදම සටහන් කිරීමේදී වාහන ලොග සටහන් පොත්වල වාහන නඩත්තු, සේවා හා අමතර උපාංග ආදි විස්තර ඇතුළත් කරනවා හැරෙන්නට සියලු වියදම් සටහන් ඉඩ ප්‍රස්තා සලසා නැත. මේ හේතුවෙන් මණ්ඩලීය ලෙජර් ගිණුම් සමඟ සැසඳීමේදී වෙනසක් ඇතිවී ඇත. ඉදිරියේදී මෙම අඩුපාඩුව අවම කර ගැනීමට උපදෙස් දෙන ලදී.

(ඇ) කිසිදු ධාවනයක් සිදුකර නොමැති වාහන 5 අතර නිශ්කාර්යය වියදම් ලෙස දක්වා ඇති 64 – 3941 සඳහා වන වියදම නිවැරදි ලෙස ගිණුම්ගත වු වියදමක් නොවේ. එය නිවැරදි කරන ලදී. ඉතිරි වාහන 04, 2013 වසරේ මුල් භාගයේ අලුත් වැඩියා සඳහා යොමු කර තිබූ අතර දැනට අලුත් වැඩියා කර ධාවනයට එක්කර ඇත.

(ඈ) අවශ්‍ය තරම් වාහන නොමැති බැවින් ප්‍රාදේශීය කාර්යාලවල ධාවන අවශ්‍යතා සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සංචිතවල ඇති ධාවනය නොකරන වාහන ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව ලැබුණු වාහන වේ. දැනට ධාවන රාජකාරි සඳහා යොදා ගන්නා බැවින් ඉහත වියදම් නඩත්තු ලෙස දරා ඇත. ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.

5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

i ගිණුම් වාර්තා විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාදවීමට විවිධ හේතු බලපාන ලදී. පැරණි ගිණුම්වල තිබූ දෝෂ නිරාකරණය කිරීම සඳහා විධිමත් අනුමැතින් ලබාගැනීම සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුව ගිණුම් ඉදිරිපත් කිරීම නිසා මෙම ප්‍රමාදයන් ඇති විය. 2014 වසරේ මූල්‍ය ප්‍රකාශනය නියමිත දිනට ඉදිරිපත් කිරීමට උපදෙස් ලබාදෙන ලදී.

ii අභ්‍යන්තර විගණනය

මණ්ඩලය තුල ක්‍රියාත්මක වන අභ්‍යන්තර විගණන අංශය විගණන සැලසුමට අනුව විගණන වාර්තා ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන ලදී.

5.3 අයවැය ලේඛනමය පාලනය

(අ) ප්‍රාග්ධන වියදම්

i, ii, iii අත්‍යාවශ්‍යතාවය මත මිලදී ගැනීම් සහ සේවා සැපයීම නිසා මෙම තත්ත්වය ඇති වී ඇත. ඉදිරි වර්ෂවලදී මෙවැනි දුර්වලතා ඇති නොවීමට උපදෙස් ලබාදෙන ලදී.

iv ටෙන්ඩර් කැඳවා මිලදී ගැනීමේදී මාස 02 කට වැඩි කාලයක් ගතවන බැවින් හා අමතර මුදල් වැය කිරීමක් සිදුවන නිසාත් පැරණි මිලටම අළුත් වර්ගයක්, පිරිවිතරයන් නොවෙනස් වන ආකාරයට මිලදී ගැනීම සිදුකර ඇත. මෙය මණ්ඩලයට වාසිදායක වන බව විගණනයට පැහැදිලි කරමි. තවද නැවත ඇණවුම් කිරීම සිදු කරන්නේ එකවර භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ අයදුම්පත්‍ර නිසි වේලාවට නොලැබීම නිසා බැවින් මෙම වර්ෂයේදී මෙම දෝෂ මගහරවා ගැනීමට කටයුතු කරන ලෙසට උපදෙස් දෙන ලදී.

v. ප්‍රාග්ධන භාණ්ඩ සපයන ආයතන සමහරක් කුඩා තොග තබාගෙන හා ඇණවුම ලැබූ පසු විදේශ රටවලින් ආනයනය සිදුකර භාණ්ඩ සැපයීම් සිදුකරයි. එම අවස්ථාවල භාණ්ඩවල පිරිවිතරයන් හා මිල නොවෙනස්වන ආකාරයට හා තා.ඇ.කමිටු තීරණයට යටත්ව විගණන විමසුම සිදුකර ඇති Hp Pro Book 450 Note Book Laptop පරිගණක ටෙන්ඩර් මණ්ඩ තීරණවලට අනුව මිලදී ගැනීම් සිදුකර ඇත.

(ආ) පුනරාවර්ථන වියදම්

i, ii, iii ඇති වී ඇති ගිණුම්කරණ දෝෂ නිවැරදි කල අතර වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේදී වැඩි අවධානයක් යොමු කරන ලෙසට උපදෙස් දෙන ලදී.

**5.4** වාර්ෂික වාර්තා සභාගත කිරීම

2012 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ පිටපත් කැබිනට් අනුමැතිය සඳහා යොමු කිරීමට රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

5.5 නොවිසඳී ඇති විගණන ඡේද

i මුදල් කළමනාකාර තනතුර ඇතුළු ප්‍රධාන තනතුරුවල බඳවා ගැනීම් කිරීමට අවශ්‍ය මූලික කටයුතු අවසන් කර ඇත.

ii රු.මිලියන 7.7 කට මිලදී ගෙන තිබූ ජෙනරේටරය මිලට ගැනීම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් මූලික විමර්ශනයක් පවත්වා ඇති අතර එහි නිර්දේශයන් අනුව ප්‍රධාන ඉංජිනේරු බී.එස්.එන්.ප්‍රනාන්දු , විදුලි ඉංජිනේරු ඩී.එන්.පද්මතිලක හා ගණකාධිකාරී (ඒවනවිට වැ.බ. සැපයුම් කළමනාකාර) එස්.ජී.විජේරත්න යන අයට විරුද්ධව විනය පරීක්ෂණයක් පවත්වන ලදී. අදාලෙ විනය පරීක්ෂණ නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අධ්‍යයනය කර එමනිලධාරීන් සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිදහස් කිරීමට තීරණය කර ඇත.

මණ්ඩයේ අවශ්‍යතාවයන්ට නොගැලපෙන කහා යථා තත්ත්වයෙන් ක්‍රියාත්මක නොවන මෙම ජෙනරේටරය ටෙන්ඩර් කැඳවා විකිණීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. ඒ අනුව නියමිත කාර්ය පරිපාටිය අනුගමනය කර ටෙන්ඩර් කැඳවා ඇති අතර එහිදී ලැබී තිබූ උපරිම මිළ වන්නේ රු.3,627,,560/- කි. නමුත් එය ජෙනරේටරයේ වටිනාකමට වඩා 50% කට අඩු බැවින් , නැවත එම ජෙනරේටරය මිලට ගත් හේලීස් ඉන්ඩස්ට්‍රියල් සොලුයුෂන්ස් ආයතනය වෙතටම විකිණීමට සොයා බැලීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

ඊට එම ආයතනයෙන් ලැබුණු ප්‍රතිචාරය සාර්ථක නොවූ බැවින් විකිණීමට අදාල සුදුසු කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එවකට සිටි සභාපතිතුමා ට බලය පවරා ඇත. ඒ අනුව සභාපතිතුමා විසින් ඩෙන්ටී සමාගම විසින් ඉදිරිපත් කරන ලද රු.4,350,000/- (ජෙනරේටරය සඳහා රු.4,000,000/- සහ කේබල් සඳහා රු.350,000/- ) මිලට ටෙන්ඩර් මණ්ඩල ආවරණ අනුමැතිය සහිතව විකිණීමට කටයුතු කර ඇති අතර , එය ටෙන්ඩර් කැඳවීමේදී ලැබුණු උපරිම මිලට වඩා වැඩි මුදලක් බැවින් එහිදී හිටපු සභාපතිතුමා විසි න් එමගින් මණ්ඩලයට සිදුවිය යුතුව තිබූ පාඩුව අවම කර ගැනීමට කටයුතු කර ඇත.

iii දෝෂ සහිත අත් සකපොරු 68 හා අත්සකපෝරු 79 ක ඌනතාවය පරීක්ෂණය සඳහා කටයුතු කිරීමට මූලික පියවර ගෙන ඇත.

iv රු.1,412,100/- ක්වූ බදුල්ල නිෂ්පාදන ප්‍රදර්ශනාගාර ගොඩනැගිල්ල ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් පරීක්ෂා කර ඉංග්‍රීසි බසින් එවා ඇති වාර්තාව මගින් එහි ව්‍යුහය ශක්තිමත් බවින් තොර මිනිස් වාසයට නුසුදුසු බව නිර්දේශ කර ඇත. තවද මෙය අලුත් අමුද්‍රව්‍ය යොදා හෝ වෙන කිසියම් ආකාරයකට අලුත් වැඩියා නොකළ යුතු බවට උපදෙස් ලබාදී ඇත. එම නිසා 2015 ජනවාරි මස පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට මෙම වාර්තාව ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ.

v සී/ස කර්මාන්ත සේවා සමාගමේ රු.මිලියන 5.3 ක ආයෝජනයෙන් වූ අලාභය හානිකරණය කර මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කරන ලදී.

පසුගිය විගණන වාර්තා වලින් පෙන්වා දී ඇති නමුදු ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොමැති කරුණු

i ගෝනපුර ආහාර ව්‍යාපෘතිය සඳහා 2006 පෙබරවාරි 03 මිලදී ගත් මෙම යන්ත්‍ර 3 විවෘත වෙළඳපලේ විකිණීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. එම කටයුතු 2015 පෙබරවාරි මස අවසන් වීමට ප්‍රථම අවසන් කරනු ලැබේ.

ii මහියංගණ මියුගුණගම , දිඹුල් වත්ත ඉඩම නිවාඩු නිකේතනයක් හෝ සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත හිමියන්ගේ සංගමයේ ප්‍රදර්ශනාගාරයක් ලෙස පවත්වාගෙන යාමට අවධානය යොමු වී ඇත.

iii පන්නල යෝග්‍ය තාක්ෂණික මධ්‍යස්ථානයේ නේවාසිකාගාරය පිහිටි ඉඩම ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ ඉල්ලීම පරිදි පන්නල, මාකඳුර, කුලියාපිටිය ජල සම්පාදන ව්‍යාපෘතින්ගේ ජල

පවිත්‍රාගාරය ඉදි කිරීම සඳහා මෙම ඉඩම් කොටස පවරාදීමට අදාලව කැබිනට් අනුමැතිය ලැබී ඇති බව රේඛීය අමාත්‍යාංශය විසින් දන්වා ඇත.

iv බිම්මල් ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් මෙම යන්ත්‍රය තාක්ෂණික සේවා අංශයට ලබාදී ඇත. මෙම යන්ත්‍රය සම්බන්ධ තීරණ ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් 2015 ජනවාරි මස පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ.

v රු.306,750/- ක වියදමක් දරා ලක්කම් අලෙවි මධ්‍යස්ථානය සඳහා 2008 මිලදී ගන්නා ලද බිල්පත් මුද්‍රණ යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා එය මිලදී ගන්නා ලද Auro Solution (Pvt) ආයතනය සමඟ 2013 වර්ෂයේ සාකච්ඡා කළ අතර වසර ගණනක් ගතව කල්පසුවී ඇති බැවින් ක්‍රියාත්මක කළ නොහැකි බැව් දැන්වීය. මේ සඳහාද තීරණ ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් 2015 ජනවාරි මස පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ.

## 6 පද්ධති හා පාලනය

දැනට සැලසුම් කර ඇති ගිණුම්කරණ පද්ධතිය තුල මෙම කටයුතු අඩුපාඩු රහිතව ක්‍රියාත්මක කිරීමට කළමනාකාරිත්වයේ අවධානය යොමු වී ඇති අතර 2015 වසරේදි මෙම කටයුතු අවසන් කෙරේ.